කාන්තා, ළමා කටයුතු හා
සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය

# කාන්තාව, සාමය හා ආරක්ෂාව

කාන්තාව, සාමය හා ආරක්ෂාව පිළිබඳ එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ
යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රියාකාරී සැලැස්ම 2023 -2027

Supported by

From
the People of Japan

UN WOMEN

© 2022. කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය. සියලුම හිමිකම් ඇවිරිණි.

ජපාන රජය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාව සහ කාන්තාවන් සවිබලගැන්වීම සඳහා වූ එක්සත් ජාතීන්ගේ ඒකකය (UN Women) විසින් සහාය දක්වන ලදී.

කාන්තා, ළමා කටයුතු හා
සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය

# කාන්තාව, සාමය හා ආරක්ෂාව

## කාන්තාව, සාමය හා ආරක්ෂාව පිළිබඳ එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රියාකාරී සැලැස්ම 2023-2027

Supported by

From
the People of Japan

UN WOMEN

# හැඳින්වීම

කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය කාන්තාව, සාමය සහ ආරක්ෂාව පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්මක් ගොඩනැංවීමේ කටයුත්ත 2019 වසරේ දී දියත් කරන ලදී. මෙය ආරම්භ කරන ලද්දේ ජපන් රජයේ සහ ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන්ගේ කාන්තා ඒකකයේ තාක්ෂණික සහාය සමඟිනි. කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීමේ සම්මුතියට අත්සන් තබා ඇති රටක් වශයෙන් ශ්‍රී ලංකා රජය, පෞද්ගලික සහ පොදුජන ජීවිතයේ සෑම අංශයකම සෑම තරාතිරමකටම අයත් කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා කැපවී සිටී. මෙම බැඳීම ඔස්සේ ශ්‍රී ලංකා රජය දශක තුනකට ආසන්න කාලයක් තිස්සේ පැවති සන්නද්ධ ගැටුමෙන් හානියට පත් වූ දිවයිනෙහි සමාජ, දේශපාලනික ඉතිහාසය පිළිබඳව ද සැලකිල්ල යොමු කරනු ලබයි. කාන්තාව, සාමය සහ ආරක්ෂාව පිළිබඳ මෙම ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාවේ යෙදවීමට ශ්‍රී ලංකා රජය එ මඟින් පියවර ගන්නේ මෙවැනි පසුබිමක ය.

විශේෂයෙන්ම, මෙම ජාතික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේ ක්‍රියාවලියේ දී දැක් වූ සහයෝගය හා දායකත්වය වෙනුවෙන් බුද්ධ ශාසන සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය, ආරක්ෂක අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය, මුදල් අමාත්‍යාංශය, ධීවර අමාත්‍යාංශය, විදේශ කටයුතු අමාත්‍යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය, අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය, ජනමාධ්‍ය අමාත්‍යාංශය, මහජන ආරක්ෂාව පිළිබඳ අමාත්‍යාංශය, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යංශය සහ තාක්ෂණ අමාත්‍යාංශය යන ජ්‍යේෂ්ඨ අමාත්‍යාංශයන් හී අමාත්‍යාංශ ලේකම්වරුන්ට අපගේ හදපිරි ප්‍රණාමය පුද කරන්නෙමු.

එමෙන්ම, මෙම කර්තව්‍ය සාර්ථක කරගැනීම උදෙසා බෙහෙවින් උපකාර කළ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ විවෘත විශ්ව විද්‍යාලය සහ දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධනය පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශය, වතු නිවාස සහ යටිතල පහසුකම් පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශය, ස්වදේශ කටයුතු පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශය, දේශීය වෛද්‍ය ප්‍රවර්ධන ප්‍රාදේශීය සහ ආයුර්වේද රෝහල් පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශය, ප්‍රාථමික සෞඛ්‍ය, ආරක්ෂණ වසංගත සහ කෝවිඩ් රෝග පාලන රාජ්‍ය අමාත්‍යාංශය, පළාත් සභා සහ පළාත් පාලන රාජ්‍ය අමාත්‍යාංශය, සමෘද්ධි ගෘහස්ථ ආර්ථික ක්ෂුද්‍ර මූල්‍ය ස්වයං රැකියා සහ ව්‍යාපාර සංවර්ධනය පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශය, කුසලතා සංවර්ධන වෘත්තීය අධ්‍යාපන පර්යේෂණ සහ නවෝත්පාදන පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශය යන රාජ්‍ය අමාත්‍යාංශයන් හී ලේකම්වරුන්ට ද අපගේ ස්තුතිය හිමිවේ.

මෙම ජාතික ක්‍රියාකාරී සැලැස්ම සඳහා ක්‍රියාකාරකම් සහ නිර්ණායක ගොඩනැගීම වෙනුවෙන් අවශ්‍ය ප්‍රාථමික දත්ත එකතු කර ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ පළාත් නවයම ආවරණය කරමින් පැවැති මහජන උපදේශකත්ව සාකච්ඡා සැසිවලට සහභාගි වූ සියලු පුද්ගලයන්ට අපගේ හදපිරි ප්‍රණාමය පුද කරන්නෙමු. ඔවුන් නොවන්නට මෙම ජාතික ක්‍රියාකාරී සැලැස්ම යථාර්තයක් නොවනු ඇත.

එමෙන්ම සිවිල් සමාජ සංවිධාන, ප්‍රජා මූලික සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන, එක්සත් ජාතීන්ගේ ආයතන, අන්තර් ජාතික රාජ්‍ය නොවන සංවිධාන, පෞද්ගලික සංවිධාන නියෝජනය කරමින් පැමිණි සියලු නියෝජිතයන්ට සහ ප්‍රාදේශීය උපදේශකත්ව සාකච්ඡා සැසි සහ ඇගයුම් සැසිවලට සහභාගි වූ සියලු ආයතනවල නියෝජිතයන්ට අපගේ ස්තූතිය පුද කරන්නෙමු. ජාතික ක්‍රියාකාරී සැලැස්ම පෝෂණය කිරීමට දායක වූ අප ලද සියලු යෝජනා සහ ප්‍රතිපෝෂණ අපි අගය කරන්නෙමු. එමෙන් ම මෙම ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාවේ යෙදවීම සඳහා පහසුකම් සැපයීමට කාන්තා, ළමා කටයුතු හා සමාජ

සවිබලගැන්වීම් අමාත්‍යාංශය සමඟ පාර්ශ්වකරුවන් ලෙස සබඳතා ගොඩනගා ගැනීමට එකඟ වූ සියලු රාජ්‍ය නොවන ආයතනවලට අපගේ හදපිරි ප්‍රණාමය පුද කිරීමට ද කැමැත්තෙමු. ඔවුන්ගේ නොමඳ සහයෝගය ඉතා ප්‍රශංසනීය වන අතර එය බෙහෙවින් අගය කරන්නෙමු.

මෙම ජාතික ක්‍රියාකාරී සැලැස්ම ගොඩනැගීම සඳහා අදහස් හා යෝජනා ලබා දෙමින් දායක වූ කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ සියලු කාර්ය මණ්ඩල සාමාජිකයන්ට අපගේ ස්තුතිය පුදකරමු. ඔවුන්ගේ අඛණ්ඩ කැපවීම අප අගය කරන්නෙමු.

අවසන් වශයෙන්, කාන්තාව, සාමය සහ ආරක්ෂාව පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්මක් ගොඩ ගොඩනැඟීමේ ක්‍රියාවලිය සාර්ථකව අවසන් කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික සහාය හා සම්බන්ධීකරණය ලබා දීම වෙනුවෙන් ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාව සහ කාන්තාවන් සවිබලගැන්වීම සඳහා වූ එක්සත් ජාතීන්ගේ කාන්තා ඒකකයේ කාර්ය මණ්ඩලයට හා උපදේශකවරුන්ට අපගේ ස්තුතිය පුද කරන්නෙමු.

කාන්තාවන් සවිබලගැන්වීම හා ඔවුන්ගේ සමාජ අරක්ෂාව සැලසීම අමාත්‍යාංශයේ මෙහෙවර වන අතර මෙම ජාතික ක්‍රියාකාරී සැලැස්ම ශ්‍රී ලංකාවේ කාන්තාව, සාමය සහ ආරක්ෂාව හා සම්බන්ධ වැඩපිළිවෙල තවදුරටත් ඉදිරියට ගෙනයාමේ පළමු පියවර බවට පත්වේ යැයි අපගේ බලාපොරොත්තුවයි.

**යමුනා පෙරේරා**
ලේකම්
කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය

# පටුන


හැඳින්වීම 2

කෙටි යෙදුම් 5

හැඳින්වීම සහ පසුබිම 7

- ජාතික ක්‍රියාකාරී සැලැස්මේ සන්දර්භය 11
- ජාතික ක්‍රියාකාරී සැලැස්මේ අරමුණු 16
- ජාතික ක්‍රියාකාරී සැලැස්ම සැකසීමේ ක්‍රියාවලිය සහ උපදේශනවලින් සොයා ගත් කරුණු 19

තේමාත්මක ප්‍රමුඛතාව 01:
නීති, ප්‍රතිපත්ති හා ආයතනික ප්‍රතිසංස්කරණ 26

තේමාත්මක ප්‍රමුඛතාව 02:
කාන්තාවන් විසින් අත්දකින ලද අවතැන් වීමෙන් ඇති වූ බලපෑම සම්බන්ධයෙන් කටයුතු කිරීම 43

තේමාත්මක ප්‍රමුඛතාව 03:
හමුදා සහ පොලිස් වැන්දඹුවන්, හිටපු කාන්තා සටන්කරුවන් සහ කාන්තා ගෘහමූලික කුටුම්බ මුහුණ දෙන ගැටලුවලට විසඳුම් ලබා දීම 52

තේමාත්මක ප්‍රමුඛතාව 04:
කාන්තා ආරක්ෂාව හා සුරක්ෂිතතාව 62

තේමාත්මක ප්‍රමුඛතාව 05:
කාන්තාවන්ගේ ආර්ථික සවිබලගැන්වීම 72

තේමාත්මක ප්‍රමුඛතාව 06:
සාමය ගොඩනැගීම, ගැටුම් වැළැක්වීම, ගැටුම් නිරාකරණය තුළ සහ තීරණ ගැනීම සහ දේශපාලනය තුළ කාන්තාවන්ගේ සහභාගිත්වය ප්‍රවර්ධනය කිරීම 58

අධීක්ෂණය සහ ඇගයීම 86

- අධීක්ෂණ සහ ඇගයුම් ක්‍රමවේදය 87
- ඉලක්ක සහ දර්ශක 87
- නිරීක්ෂණය සහ ඇගයීම ක්‍රියාත්මක කිරීමේ ක්‍රමෝපාය 94

කාන්තාව, සාමය හා ආරක්ෂාව පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම ආශ්‍රිත අභියෝග 92

ඇමුණුම 1:
පළාත් උපදේශන පෙළ ගැස්ම 101

# කෙටි යෙදුම්

| | |
|---|---|
| **CBOs** | ප්‍රජා මූලික සංවිධාන |
| **CEDAW** | කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීමේ සම්මුතිය |
| **CRSV** | ගැටුම් ආශ්‍රිත ලිංගික ප්‍රචණ්ඩත්වය |
| **CSOs** | සිවිල් සමාජ සංවිධාන |
| **FGD** | නාභිගත කණ්ඩායම් සාකච්ඡාව |
| **FHHs** | කාන්තා ගෘහමූලික කුටුම්බ |
| **GoSL** | ශ්‍රී ලංකා රජය |
| **IDPs** | අභ්‍යන්තරව අවතැන් වූවන් |
| **INGOs** | ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන |
| **LTTE** | දෙමළ ඊළාම් විමුක්ති කොටි |
| **M&E** | අධීක්ෂණ හා ඇගයීම් |
| **NAP** | ජාතික ක්‍රියාකාරී සැලැස්ම |
| **NAP on WPS** | කාන්තාව, සාමය හා ආරක්ෂාව සම්බන්ධයෙන් වන ජාතික ක්‍රියාකාරී සැලැස්ම |
| **NGOs** | රාජ්‍ය නොවන සංවිධාන |
| **OGP** | විවෘත රාජ්‍ය හවුල්කාරිත්වය |
| **PWDs** | ආබාධ සහිත පුද්ගලයන් |
| **SDGs** | තිරසර සංවර්ධන අරමුණු |
| **SGBV** | ලිංගික සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය |
| **SOPs** | සම්මත මෙහෙයුම් පටිපාටි |
| **UN Women** | ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව සහ කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා වන එක්සත් ජාතීන්ගේ ආයතනය |
| **WDOs** | වනිතා සංවර්ධන නිලධාරීන් |
| **WPS** | කාන්තාව, සාමය සහ ආරක්ෂාව |

# හැඳින්වීම සහ පසුබිම

## එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා 1325

2000 ඔක්තෝබර් 31 වෙනි දින එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය කාන්තාව, සාමය හා ආරක්ෂාව (Women, Peace and Security) පිළිබඳ යෝජනාව සම්මත කරමින් සිය ඉතිහාසයේ සන්ධිස්ථානයක් සනිටුහන් කරන ලදී. ගැටුම් සන්දර්භය තුළ සහ ගැටුම්වලින් පසුව ඇතිවන කාන්තාවන්ගේ අවශ්‍යතා හඳුනා ගැනීම පිළිබඳව ලෝකයේ අවධානය යොමු කිරීමට මෙය සමත් විය. එසේම සාමය හා ආරක්ෂාව තුළ කාන්තාවගේ භූමිකාවේ වැදගත්කම ද එය විසින් හඳුනා ගෙන ඇත. එමෙන්ම, මෙම යෝජනාව මගින් කාන්තාවන් තීරණ ගැනීම් සඳහා වැඩි වශයෙන් දායක කරගැනීම සහ ගැටුම් නිරාකරණ යාන්ත්‍රණ තුළ කාන්තාවන්ගේ සහභාගිත්වය වැඩි කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට රාජ්‍යයන් දිරිමත් කර ඇත.

කාන්තාව, සාමය හා ආරක්ෂාව පිළිබඳ ගෝලීය න්‍යාය පත්‍රය එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා (United Nations Security Council Resolution-UNSCR) 1325 යටතේ හඳුනා ගෙන ඇති කුලුනු හතරක් මත පදනම් වේ. එම කුලුනු හතර නම්:

1. සහභාගිත්වය
2. ආරක්ෂාව
3. වැළැක්වීම
4. සහන ලබා දීම සහ හානි පූරණය

එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා අංක 1325 ට අමතරව කාන්තාව, සාමය හා ආරක්ෂාව පිළිබඳ න්‍යාය පත්‍රය තව දුරටත් පෙරට ගෙන යෑම සඳහා සහාය වන යෝජනා 9ක් ඇත. ඒවා නම්:

1. එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා 1820
2. එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා 1888
3. එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා 1889
4. එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා 1960
5. එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා 2106
6. එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා 2122
7. එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා 2242
8. එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා 2467
9. එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා 2493

කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීමේ සම්මුතිය (Convention on the Elimination of All Forms of Discrimination Against Women-CEDAW) මෙම එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනාවලට ශක්තිමත් පදනමක් සපයන අතර බීජිං ප්‍රකාශනය සහ ක්‍රියාකාරී වේදිකාව (Beijing Declaration and Platform for Action) ශ්‍රී ලංකාව සඳහා කාන්තාව, සාමය හා ආරක්ෂාව පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම (National Action Plan-NAP) සකස් කිරීමේ දී උපයෝගි කර ගත හැකි පාදක රාමුවක් සම්පාදනය කරයි. තව දුරටත්, ශ්‍රී ලංකා රජයේ ජාතික ප්‍රතිපත්ති රාමුව තුළ විශේෂයෙන්ම ගැටුම්වල බලපෑම්වලට ලක් වූ කාන්තාවන් හා සම්බන්ධව විශේෂ ජාතික ක්‍රියාකාරී සැලැස්මක් ද ඔස්සේ කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශයට කටයුතු කළ හැකි අයුරින් ක්‍රියා රාමුවක් ඉදිරිපත් කොට තිබේ. ආයුධ සන්නද්ධ ගැටුම නිමා වී ඇති නමුත්, ශ්‍රී ලංකා රජයේ ජාතික ප්‍රතිපත්ති ප්‍රකාශයට මේ සම්බන්ධ ප්‍රතිපත්ති ඇතුළත් වී තිබෙන බැවින් ගැටුම හා සම්බන්ධ ගැටලු වලට නොකඩවාම විසඳුම් සෙවීම සඳහා ශ්‍රී ලංකා රජය අරමුණු කරගෙන සිටී.

මෙම ජාතික ක්‍රියාකාරී සැලැස්ම නිර්මාණය කිරීමේදී එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා 1325 (UNSCR 1325) මගින් දක්වා ඇති මග පෙන්වීම් අදාළ කරගන්නා ලදී.

එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා 1325:

**එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා 1325:**
**සරණාගතයන් සහ අභ්‍යන්තරව අවතැන් වූවන් ඇතුළුව සන්නද්ධ ගැටුමෙන් අහිතකර ලෙස පීඩාවට පත් වන්නන් බහුතරයක් කාන්තාවන් සහ ළමයින් බවත්, සටන්කරුවන් සහ සන්නද්ධ කණ්ඩායම් විසින් වඩ වඩාත් ඉලක්ක කර ගැනෙන්නේ ඔවුන් බවත් කල් පවත්නා සාමය සහ සංහිඳියාව කෙරෙහි ඉන් ඇති වී තිබෙන බලපෑමත් හඳුනා ගනියි.**

එම යෝජනාව:

**ගැටුම් වැළැක්වීම හා නිරාකරණය සහ සාමය ගොඩනැගීම වෙනුවෙන් කාන්තාවන් ඉටු කරන වැදගත් කාර්යභාරය ද නැවත තහවුරු කරන අතර සාමය හා ආරක්ෂාව පවත්වා ගෙන යෑම හා ප්‍රවර්ධනය කිරීම සඳහා දරන සියලු පරිශ්‍රමයන් තුළ ඔවුන්ගේ සමාන සහභාගිත්වයේ සහ පූර්ණ සම්බන්ධ වීමේ වැදගත්කමත් ගැටුම් වැළැක්වීම සහ නිරාකරණය පිළිබඳ තීරණ ගැනීම තුළ ඔවුන් ඉටු කරන භූමිකාව පුළුල් කිරීමේ අවශ්‍යතාවත් අවධාරණය කරයි.**

1325 යෝජනාව මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සාමය සහ ආරක්ෂාව පවත්වා ගෙන යෑම හා ප්‍රවර්ධනය කිරීම සඳහා ගනු ලබන සියලු පියවර තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාව සහ කාන්තාවන්ගේ සමසහභාගිත්වය හා පූර්ණ සම්බන්ධ වීම ප්‍රවර්ධනය කිරීමට අපේක්ෂා කරයි. එපමණක් නොව "ගැටුම් අතරතුර හා ඉන් පසුව කාන්තාවන්ගේ හා ගැහැණු ළමයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන ජාත්‍යන්තර මානුෂීය හා මානව හිමිකම් නීතිය පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව" නැවත තහවුරු කරයි. මෙම අවශ්‍යතා හඳුනා ගැනීමට සහ සාමය හා ආරක්ෂාව සම්බන්ධයෙන් කරනු ලබන සියලු ක්‍රියාකාරකම් තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය ප්‍රධාන ප්‍රවාහගත කිරීමට ද සාමය හා ආරක්ෂාව ප්‍රවර්ධනය කිරීම සඳහා කරන කටයුතු තුළ කාන්තාවන්ගේ පූර්ණ ආරක්ෂාව හා සම්බන්ධ වීම සහතික කිරීම සඳහා ඵලදායක ආයතනික, සමාජයීය, ප්‍රතිපත්තිමය හා නීතිමය විධිවිධාන ස්ථාපිත කිරීමට ද ලොව පුරා රාජ්‍යයන් දිරි ගන්වා ඇත. ශ්‍රී ලංකා රජයේ ජාතික ප්‍රතිපත්ති ප්‍රකාශයද ඇසුරු කරමින් කාන්තාව, සාමය හා ආරක්ෂාව පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම සකස් කරනු ලැබ ඇත්තේ මෙවන් රාමුවක් තුළ ය.

## කාන්තාව, සාමය හා ආරක්ෂාව පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේ අවශ්‍යතාව

ශ්‍රී ලංකාව 1981 වසරේ සිට කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීමේ සම්මුතියේ (CEDAW) පාර්ශ්වකරුවෙකි. ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාව සඳහා වූ න්‍යාය පත්‍රය පෙරට ගෙන යෑමේ දී සහ විශේෂයෙන් ම ගැටුම් කාලවල දී සහ ගැටුම්වලින් බලපෑමට ලක් වූ සමාජවල කාන්තාවන්ට එරෙහි හිංසනය වැළැක්වීම සඳහා, කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීමේ සම්මුතිය සහ එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා 1325 ප්‍රයෝජනවත් මෙවලම් විය හැකි බව සනාථ වී ඇත.

පසුගිය අඩ සියවස තුළ ශ්‍රී ලංකා රජයේ ත්‍රිවිධ හමුදාව සහ දෙමළ ඊළම් විමුක්ති කොටි (Liberation Tigers of Tamil Eelam-LTTE) නම් සංවිධානය අතර ඇති වූ සන්නද්ධ ගැටුම හැරුණු විට ශ්‍රී ලංකාව තුළ කැරලි, කෝලාහල ද ඇති වූ අතර, මේ සියල්ල මගින් කාන්තාවන්ගේ ජීවිතවලට විෂමානුපාතික ලෙස බලපෑම් ඇති කොට ඇත. මෙම ගැටුම්වල ප්‍රතිඵල ලෙස කාන්තාවන් විශාල ප්‍රමාණයක් කාන්තා ගෘහමූලික කුටුම්බ (Female Headed Households-FHHs) බවට පත් වීම, අවතැන් වීමට මුහුණ දීම, තිරසර ආදායම් උත්පාදන මාර්ග බිඳ වැටීම, ඉහළ යන දරිද්‍රතාවට මුහුණ දීම, ලිංගික හිංසනය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය (Sexual and Gender Based Violence-SGBV) හෝ ගැටුම් ආශ්‍රිත ලිංගික හිංසනය (Conflict Related Sexual Violence-CRSV) සහ වෙනත් ආකාරයේ හිංසනවලින් සහ අසාධාරණවලින් පීඩාවට පත් වී ඇත. මේවා මගින් පෙරළා රජය වෙත කාන්තාවන්ට එරෙහි හිංසනය වැළැක්වීම, කාන්තා ආරක්ෂාව ප්‍රවර්ධනය, තීරණ ගැනීමේ තනතුරුවල කාන්තාවන්ගේ නියෝජනය ඉහළ නැංවීම ප්‍රවර්ධනය සහ සමානාත්මතාව මූලික අයිතිවාසිකමක් ලෙස හඳුනාගන්නා, ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වැනි වගන්ති ප්‍රකාරව පූර්ණ ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව ළඟා කර ගැනීම යන අභියෝග පෙරළා සෘජුව රජය වෙත එල්ල කොට ඇත. කාන්තාවන්ගේ ජීවන යථාර්තයන්ට දිගින් දිගටම බලපෑම් එල්ල කරමින් පවතින මෙම ගැටුම්වල ප්‍රතිඵල ශ්‍රී ලංකා ඉතිහාසයේ මෙම වකවානුව තුළ කාන්තාව, සාමය හා ආරක්ෂාව පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්මක් සම්පාදනය කිරීමේ අවශ්‍යතාව ඉස්මතු කොට ඇත.

ශ්‍රී ලංකාවේ සන්නද්ධ ගැටුම සහ ගැටුම් ආශ්‍රිත වෙනත් වාතාවරණ නිසා කාන්තාවන් පහත දැක්වෙන ගැටලුවලට ද මුහුණ පා ඇත:

- යුද වැන්දඹුවන් බවට පත් වීම
- කාන්තාවන් හෝ ඔවුන්ගේ ආදරණීයයන් ගැටුම් හේතුවෙන් ඇතිවූ ආබාධ සහිත තත්ත්ව තුළින් පීඩාවට ලක් වීම
- ආදරණීයයන් මරණයට පත් වීම සහ අතුරුදහන් වීම
- කම්පනයට පත් වීම සහ ප්‍රතිකම්පනයට පත් වීම
- සූරා කෑම (ලිංගික සහ වෙනත්)
- නීතියේ යුක්තිය වෙත ප්‍රවේශ වීම සම්බන්ධ ගැටලුවලට මුහුණ දීම
- ව්‍යුහාත්මක අසමානතාවලට මුහුණ දීම
- ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ වෙනස් කොට සැලකීම
- ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳව අවබෝධයකින් තොර, ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳව අක්‍රිය හෝ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳව අසංවේදී නීති සහ ප්‍රතිපත්ති
- ආරක්ෂණ යාන්ත්‍රණවල අඩුපාඩුකම් සහ පවත්නා එවැනි යාන්ත්‍රණ කාන්තාවන් සමාජ අසමානතාව හේතුවෙන් 'තර්ජනයට ලක් වන' සමාජ කොටසක් ලෙස හඳුනා නොගනිමින් 'තර්ජනයට ලක් වන' කණ්ඩායමක් ලෙස පමණක් සලකන උපකල්පන මත පදනම්ව ගොඩනගා තිබීම
- දරිද්‍රතාව ඉහළ යෑම
- ස්ත්‍රී පුරුෂභාවය, ජාතිය, ආගම, කුලය, සමාජ තත්ත්වය, ආර්ථික තත්ත්වය සහ අධ්‍යාපන තත්ත්වය මත පදනම් වූ අන්තර්ආංශික තර්ජනයට ලක්වීමට ඇති හැකියාව
- සාර්ථක ලෙස ගැටුම් වැළැක්වීම ඉලක්ක කර ගත් ඒකාබද්ධ රාජ්‍ය, පළාත් සහ ප්‍රජා මට්ටමේ ප්‍රතිපත්ති නොමැතිකම
- දේශපාලනික සහභාගිත්වය හා නියෝජනය සඳහා ප්‍රමාණවත් අවස්ථා නොමැතිකම
- සමාජීය ඒකාබද්ධතාව ඇති කරන ප්‍රතිපත්ති නොමැතිකම
- සහායක ව්‍යුහ නොමැතිකම
- තිරසර ආදායම් උත්පාදන ක්‍රම නොමැතිකම
- ආර්ථික සහාය ප්‍රමාණවත් නොවීම හෝ නොමැතිකම
- ඒකාබද්ධතාවෙන් තොර සහන ලබා දීමේ සහ හානිපූරණය කිරීමේ ක්‍රියාවලි
- කාන්තා ගෘහමූලික කුටුම්බ සංඛ්‍යාව වර්ධනය වීම
- ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය (SGBV) හෝ ගැටුම් ආශ්‍රිත ලිංගික හිංසනය (CRSV)

ශ්‍රී ලංකා රජය විනයගරුක, සාධාරණ සමාජයක් සහ සෞභාග්‍යවත් ජාතියක් නිර්මාණය කිරීම සඳහා කැපවී ඇත. කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය කාන්තාව සාමය සහ ආරක්ෂාව පිළිබඳ ක්‍රියාකාරී රාමුවක් ගොඩනැගීමේ කර්තව්‍යයට උර දී ඇත්තේ මෙවන් පොදු පසුබිමකය.

# ජාතික ක්‍රියාකාරී සැලැස්මේ සන්දර්භය

## ශ්‍රී ලංකාවේ සන්නද්ධ ගැටුම සහ එය කාන්තාවන්ට බලපෑ ආකාරය පිළිබඳ විග්‍රහය

1983 සහ 2009 අතර කාලය තුළ ශ්‍රී ලංකාවේ රාජ්‍ය සන්නද්ධ හමුදාව සහ එල්ටීටීඊ සටන්කරුවන් අතර සන්නද්ධ ගැටුමක් පැවති අතර එමගින් ආර්ථික සාමාජික දේශපාලනික සහ ජනවාර්ගික -ආගමික වශයෙන් දැඩි හානි ඇතිවිය. ඒ ඔස්සේ ඉතා විශාල ජීවිත හානි ප්‍රමාණයක්, ගැටුම් ආශ්‍රිත අතුරුදහන් වීම්, සිවිල් ජීවිත විනාශ වීම්, ගැටුම් ආශ්‍රිත ආබාධිතභාවයට පත්වීම්, පුළුල් වශයෙන් වූ දේපළ සහ පරිසර විනාශයක් සිදු විණි. අදින් වසර දාහතරකට පමණ පෙර සන්නද්ධ ගැටුම නිමාව දුටු නමුත් එහි බලපෑම් අද දක්වා ම බලාත්මකය.

කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය, අතීතයේ සිදු වූ හානිකර සිදුවීම් නැවත ඇති නොවීමට පියවර ගනිමින් ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව, කල් පවත්නා සාමය සහ කාන්තාවන්ගේ ආරක්ෂාවට හිතකාමී වන පරිසරයක් ගොඩනැගීමට දායකවීමට අරමුණු ගත වී ඇත. කාන්තාවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂාව සහ කාන්තාවන් සවිබල ගැන්වීම පිළිබඳව ඇති වෙනත් ජාතික ක්‍රියාකාරී සැලසුම්වල විෂය ක්ෂේත්‍රයන්ගෙන් පැහැදිලි ලෙසම වෙනස් වූ මෙම කාන්තාව, සාමය හා ආරක්ෂාව පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම, සන්නද්ධ ගැටුමෙන් කාන්තාවන්ට සිදු වී ඇති බලපෑම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරයි.

ගැටුම හා සම්බන්ධව කාන්තාවන් ලබන අත්දැකීම්, පුරුෂයන් ලබන එවන් අත්දැකීම්වලට වඩා වෙනස් වේ. සමාජයීය ප්‍රමිතීන් හා කාන්තාවන් අවදානම් සහගත තත්ත්වයන්ට නැඹුරු කරවන මත මගින්, ගැටුම්වලින් කාන්තාවන්ට ඇති කරන බලපෑම බලවත් කරන අතර, තීරණ ගැනීමේ දී සහ රාජ්‍ය පාලනයේ දී සක්‍රීය කාන්තා අභිනියෝජනයට බාධා පමුණුවයි. මෙම විවිධාකාර වූ බලපෑම් සමාජය තුළ කාන්තාවගේ භූමිකාව තව තවත් ලඝු කොට ඇත. නීති සහ ප්‍රතිපත්ති මගින් ප්‍රතිචාර දැක්වීමට අපේක්ෂිත තත්ත්වයන් එලදායි ලෙස ආමන්ත්‍රණය කිරීම සඳහා එවැනි සමාජ පරිවර්තනයක් කෙරෙහි අවධානය යොමු කිරීම අත්‍යවශ්‍ය වේ.

ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාව මගින් එහි 12(4) වගන්තිය ප්‍රකාරව කාන්තාවන් දරුවන් හෝ ආබාධ සහිත පුද්ගලයන්ගේ අභිවෘද්ධිය පිණිස නීති සේවා, නීති සම්පාදකත්වය සහ විධායක පියවර ඔස්සේ විශේෂ විධිවිධාන ගැනීමට රජයට හැකියාව ඇත. මෙ මගින් සාමය හා ආරක්ෂාව පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම හරහා කාන්තාවන්ගේ අභිවෘද්ධිය සඳහා විශේෂ මැදිහත්වීම් සිදු කිරීමට ද ඉඩකඩ සලසයි.

## කාන්තා ආරක්ෂාව සහ සාමය ගොඩනැංවීමේ ක්‍රියාවලියට කාන්තාවන්ගේ සහභාගි වීම තහවුරු කිරීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් ගෙන ඇති යහප්‍රතිඵල සහතික කිරීමේ ක්‍රියාමාර්ග

ශ්‍රී ලංකා රජය විසින් කාන්තාවන්ගේ අයිතීන්, ආරක්ෂාව සහ සවිබල ගැන්වීම තහවුරු කිරීම සඳහා බහුවිධ පරිපූර්ණ ක්‍රියාමාර්ග ස්ථාපනය කර ඇත.

ප්‍රජා මූල මට්ටමේදීල කාන්තා සංවර්ධන නිලධාරීන් **(Women Development Officers -WDOs)**, උපදේශන නිලධාරීන්, කාන්තා ක්ෂේත්‍ර සංවර්ධන සහකාරවරුන්, දිස්ත්‍රික්ක සහ කොට්ඨාස මට්ටමේ උපදේශන සහකාරවරුල ළමා අයිතිවාසිකම් ප්‍රවර්ධන නිලධාරීන්, මුල් ළමාවිය සංවර්ධන සහකාරවරුන්, ළමා ආරක්ෂණ සහ මනෝ උපදේශන නිලධාරීන් සහ සහන සැලසීමේ සොහොයුරියන්, කාන්තාවන් සහ ළමයින්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා පත් කරනු ලැබ ඇත. ස්ත්‍රී පුරුෂ සමාජභාවය

පිළිබඳව මනා සංවේදීතාවකින් යුතුව ඔවුන්ගේ භූමිකා මැනැවින් ඉටු කරන බව තහවුරු කිරීම සඳහා මෙම නිලධාරීන් තාක්ෂණික ක්ෂේත්‍රවල මෙන්ම ස්ත්‍රී පුරුෂ සමාජභාවය[1] පිළිබඳ ක්ෂේත්‍රවල ද පුහුණුව ලබා දී ඇත.

මීට සමාන්තරව කාන්තාවන්ගේ නායකත්ව කුසලතා, මූල්‍ය සාක්ෂරතාව, සහ පොදුවේ සාමාජීය සහභාගිත්වය ඉහළ නැංවීම තහවුරු කිරීම සඳහා ප්‍රජාමූල මට්ටමේදී විවිධ සමාරම්භ සනිටුහන් කිරීමට ශ්‍රී ලංකා රජය කටයුතු කර ඇත. සඳහන් කරන ලද අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මේ වන විට දිස්ත්‍රික් කාන්තා මණ්ඩල 24ක්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කාන්තා මණ්ඩල 330ක් සහ කාන්තා ක්‍රියාකාරී සමාජ 12, 500ක් කාන්තා කාර්යංශය[2] යටතේ ක්‍රියාත්මක වෙමින් පවතී. තවදුරටත් කාන්තා ක්‍රියාකාරී සමාජවල සිටින කාන්තාවන්ගේ කුසලතා සංවර්ධනය හා ආර්ථික සවිබල ගැන්වීම අරමුණු කර ගනිමින් වැඩසටහන් දියත් කිරීමට අමාත්‍යාංශය විසින් මූල්‍යාධාර වෙන් කොට තිබේ.[3]

මීට අමතරවල විවිධ නිලධාරීන් අතර ඒකාබද්ධතාව ශක්තිමත් කිරීම සඳහා කාන්තා සහ ළමා සංවර්ධන ඒකක[4], දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පිහිටුවීමට ශ්‍රී ලංකා රජය 2014දී කටයුතු කරන ලදී. මේ ක්‍රියාමාර්ගයත් සමග යහප්‍රතිඵල සහතික කරමින් එකම කටයුත්ත නැවත සිදු කිරීම වළකමින් විවිධ නිලධාරීන් සහ ඒකක අතර සහයෝගිතාව වර්ධනය කිරීමට ශ්‍රී ලංකා රජය පහසුකම් සලසා ඇත. මෙම ඒකක 2015දී තවදුරටත් ශක්තිමත් කරන ලදී.[5] එමෙන්ම, මෙම ඒකක මගින් තොරතුරු රැස් කිරීමේ මධ්‍යස්ථානයක් සහ උපදේශන මධ්‍යස්ථානයක්ද පවත්වාගෙන යයි.

2013දී සිදු කරන ලද ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳව අදාළ බලධාරියකු පත් කිරීමට කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කිරීමේ තීරණයට[6] අනුගාමීව සියලු අදාළ අමාත්‍යාංශවල එවන් තනතුරු පිහිටුවීමට අමාත්‍යාංශ මට්ටමින් පියවර ගන්නා ලදී. මෙම අදාළ බලධාරීන් ස්ත්‍රී පුරුෂ සමාජභාවය ප්‍රධාන ප්‍රවාහයට ගෙන ඒම පිළිබඳ ප්‍රතිපත්ති ප්‍රවර්ධනය සහ කාන්තාවන්ට හා ගැහැනු ළමයින්ට එරෙහි වෙනස් ලෙස සැලකීම තුරන් කිරීම අරමුණු කර ගනී. එමෙන්ම ඔවුහු ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමබරතාව පවත්වා ගැනීමටත්, ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් හිංසන සිදු වීම අවම කිරීම සඳහා වැඩසටහන්, ක්‍රමවේද සහ පියවර ගැනීම් දියත් කිරීමටත් කටයුතු කරනු ඇත.[7]

---

1 කාන්තා හා ළමා කටයුතු අමාත්‍යංශයේ කාර්යසාධන වාර්තාව - 2019 පිවිසීම සඳහා: **https://www.parliament.lk/uploads/documents/paperspresented/performance-report-ministry-of-women-child-affairs-2019.pdf** අවසන් වරට පරිශීලනය කළේ 2021 පෙබරවාරි 18වැනි දා.

2 කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා අමාත්‍යංශ වෙබ් අඩවිය. පිවිසීම සඳහා: **http://www.childwomenmin.gov.lk/institutes/womens-bureau** අවසන් වරට පරිශීලනය කළේ 2021 පෙබරවාරි 18වැනි දා.

3 කාන්තා හා ළමා කටයුතු අමාත්‍යංශයේ කාර්යසාධන වාර්තාව - 2017 පිවිසීම සඳහා: **https://www.parliament.lk/uploads/documents/paperspresented/performance-report-ministry-of-women-child-affairs-2017.pdf** අවසන් වරට පරිශීලනය කළේ 2021 පෙබරවාරි 18වැනි දා.

4 කාන්තා හා ළමා කටයුතු අමාත්‍යංශයේ කාර්යසාධන වාර්තාව - 2014 පිවිසීම සඳහා: **https://www.parliament.lk/uploads/documents/paperspresented/performance-report-ministry-of-child-development-and-women-affairs-2014.pdf** අවසන් වරට පරිශීලනය කළේ 2021 පෙබරවාරි 19වැන දා.

5 https://www.parliament.lk/uploads/documents/paperspresented/performance-report-ministry-of-wom- en-child-affairs-2015.pdf last accessed on 19th of February 2021.

6 කාන්තා හා ළමා කටයුතු අමාත්‍යංශයේ කාර්යසාධන වාර්තාව - 2017 පිවිසීම සඳහා: **https://www.parliament.lk/uploads/documents/paperspresented/performance-report-ministry-of-women-child-affairs-2017.pdf** අවසන් වරට පරිශීලනය කළේ 2021 පෙබරවාරි 18වැනි දා.

යුද්ධයේ බලපෑමට ලක් වූ කාන්තාවන් සවිබල ගැන්වීමට ද ශ්‍රී ලංකා රජය විශේෂයෙන්ම සැලකිය යුතු අවධානයක් ලබා දී ඇත. උදාහරණයක් ලෙස, අවි ගැටුමේ ප්‍රතිඵලයක් ලෙස වැන්දඹු බවට පත් වූ සියලු ප්‍රජාවලට අයත් කාන්තාවන්ගේ ආරක්ෂාව සඳහා වන විශේෂ ක්‍රමවේදයක් හඳුන්වා දෙමින් 2015 නොවැම්බර් 13වැනි දා කිලිනොච්චි දිස්ත්‍රික්කයේ කරච්චි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ජාතික මධ්‍යස්ථානයක් පිහිටුවන ලදි. මෙම මධ්‍යස්ථානයේ අපේක්ෂාව වන්නේ එවන් කාන්තාවන්ගෙන් යැපෙන්නන්ට සහාය දැක්වීමයි. රජය එම මධ්‍යස්ථානය එයට පිවිසෙන කාන්තාවන්ගේ සුරක්ෂාව සහ සුබසාධනය සපුරාලීමට හැකියාව දරන ආයතනයක් ලෙස සංවර්ධනය කරන අතර එහි අඩුපාඩු සම්පූර්ණ කර දීමට බැඳී සිටී.

නීතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ අන්තර්කාලීන ක්‍රියාවලියෙහි කොටසක් ලෙස ගොඩනගන ලද යාන්ත්‍රණයද ක්‍රියාකාරී ලෙසින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳව ප්‍රතිචාර දක්වනසුලුය. උදාහරණයක් ලෙස, හානිපූරණය සඳහා වන කාර්යාලයේ ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශන (2021) ගැටුම්වල බලපෑමට ලක් වූ කාන්තාවන්ගේ අවශ්‍යතා සහ තර්ජනයට ලක්වීමේ හැකියාව පිළිබඳ විශේෂ සැලකිල්ලක් දක්වා ඇති අතර, වන්දි ලබා දීමේදී එවැනි කාන්තාවන්ට ප්‍රමුඛතාව ලබා දීම නිර්දේශ කොට ඇත.

ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් හිංසනය තුරන් කිරීම සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදී, එමෙන්ම පහසුවෙන් පිවිසිය හැකි රාජ්‍ය ආයතන ඇති කිරීම සඳහා වන පියවරක් ලෙසින් ශ්‍රී ලංකා රජය 2015දී ශ්‍රී ලංකා කාන්තා හා ළමා කාර්යාංශයක් රට පුරාම සියලු පොලිස් ස්ථානවල පාහේ පිහිටුවන ලදී.[8] සමාජයේ සියලු මට්ටම්වලදී ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කර ගත් හිංසනය වෙත අවධානය යොමු කිරීම, එම තත්ත්වය අවම කිරීම සහ තුරන් කිරීම සඳහා වන දැක්මකින් යුතුව පාසල් තුළ සහ රාජ්‍ය ආයතන තුළ අවබෝධය ඉහළ නැංවීම ද මෙම ඒකකයේ එක් කාර්යභාරයක් වෙයි. එය මූලික වශයෙන් පුහුණු කාන්තා පොලිස් නිලධාරින්ගෙන් සමන්විත වෙයි.[9] මෙමගින් වඩා පහසුවෙන් හා ඉහළ විශ්වාසයකින් යුතුව, පොලීසිය වෙත පිවිස සහාය ලබා ගැනීමට කාන්තාවන්ට අවස්ථාව ලබා දී ඇත. තව දුරටත් ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් හිංසනය සම්බන්ධ සිදුවීම් සමග ගනුදෙනු කිරීමේදී ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදී වීම පිළිබඳව පොලිස් නිලධාරින්ට පුහුණුව සැපයීම සඳහා පියවර ගෙන තිබේ. මෙම පුහුණුවීම්වල අන්තර්ගතයේ කොටසක් ලෙස මේ වන විට, ස්ත්‍රී පුරුෂ සමාජභාවය කෙරෙහි අවධානය යොමු කරමින් 'ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වළක්වාලීමේ පනත' පිළිබඳ පුහුණු පාඩම් ඒකකයක් ඇතුළත් කොට ඇත. එය පොලිස් නිලධාරින්ගේ කාර්යභාරයේ පැහැදිලිභාවය ඉහළ නැංවීමට හා ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය හා සම්බන්ධ සිදුවීම් සමග ගනුදෙනු කිරීමේ මාර්ගෝපදේශනයක් ලෙසින් ද භාවිත වෙතැයි අපේක්ෂිතය.[10]

මේ හා සම්බන්ධව ශ්‍රී ලංකා රජය මගින් අත්පත් කර ගන්නා ලද සුවිශේෂී ජයග්‍රහණයක් වන්නේ පළාත් පාලන ආයතන තුළ නියෝජිතයන්ගෙන් අවම වශයෙන් 25%ක් දක්වා කාන්තා නියෝජනය ඉහළ නැංවීමේ ප්‍රතිපත්තිමය ඉලක්කය සහිතව පළාත් පාලන ආයතනවල කාන්තා නියෝජනය ඉහළ

---

7 අමාත්‍යංශ මට්ටමින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය ප්‍රධාන ධාරාවට ගෙන ඒම තහවුරු කිරීමේ වැඩසටහන: මූලාශ්‍රය: https://tbinternet.ohchr.org/Treaties/CEDAW/Shared%20 Documents/LKA/INT_CEDAW_RLI_ LKA_26729_E.pdf අවසන් වරට පරිශීලනය කළේ 2021 පෙබරවාරි 19වැනි දා.

8 කාන්තා හා ළමා කටයුතු අමාත්‍යංශයේ කාර්යසාධන වාර්තාව - 2015 pdf අවසන් වරට පරිශීලනය කළේ 2021 පෙබරවාරි 19වැනි දා.

9 ශ්‍රී ලංකා පොලීසියේ වෙබ් අඩවිය - පිවිසීම සඳහා https://www.police.lk/index.php/police-history අවසන් වරට පරිශීලනය කළේ 2021 පෙබරවාරි 18වැනි දා.

10 කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා අමාත්‍යංශ වෙබ් අඩවිය. පිවිසීම සඳහා: http://www.childwomenmin.gov.lk/institutes/national-committee-women/programs අවසන් වරට පරිශීලනය කළේ 2021 පෙබරවාරි 19වැනි දා.

නැංවීම සඳහා 2016 සහ 2017 අංක 1 දරන (සංශෝධිත) පළාත් පතන මැතිවරණ පනත බලාත්මක කිරීමයි. එමෙන්ම, දේශපාලනයේ නියැළීමට කාන්තාවන්ට ඇති හැකියාව ඉහළ නැංවීමට ශ්‍රී ලංකා රජය විසින් ප්‍රයත්න දරා ඇත. උදාහරණයක් ලෙස 2016 වසරේදී, පේරාදෙණිය විශ්වවිද්‍යාලය සමග අනුබද්ධ වෙමින් විභවතාවක් ඇති අපේක්ෂිකාවන් සඳහා දේශපාලන විද්‍යා සහතික පත් පාඨමාලාවක් සිංහල හා දෙමළ භාෂා දෙකෙන්ම අරඹන ලදී.[11]

කාන්තා මණ්ඩල සාමාජිකයන් ගණන ඉහළ නැංවීමටද ශ්‍රී ලංකා රජය ප්‍රතිපත්තිවලට එළැඹ තිබේ. 2011දී රජය විසින් සමථ මණ්ඩල සාමාජිකයන්ගේ සංගමය පිළිබඳ කළ නිරීක්ෂණයකින් හෙළි වූයේ එහි කාන්තා ප්‍රතිශතය 14%ක් පමණක් වන බවයි.[12] සමථ මණ්ඩල යාන්ත්‍රණයට කාන්තා සහභාගිත්වය ක්‍රම ක්‍රමයෙන් ඉහළ නැංවෙන බව පෙන්වමින් මෙම අගය 2016[13] වන විට 20% දක්වා ඉහළ ගොස් තිබිණි.

ශ්‍රී ලංකා රජය මගින් කාන්තාවන්ගේ තත්ත්වය ප්‍රතිඵල සහතික කරන අයුරින් ඉහළ නැංවීම සඳහා ගන්නා ලද පියවර කිහිපයක් ඉහත අයුරින් දැක්විය හැකිය. සාමය සහ ආරක්ෂාව පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම ඔස්සේ මෙන්ම එය ක්‍රියාත්මක කිරීම ඔස්සේ ද කාන්තාවන්ගේ ජීවිත උසස් තලයකට නංවාලීමට මෙන්ම, ගැටුම් නිරාකරණය කරමින් තිරසාර සාමයක් ගොඩනැංවීම සඳහා ශ්‍රී ලංකා රජය තව දුරටත් නව්‍යකරණ කටයුතු සිදු කිරීම හා එබඳු නව පියවර ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරයි.

## වත්මන් තත්ත්වය සහ දිගින් දිගටම පවත්නා ගැටලු

සන්නද්ධ ගැටුමේ අවසානයේ සිට ශ්‍රී ලංකා රජය ශ්‍රී ලංකාව තුළ තිරසර සාමය හා සමගිය ප්‍රවර්ධනය කිරීම සඳහා විවිධ පියවර රැසක් ගැනීමට උත්සාහ දරා ඇත. ශ්‍රී ලංකාවේ වත්මන් රජය මගින් විශේෂයෙන්ම සියලු පුරවැසියන් සඳහා සාමකාමී රාජ්‍යයක් ලබා දීම හා ජාතික ආරක්ෂාව තහවුරු කිරීමට ඇති කැපවීම ප්‍රකාශ කර ඇත. මේ හේතුව නිසා කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය පශ්චාත් යුද ශ්‍රී ලංකව තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව ආමන්ත්‍රණය කිරීම සඳහා කාන්තාව, සාමය හා ආරක්ෂාව පිළිබඳව ජාතික ක්‍රියාකාරී සැලැස්මක් සම්පාදනය කිරීමේ කටයුත්තට උර දී ඇත. ප්‍රජාව අතර සංහිඳියාව ශක්තිමත් කිරීම, සාමය ප්‍රවර්ධනය කිරීම, සහ අතීත හානි නැවත ආමන්ත්‍රණය කිරීම සඳහා මෙය අත්‍යවශ්‍ය වේ. කෙසේ වුව ද, සන්නද්ධ ගැටුමේ අවසානයෙන් පසුව පවා ප්‍රජාව අතර සංහිඳියාව සහතික කිරීම, සාමය ප්‍රවර්ධනය කිරීම සහ අතීත හානිවලට වන්දි ගෙවීම සම්බන්ධ අභියෝග ගණනාවක් දිගින් දිගටම පවතී. ශ්‍රී ලංකාවේ මෑත අතීතය ප්‍රජාව අතර පැන නගින ජනවාර්ගික-ආගමික හිංසනය සහ සමාජයේ කොටස් කිහිපයක් අතර පවතින කල් පවත්නා අසමගිකම් පිළිබඳ සාක්ෂි ද සම්පාදනය කරයි. තුන්සියයකට අධික සංඛ්‍යාවක් ජීවිතක්ෂයට පත් කළ, තවත් බොහෝ දෙනෙකු ස්ථිර සහ/හෝ තාවකාලික ආබාධ සහිතභාවයට ගොදුරු කළ පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරවලින් පසුව මෙම යථාර්ථය තව දුරටත් අනාවරණ වී ඇත. කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය ශ්‍රී ලංකා රජයේ ජාතික ප්‍රතිපත්ති රාමුව වන 'සෞභාග්‍යයේ

---

11 කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා අමාත්‍යංශ වෙබ් අඩවිය. පිවිසීම සඳහා: http://www.childwomenmin.gov.lk/institutes/national-committee-women/programs අවසන් වරට පරිශීලනය කළේ 2021 පෙබරවාරි 19වැනි දා.

12 සිරින් සිරිවර්ධන, 'ශ්‍රී ලංකාවේ ප්‍රජා සමථ මණ්ඩල වැඩසටහන පිළිබඳව අධ්‍යයනයක්', ( අධිකරණ, මානව හිමිකම් හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය, 2011) පිවිසීම සඳහා:http://mediation.gov.lk/static/media/publications/en/Evaluation_Community_Mediation.pdf අවසන් වරට පරිශීලනය කළේ 2021 පෙබරවාරි 19වැනි දා.

13 රමණි ජයසුන්දර සහ රිමාෂ් රහ්මන්, කාන්තා සමථ මණ්ඩල නියෝජනය හඳුනා ගැනීම - ශ්‍රී ලංකා ප්‍රජා සමථ මණ්ඩලවල කාන්තාව පිළිබඳව ගැඹුරු විග්‍රහයක් - 2016, (ආසියානු පදනම, 2016) පිවිසීම සඳහා: http://mediation.gov.lk/static/media/publications/en/Understanding_Women_Mediators.pdf අවසන් වරට පරිශීලනය කළේ 2021 පෙබරවාරි 20 වැනිදා.

දැක්ම' පදනම් කරගනිමින් කාන්තාව, සාමය සහ ආරක්ෂාව පිළිබඳ ක්‍රියාකාරී රාමුවක් ගොඩනගා ඇත්තේ මෙවන් පොදු පසුබිමකය.

## සෞභාග්‍යයේ දැක්ම

සෞභාග්‍යයේ දැක්ම යනුවෙන් නම් කරන ලද ජාතික ප්‍රතිපත්ති රාමුව යනු ජනපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ මග පෙන්වීම අනුව ශ්‍රී ලංකාවේ රජය මගින් නිර්මාණය කරන ලද සුවිශේෂී සහ පරිපූර්ණ ජාතික ප්‍රතිපත්ති රාමුවකි. මෙම ජාතික ප්‍රතිපත්ති රාමුවේ ප්‍රධාන අරමුණ වන්නේ, ජනතාවට හිමි ප්‍රජාතන්ත්‍රවාදී අවකාශය ලඝු වීමට ඉඩ නොතබමින් ජාතික ආරක්ෂාව තහවුරු කිරීම සඳහා නව ක්‍රමෝපායයන් ඇති කිරීමය. මෙම ජාතික ප්‍රතිපත්ති රාමුව ප්‍රතිඵල හතරක් ලබා ගැනීමට අපේක්ෂා කරයි.

(a) එලදායි පුරවැසභාවය
(b) තෘප්තිමත් කුටුම්බ
(c) විනයගරුක හා සාධාරණ සමාජය
(d) සෞභාග්‍යවත් ජාතියක්

මෙම ප්‍රතිඵල ළඟා කරගැනීම සඳහා ශ්‍රී ලංකා රජය දස වැදෑරුම් ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමට බලාපොරොත්තු වේ.
ඒවා නම්:

(a) ජාතික ආරක්ෂාවට මුල් තැන ලබා දීම
(b) මිත්‍රශීලී නොබැඳුණු විදෙස් ප්‍රතිපත්තිය
(c) දූෂණයෙන් තොර පාලන තන්ත්‍රයක්
(d) ජනතාවගේ අපේකෂා මුදුන්පත් කරන නව ව්‍යවස්ථාවක්
(e) එලදායී පුරවැසිභාවයක් සහ හැකියාවලින් පිරුණු මානව සම්පතක්
(f) ජනතාව කේන්ද්‍ර කරගත් ආර්ථික සංවර්ධනයක්
(g) තාක්ෂණය මත පදනම් වූ සමාජයක්
(h) භෞතික සම්පත්වල සංවර්ධනය
(i) තිරසර පාරිසරික කළමනාකරණයක්
(j) විනයගරුක, නීතිගරුක, සාරධර්ම අගයන සමාජයකa

මෙම ලයිස්තුගත ප්‍රතිපත්ති අතුරින් විශේෂයෙන්ම (a), (c), (e), (f),(h),(I) සහ (J) ජාතික ක්‍රියාකාරී රාමුව හා සමපාත වෙයි. ප්‍රතිපත්තිවල අනෙකුත් අංගද ජාතික ක්‍රියාකාරී රාමුව තුළින් පිළිබිඹු වී හෝ ප්‍රතිපත්ති ක්‍රියාවේ යොදවන විට එහි පුළුල් පදනමට ඒකාබද්ධ වෙයි. ශ්‍රී ලංකාව තුළ තවමත් පවතින අවි ගැටුම හෝ ජනවාර්ගික-ආගමික ගැටුම්වලට සම්බන්ධ ගැටලු කෙරෙහි, කාන්තාවන්ට හානිපූරණ හෝ වෙනත් අත්‍යවශ්‍ය සහාය ලබා දීමේ දෘෂ්ටියකින් යුතුව අවධානය යොමු කිරීමට මෙම ක්‍රියාකාරී රාමුව මූලික වශයෙන් ඉලක්ක ගත වෙයි. කාන්තාවන්ගේ ජීවිත ඉහළට ඔසවා තැබීම, ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාව ප්‍රවර්ධනය සහ ශ්‍රී ලංකාවේ කල් පවත්නා සාමයක් සහ සහයෝගිතාවක් ඇති කිරීම පිණිස දායක වීම එහි අපේක්ෂාවයි.

# ජාතික ක්‍රියාකාරී සැලැස්මේ අරමුණු

1325වැනි එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා පදනම් කරගත් කාන්තාව, සාමය හා ආරක්ෂාව පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම එහි ප්‍රතිඵල රාමුව තුළ විස්තර කර ඇති ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම මගින් පහත දැක්වෙන අරමුණු සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂිතය.

- සාමය හා ආරක්ෂාව පවත්වා ගෙන යෑම ඇතුළු සමාජීය ජීවිතයේ සියලු පැතිකඩවල දී කාන්තාවන්ගේ අර්ථාන්විත සහභාගිත්වය වැඩි කිරීම.
- ගැටුම් හා හදිසි අවස්ථා අතරතුර දී හා ඉන් පසුව කාන්තාවන්ගේ අවශ්‍යතා, ප්‍රමුඛතා හා අයිතිවාසිකම් කෙරෙහි අවධානය යොමු කිරීම මගින් ඔවුන්ගේ සුරක්ෂිතතාව හා යහපැවැත්ම ආරක්ෂා කිරීම.
- සමාජ ඒකාබද්ධතාව ප්‍රවර්ධනය කිරීම සහ ප්‍රචණ්ඩත්වය, ත්‍රස්තවාදය හා අපරාධ වැළැක්වීම සඳහා ප්‍රජාව තුළ සහ රජයේ ආයතනවල හැකියා ගොඩනැගීම හා ශක්තිමත් කිරීම.
- ගැටුම් නිසා පීඩාවට පත් කාන්තාවන් හා ගැහැනු ළමයින්ට සහන සැලසීම හා හානි පූරණය සඳහා පහසුකම් සැපයීම.
- සියලු මට්ටම්වල දී සියල්ලන් ඇතුළත් කර ගත්, ප්‍රතිචාරාත්මක, සහභාගිත්ව හා නියෝජනාත්මක තීරණ ගැනීම සහතික කිරීම මගින් ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාව සහ තිරසර සංවර්ධන අරමුණු (Sustainable Development Goals - SDGs) සාක්ෂාත් කර ගැනීමට දායක වීම.

## දැනට පවත්නා ජාතික ක්‍රියාකාරී සැලසුම් සහ ඒවායේ ලුහුඬුතා

සමකාලීනව ශ්‍රී ලංකාවට අදාළ වන ජාතික ක්‍රියාකාරී සැලසුම් සහ ප්‍රතිපත්ති කිහිපයක් ඇත. කෙසේ වුව ද, මෙම ජාතික ක්‍රියාකාරී සැලසුම්වල අවධානය වෙනත් තේමාත්මක කාරණා කෙරෙහි මිස කාන්තාව, සාමය හා ආරක්ෂාව කෙරෙහි යොමු නොවේ. ඒ අනුව බැලූ කල එම පියවර ඔස්සේ මෙම ජාතික ක්‍රියාකාරී සැලැස්මේ ක්‍රියාකාරකම් සඳහා උපායමාර්ගික සහායක් නොලැබේ. සීමිත ප්‍රමාණයක අවස්ථාවලදී පවත්නා ප්‍රතිපත්ති සහ ක්‍රියාකාරකම් මගින් කාන්තාව, සාමය සහ ආරක්ෂාව පිළිබඳව සෘජු අවධානයක් යොමු කර තිබිය හැකි නමුත් ඒවා කාන්තාව, සාමය සහ ආරක්ෂාව පිළිබඳව මතුපිට කරුණුවලට පමණක් සම්බන්ධ වන බැවින් විෂය පථයට අදාළව ගැඹුරින් මුල් බැසගෙන ඇති ගැටලු ආමන්ත්‍රණයට අසමත් වෙයි. තව දුරටත් කාන්තාව, සාමය සහ ආරක්ෂාව පිළිබඳව සෘජු සම්බන්ධතාවක් දක්වන ඇතැම් ප්‍රතිපත්ති සහ ක්‍රියාකාරී සැලසුම් තිබිය හැකි නමුත් ඒවාද යල් පැන ගොස් හෝ තව දුරටත් කෙටුම්පත් කිරීමේ තත්ත්වයෙන් පවතින බවත්, කිසි විටෙක ක්‍රියාත්මක කර නොමැති බවත් දැකිය හැකිය.

මෙම කාන්තාව, සාමය සහ ආරක්ෂාව පිළිබඳව ජාතික ක්‍රියාකාරී සැලැස්ම හඳුන්වාදීම සාධාරණීකරණය කිරීම උදෙසා පවත්නා අදාළ සමකාලීන ජාතික ක්‍රියාකාරී සැලසුම් සහ ප්‍රතිපත්තිවල ලුහුඬුතා සංක්ෂිප්තව පහත දක්වා ඇත:

1. **ශ්‍රී ලංකාවේ ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනයට විසඳුම් ලබා දීමේ ප්‍රතිපත්ති රාමුව සහ ජාතික ක්‍රියාකාරී සැලැස්ම 2016-2020**

   මෙම ජාතික ක්‍රියාකාරී සැලැස්ම සම්මත රාමුවලට අනුරූපව සකස් කර ඇති අතර සාමාන්‍ය සන්දර්භයන් තුළ දී ලිංගික හා ස්ත්‍රී පුරුෂ

සමාජභාවය මත පදනම් වූ හිංසනය වැළැක්වීම සඳහා ප්‍රමාණවත් වුව ද, ගැටුම් ආශ්‍රිත ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසන සිදුවීම් හෝ ගැටුම් ආශ්‍රිත ලිංගික හිංසනය සම්බන්ධයෙන් විශේෂිතව කටයුතු කිරීමේ යාන්ත්‍රණවලින් සමන්විත නොවේ. වර්තමානයේ දී එය ගැටුම් ආශ්‍රිත ලිංගික හිංසනය පිළිබඳ මහ ලේකම්වරයාගේ වාර්තාවට අනුකූලව හඳුනා ගැනෙන නමුත් වෙන ම වරදක් ලෙස සැලකිය යුතු අතර පුළුල් ආකාරයකින් අර්ථ නිරූපණය කළ යුතු වේ.

## 2. මානව හිමිකම් ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලැස්ම 2017-2021

මෙම ජාතික ක්‍රියාකාරී සැලැස්ම මැනවින් සකසන ලද සහ පුළුල් සැලැස්මක් වුව ද, එක්සත් ජාතීන්ගේ 1325වැනි ආරක්ෂක මණ්ඩල යෝජනා යටතේ දක්වා ඇති කාන්තාව, සාමය හා ආරක්ෂාව පිළිබඳ න්‍යාය පත්‍රයේ සමස්ත විෂය පථය ග්‍රහණය කර නොගනියි. ගැටුම් සන්දර්භයට මුහුණ දී ඇති කාන්තාවන් අත්දකින විශේෂ අභියෝග මෙම ජාතික ක්‍රියාකාරී සැලැස්මෙන් හඳුනා නොගනී. උදාහරණයක් ලෙස ගැටුම් පැවති ප්‍රදේශවල කාන්තාවන් මුහුණ දෙන පැතිර පවත්නා ගැටලුවක් වන විවිධ සේවා වෙත ප්‍රවේශ වීමේදී කාන්තා ගෘහමූලික කුටුම්බ හෝ වැන්දඹුවන් විසින් මුහුණ දෙන බවට වාර්තා වී ඇති ලිංගික අල්ලස් ගැනීම වැනි ගැටුම් ආශ්‍රිත ලිංගික ප්‍රචණ්ඩත්වය, ස්වාමිපුරුෂයන් ආබාධ සහිත තත්ත්වයට පත්ව සිටින කාන්තා ගෘහමූලික කුටුම්බ මුහුණ දෙන දුෂ්කරතා, කාන්තාවන් හා ගැහැනු ළමයින් අත්විඳින ගැටුම් ආශ්‍රිත ආබාධ සහිත තත්ත්වය ආදිය සැලකිය හැකිය.

එපමණක් නොව, තීරණ ගැනීමේ ක්‍රියාවලිය තුළ කාන්තාවන්ගේ සහභාගිත්වයේ වැදගත්කම මෙම ජාතික ක්‍රියාකාරී සැලැස්මෙහි සඳහන් වන නමුත් එහි පරිමාණය හා විෂය පථය එක්සත් ජාතීන්ගේ 1325වැනි ආරක්ෂක මණ්ඩල යෝජනාවේ කාන්තාව, සාමය හා ආරක්ෂාව පිළිබඳ න්‍යාය පත්‍රය යටතේ එය වැදගත් සහ අත්‍යවශ්‍ය ලෙස අවධාරණයෙන් දක්වා ඇති මට්ටමට වඩා බෙහෙවින් අඩු ය. මෙම විශේෂිත කාරණා කාන්තාව, සාමය හා ආරක්ෂාව පිළිබඳ වර්තමාන ජාතික ක්‍රියාකාරී සැලැස්මට අන්තර්ගත කර ඇත.

මීට අමතරව මානව හිමිකම් ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලැස්මෙහි නියාමනයේ සහ තක්සේරුවේ දුර්වලතා ද පවතී. මෙම ජාතික ක්‍රියාකාරී සැලැස්මෙහි සඳහන් බොහෝ අභිලාෂයන් සාක්ෂාත් කර ගැනීමට හෝ මුළුමනින් සාක්ෂාත් කර ගැනීමට නොහැකි වීමට එය බලපා ඇත. නිමැවුම්, ප්‍රතිඵල සහ සමස්ත අරමුණු මැන බැලීම සඳහා ප්‍රබල නිරීක්ෂණ හා ඇගයීම් රාමුවක් යොදා ගැනීම මගින් වර්තමාන ජාතික ක්‍රියාකාරී සැලැස්ම මෙම දුර්වලතාවට පිළියම් යෙදීමට උත්සාහ කර ඇත. මෙවැනි නියාමන සහ තක්සේරු සැලසුමක් යොදා ගැනීම ඔස්සේ කාන්තාව, සාමය සහ ආරක්ෂාව පිළිබඳ වර්තමාන ජාතික ක්‍රියාකාරී සැලැස්ම එය ක්‍රියාත්මක කිරීමෙන් අනාවරණ කරගන්නා යථාර්ථයේ ආලෝකය ලබමින් දිගින් දිගටම ශක්තිමත් කිරීම අපේක්ෂිතය.

## 3. කාන්තා ගෘහමූලික කුටුම්බ පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම

මෙම ක්‍රියාකාරී සැලැස්ම විවිධ ධනාත්මක අංගවලින් සමන්විත වන නමුත් තවම සම්පාදනය කොට හෝ ක්‍රියාත්මක කර නැත. මේ වන විට මතු කර ඇති කාරණා ඇතුළත් කර සංශෝධනය කිරීමෙන් පසුව කාන්තා ගෘහමූලික කුටුම්බ පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කළ යුතු යැයි කාන්තාව, සාමය හා ආරක්ෂාව පිළිබඳ මෙම ජාතික ක්‍රියාකාරී සැලැස්ම තුළ යෝජනා කෙරෙන්නේ එබැවිනි.

## 4. ශ්‍රී ලංකාවේ ළමයින් සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලැස්ම 2016-2020

මෙම ජාතික ක්‍රියාකාරී සැලැස්ම ද කෙටුම්පත් අදියරෙහි පවතී. ළමයින් පිළිබඳ ක්‍රියාත්මක ජාතික ක්‍රියාකාරී සැලැස්මක් නොමැති වීම හේතුවෙන් නිර්මාණය වී තිබෙන හිඩැස පිරවීම සඳහා කාන්තාව, සාමය හා ආරක්ෂාව පිළිබඳ දෘෂ්ටි කෝණයකින් ගැහැනු ළමයින් මුහුණ දෙන ගැටලු සලකා බැලීම වර්තමාන ජාතික ක්‍රියාකාරී සැලැස්ම ඔස්සේ ආමන්ත්‍රණය වේ.

## 5. විවෘත රාජ්‍ය හවුල්කාරිත්වය: ශ්‍රී ලංකාවේ 2වන ජාතික ක්‍රියාකාරී සැලැස්ම 2019-2021

විවෘත රාජ්‍ය හවුල්කාරිත්වය පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම (OGP) මැනවින් සකස් කරන ලද ජාතික ක්‍රියාකාරී සැලසුම්වලින් එකක් ලෙස සැලකිය හැකි ය. මෙම ජාතික ක්‍රියාකාරී සැලැස්ම යටතේ ආවරණ වන කරුණු හතර නම්:

- විනිවිදභාවය
- වගවීම
- මහජන සහභාගිත්වය
- විවෘතභාවය හා වගවීම සඳහා තාක්ෂණය හා නවෝත්පාදනය

විවෘත රාජ්‍ය හවුල්කාරිත්වය යටතේ ආවරණය වන කාන්තාව, සාමය හා ආරක්ෂාවට අදාළ පියවර කාන්තාව, සාමය හා ආරක්ෂාව පිළිබඳ මෙම ජාතික ක්‍රියාකාරී සැලැස්ම තුළ නැවත දක්වා නැත. කෙසේ වුව දල විවෘත රාජ්‍ය හවුල්කාරිත්වය පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්මේ විෂය පථය හා පරිමාණය විශේෂිත එකක් බව සහ කාන්තාව, සාමය හා ආරක්ෂාව පිළිබඳ න්‍යාය පත්‍රය ආවරණය කිරීම සඳහා තරම් පුළුල් නොවන බව සඳහන් කළ යුතු ය.

විවෘත රාජ්‍ය හවුල්කාරිත්වය පිළිබඳ මෙම ජාතික ක්‍රියාකාරී සැලැස්මේ අරමුණ වන්නේ රජය සහ සිවිල් සමාජය සම්බන්ධීකරණය කිරීමේ ආකෘතියක් නිර්මාණය කිරීම යි. ක්‍රියාත්මක කිරීමේදී රජයට සහාය වීම සඳහා එම ආකෘතියම මෙම කාන්තාව, සාමය හා ආරක්ෂාව පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර ඇත. මෙම කාන්තාව සාමය සහ ආරක්ෂාව පිළිබඳව ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාවේ යෙදවීමේ මූලික වගකීම ශ්‍රී ලංකා රජය විසින් දරන අතර අවශ්‍ය වන පරිදි ජාතික ක්‍රියාකාරී සැලසුම මගින් හඳුනාගෙන ඇති ගැටලු පිළිබඳව පුළුල් අත්දැකීම් සහිත සිවිල් සමාජ සංවිධානවලින් විශේෂඥ උපදෙස්, සහාය සහ වෙනත් උපකාර ලබා ගැනීම සිදු වනු ඇත.

විවෘත රාජ්‍ය හවුල්කාරිත්වය පිළිබඳ මෙම ජාතික ක්‍රියාකාරී සැලැස්ම තුළ සඳහන් වන විවිධ ක්‍රියාකාරකම් ක්‍රියාවේ යෙදවීමට වගකීම් දරන ඒ ඒ නිලධාරියාගේ නම් සඳහන් ව ඇත. කෙසේ වුවද කාන්තාව, සාමය සහ ආරක්ෂාව පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම කෙටුම්පත් කරන අදියරේදී වගකීම පුද්ගලයෙකුට ලබා දීම වෙනුවට ආයතනගත වීම හා තනතුරක් වෙත පවරා දීම විය යුතු බව හඳුනාගන්නා ලද අතරල එහි අරමුණ වූයේ පුද්ගලයන් තනතුරුවලින් ඉවත් වීම ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාවේ යෙදවීමට බාධාවක් වීමට ඇති ඉඩකඩ අහුරාලීමයි.

## 6. ශ්‍රී ලංකාවේ අල්ලස හා දූෂණය පිටු දැකීමේ ජාතික ක්‍රියාකාරී සැලැස්ම 2019-2023

මෙය ශ්‍රී ලංකාවේ අල්ලස හා දූෂණයට එරෙහිව සටන් කිරීම ඉලක්ක කර ගත් සාමාන්‍ය ජාතික ක්‍රියාකාරී සැලැස්මක් වන අතර, ලිංගික හිංසනය අල්ලස් ලබා ගැනීමේ එක්තරා ආකාරයක් විය හැකි බව ඊට ඇතුළත් කර නැත. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව මගින් 2019දී පළ කරන ලද අත් පොතක යෝජිත නීති සම්පාදන සංශෝධන සඳහා ප්‍රතිපත්තිමය යෝජනා යම් ප්‍රමාණයක් ඉදිරිපත් කර ඇත. එහි යෝජනා කර ඇත්තේ ලිංගික අල්ලස් ලබා ගැනීම එක්තරා ආකාරයක 'තුටු පඬුරක්' ලබා ගැනීමක් ලෙස සැලකිය යුතු බව අල්ලස් පනතට ඇතුළත් කළ යුතු බවයි. කෙසේ වුවත්, මෙය දැනට ක්‍රියාවේ යෙදවීම සඳහා නීති සම්පාදනය වී නොමැති අතර ජාතික ක්‍රියාකාරී සැලැස්ම මගින් මේ පිළිබඳව මැදිහත්වීමක් කිරීමට යෝජනා කර ඇත.

## ජාතික ක්‍රියාකාරී සැලැස්ම සැකසීමේ ක්‍රියාවලිය සහ උපදේශනවලින් සොයා ගත් කරුණු

කාන්තාව, සාමය සහ ආරක්ෂාව පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම ඵලදායී ලෙස ක්‍රියාවේ යෙදවීම සඳහා අදාළ සියලු අමාත්‍යාංශවල දායකත්වය හා සහාය සමග ඒවායේ නිලධාරීන්ගේ උනන්දුව ඇති කිරීමද අත්‍යවශ්‍ය බව කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය මුල් අදියරේදී ම හඳුනා ගන්නා ලදී. ඒ අනුව උපදේශක කණ්ඩායම 2019 සැප්තැම්බර් 16වෙනි දින කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ ලේකම් (ඒ වන විට) දර්ශනා සේනානායක මහත්මිය සමග එක්ව ප්‍රධාන අමාත්‍යාංශවල නියෝජිතයන් හමු වූහ.

මෙම සංවේදීකරණ වැඩසටහනේ දී කාන්තාව, සාමය හා ආරක්ෂාව පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම සැකසීමට අදාළ සන්දර්භය පිළිබඳව තොරතුරු සහ එයින් ආවරණය කිරීම බලාපොරොත්තු වන විෂය පථය මෙන්ම ජාතික ක්‍රියාකාරී සැලැස්ම සැකසීම සඳහා තෝරා ගත් ක්‍රමය ද මෙම පාර්ශ්වකරුවන් වෙත ඉදිරිපත් කරන ලදී. මෙය මනා පිළිගැනීමකට ලක් වූ අතර කාන්තාව, සාමය හා ආරක්ෂාව පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමට සහාය වීමෙහි ලා අදාළ අනෙකුත් අමාත්‍යාංශවල උනන්දුව හා සහාය ගොනු කර ගැනීමට කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය සමත් විය.

කාන්තාව, සාමය සහ ආරක්ෂාව පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම පිළිබඳ හිමිකාරිත්වය කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශයෙන් ඔබ්බට යමින් වෙනත් අමාත්‍යාංශ, රාජ්‍ය ආයතන, රාජ්‍ය නොවන ආයතන සහ ශ්‍රී ලංකාවේ මහජනතාව වෙත හිමි විය යුතු බව ආරම්භයේ සිටම අවධාරණය වූ කරුණක් විය. ජාතික ක්‍රියාකාරී සැලැස්ම මගින් ශ්‍රී ලාංකීය කාන්තාවන්ගේ සැබෑ ජන ජීවිතයල විශේෂයෙන්ම ගැටුම් මගින් හානියට පත්වූ පිරිසට අවධානය යොමු කරමින් පිළිබිඹු කළ යුතු බවද අවධාරණය විය. මෙම අරමුණ සපුරා ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ පළාත් නවය (09) තුළ ම පළාත් උපදේශනාත්මක සංවාද සංවිධානය කරනු ලැබිණ. මෙම පළාත් උපදේශනාත්මක සංවාද සංවිධානය කරන ලද්දේ ශ්‍රී ලංකාවේ පරිපාලන දිස්ත්‍රික්ක විසිපහේ ම (25) පාර්ශ්වකරුවන් හමු වීමට අවස්ථාව ලැබෙන අයුරිනි.[14]

ඒ අනුව පළාත් උපදේශනාත්මක සංවාදවල දී පහත දැක්වෙන ප්‍රධාන පාර්ශ්වකරුවන් හමු විය:

1. ග්‍රාමීය, ප්‍රාදේශීය, දිස්ත්‍රික්ක හා පළාත් මට්ටම්වල සේවය කරන රාජ්‍ය නිලධාරීන්
2. සිවිල් සමාජ සංවිධාන (Civil Society Organisations-CSOs), රාජ්‍ය නොවන සංවිධාන (Non Government Organisations-NGOs), ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන (International Non Government Organisations-INGOs), ප්‍රජා පාදක සංවිධාන (Community Based Organisations- CBOs) නියෝජිතයන්
3. ගැටුමෙහි වින්දිතයන්ව සිට ඉන් මිදුණු පුද්ගලයන්, යුධ වැන්දඹුවන්, කාන්තා ගෘහමූලික කුටුම්භවල කාන්තාවන්, ආබාධ සහිත කාන්තාවන්,

14 ජාතික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම සඳහා සිදු කරන ලද උපදේශනවල පෙළ ගැස්ම සඳහා ඇමුණුම 1 බලන්න.

ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ වින්දිතයන් වී ඉන් මිදුණු පුද්ගලයන්, එල්ටීටීඊයේ හිටපු සටන්කරුවන්, වතු අංශය හෝ ධීවර ක්ෂේත්‍රය තුළ සේවය කරන කාන්තාවන්, ආබාධ සහිත සහකරුවන් සහ/හෝ ළමයින් රැක බලා ගන්නා කාන්තාවන්.

පළාත් උපදේශනාත්මක සංවාද සංවිධානය කිරීමේ දී යොදා ගත් ක්‍රමවේදයේ ඉලක්කය වූයේ ශ්‍රී ලංකා රජය සහ සිවිල් සමාජ සංවිධාන අතර සම්බන්ධීකරණය සාක්ෂාත් කර ගැනීම යි. කෙසේ වුව ද, පැහැදිලිව සහ වෙන් වෙන්ව දත්ත රැස් කිරීම තහවුරු කිරීම සඳහා රාජ්‍ය නිලධාරීන් සහ සිවිල් සමාජ සංවිධානවල නියෝජිතයන් උදෙසා වෙන වෙනම උපදේශන සිදු කරන ලදී. එකී කණ්ඩායම් විසින් මතු කරන ලද ගැටලු උපදේශනවල දී එකිනෙකා සමග බෙදාහදා ගන්නා ලද අතර, එහි අරමුණ වූයේ ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ දී රජය සමග සහයෝගයෙන් කටයුතු කිරීම සඳහා සිවිල් සමාජ සංවිධාන සහ රාජ්‍ය නොවන සංවිධාන අතර පොදු එකඟත්වයක් ඇති කිරීම යි. කාන්තාව, සාමය සහ ආරක්ෂාව පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම මගින් හඳුනාගෙන ඇති ගැටලුවලින් බොහොමයක් හා ඒවා ආමන්ත්‍රණය කිරීමට යෝජිත ක්‍රියාකාරකම් ප්‍රාදේශීය උපදේශන සැසිවලදී ඉදිරිපත් කරන ලද වටිනා අදහස් ඇසුරින් ගොඩ නඟන ලදී. ඇතැම් සන්දර්භවලදී දී කාන්තාව, සාමය හා ආරක්ෂාවේ තෝරා ගත් විවිධ පැතිකඩ සම්බන්ධයෙන් කටයුතු කිරීම පිළිබඳ අත්දැකීම් සහිත විශේෂිත සංවිධානවලින් ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා රජය සමග එක්ව කටයුතු කිරීමට ඇති කැමැත්ත මත වැඩි දුර උපදේශන සඳහා සම්බන්ධ කරගත් බොහෝ අවස්ථාවල ඔවුන්ගෙන් ලැබුණු ප්‍රතිචාර සතුටුදායක විය.

රාජ්‍ය ආයතන අතර ඵලදායක සහයෝගිතාවක් ඇති කිරීම සහ අන්තර් ආයතනික සම්බන්ධීකරණය වැඩි දියුණු කිරීම වැනි පොදු අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා රාජ්‍ය ආයතන අතර ඵලදායක සහභාගිත්වයක් ඇති වීමට පමණක් නොව, ආයතන කිහිපයක් එක ම කාර්යය ඉටු කරන අවස්ථා අඩු වීමට ද හේතු වන බව උපදේශනවල දී ප්‍රකාශ විය. එමගින් විවිධ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට දරන පිරිවැය අඩු වීමද සිදු වේ. කාන්තාව, සාමය හා ආරක්ෂාව පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේ දී විවිධ ජනයාගේ අදහස් සලකා බැලීම සඳහා ශ්‍රී ලංකා රජය දරා ඇති පරිශ්‍රමය සහභාගී වූවන්ගේ ඇගයීමට ලක් විය. උපදේශනවල දී දැනට පවතින මග හැරවිය යුතු අඩුපාඩුකම් ද අනාවරණ වූ අතර, එම අඩුපාඩුකම් සඳහා ගත හැකි පියවර ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ හැකි කර්තව්‍යයන් ලෙස මෙම ජාතික ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කරනු ලැබ ඇත.

ක්‍රියාකාරී සැලැස්මේ සමස්ත ක්‍රියාකාරකම් ජාතික ප්‍රතිපත්ති ප්‍රකාශය වන 'සෞභාග්‍යයේ දැක්ම' සමග සමපාත වන අයුරින් සකස් කෙරුණි. ඒ ඔස්සේ කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය අදහස් කරන්නේ ක්‍රියාකාරී රාමුවේ ක්‍රියාකාරකම් ශ්‍රී ලංකා රජයේ පුළුල් ප්‍රතිපත්ති රාමුව සමඟ අනුගත කරවීමය.

## ක්‍රමෝපායාත්මක අවධානය සහ තේමාත්මක ප්‍රමුඛතා

ශ්‍රී ලංකාවල දිග් ගැසුණු සන්නද්ධ ගැටුමක් මෙන්ම අභ්‍යන්තර ගැටුම්, කැරලි, කෝලාහල, ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වය සහ ත්‍රස්තවාදී ප්‍රහාර අත්විඳ ඇත. එම නිසා ජාතික ආරක්ෂාව, භෞමික අඛණ්ඩතාව, ස්වෛරීභාවය සහ පුද්ගලයාගේ ස්වාධීනත්වය පිළිබඳ තේමා ශ්‍රී ලාංකික කතිකාව තුළ කැපී පෙනෙන ලක්ෂණ බවට පත් වී ඇත. පාස්කු ඉරිදා ප්‍රහාරවලින් පසුව එම කතිකාවත්වල වර්ධනයක් සිදු වී ඇත. එබැවින් මෙම කතිකා තුළ කාන්තාවන්ගේ ගැටලුවලට ලැබෙන තැන කුමක් දැයි සොයා දැන ගැනීම අත්‍යවශ්‍ය වේ.

ජාතික ආරක්ෂාවට එල්ල වන තර්ජන නිසා ඇති වන අස්ථාවරභාවය හේතුවෙන් කාන්තාවන් හිංසනයට හා හිරිහැරයට ගොදුරු විය හැකි තත්ත්වයට පත් වීම වැළැක්වීමේ ප්‍රධාන පියවරක් වන්නේ කාන්තාවන්ගේ සහභාගිත්වය සහ කාන්තාවන් බල ගැන්වීම යි. මෑත කාලීන ත්‍රස්තවාදී ප්‍රහාරවලින් පසුව සිදු කරනු ලබන ආරක්ෂක පරීක්ෂාව නිසා ද කාන්තාවන්ට වෙනස් කොට සැලකීම් සහ විසමානුපාතික බලපෑමක් ඇති විය හැකි යැයි පළාත් උපදේශනාත්මක සංවාදවල දී සමහර පාර්ශ්වකරුවෝ තර්ක කළහ.

අවධාරණය කරන ලද තවත් ප්‍රධාන ගැටලුවක් වූයේ සාමය හා ආරක්ෂාව සම්බන්ධ කාරණාවල දී කාන්තාවන්ගේ ඵලදායක සහභාගිත්වයට පහසුකම් සපයන ක්‍රියාවලියක් නොමැතිකම යි. පළාත් පාලන, පළාත් සහ ජාතික මට්ටම්වල දී කාන්තාවන් අවම වශයෙන් සම්බන්ධ වීමේ අඩුපාඩුව පමණක් නොව එම අඩුපාඩුකම් සමාජයේ ප්‍රජාමූල මට්ටම් තුළ ගැඹුරින් මුල් බැස ගෙන ඇති බව ද පැහැදිලි විය. ස්ත්‍රී පුරුෂ සමාජභාවය කාන්තාව, සාමය හා ආරක්ෂාව පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේ දී සලකා බලන ලද ප්‍රධාන සාධකයක් වුවත් කාන්තාව, සාමය හා ආරක්ෂාව වෙනුවෙන් කාන්තාවන්ගේ සම්බන්ධ වීමට බලපාන වෙනත් සාධක ද සලකා බලන ලදී. උදාහරණයක් ලෙසල වයස, සමාජ-ආර්ථික පසුබිම, ජනවාර්ගික/වාර්ගික /ආගමික අනුබද්ධතා, ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අනන්‍යතාව, ලිංගික දිශානතිය, භූගෝලීය පිහිටීම, පවුලේ සහාය හෝ පවුලේ ලැබීම්, පවුලේ සහාය නොමැතිකම, අධ්‍යාපන මට්ටම සහ ආබාධ සහිත බව කාන්තාවට සාමය හා ආරක්ෂාව පිළිබඳ කාරණාවලට ඵලදායක ලෙස සම්බන්ධ වීමට ඇති හැකියාවට බලපෑමක් කරන බවට හඳුනා ගත් අනෙකුත් ප්‍රධාන සාධකවලින් සමහරකි.

ශ්‍රී ලංකා රජය අනෙකුත් ජාතික ක්‍රියාකාරී සැලසුම් සහ ප්‍රතිපත්ති ආශ්‍රිත අඩුපාඩුකම් ද හඳුනා ගෙන ඇති අතරල ජාතික ක්‍රියාකාරී සැලැස්ම තුළ දී හඳුනා ගත් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු බලධාරීන් හඳුනා ගැනීම මගින් කාන්තාව, සාමය හා ආරක්ෂාව පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම හරහා ඒවා විසඳීමට තීරණය කර ඇත. වගකිව යුතු බලධාරීන් හඳුනා ගැනීම සිදු කර ඇත්තේ එම බලධාරීන්ගේ කාර්යයන් දැනටමත් නියාමනය කරන රැකියා විස්තර සහ නියම හා කොන්දේසිවලට අනුකූලව වන අතරල එසේ කර ඇත්තේ නව බඳවා ගැනීම් සිදු කිරීමේ සහ/හෝ නිලධාරීන්ට අධික ලෙස රාජකාරී පැටවීමේ අවශ්‍යතාව වැළැක්වීම සඳහා ය. සාමය, සංහිඳියාව සහ ගැටුම් වැළැක්වීම සඳහා වන යාන්ත්‍රණවලට කාන්තාවන් ඇතුළත් කර නොගැනීම හෝ කාන්තාවන්ගේ ඵලදායක සහභාගිත්වයක් නොමැතිකම එවැනි ක්‍රියාවලියක් නීත්‍යානුකූලභාවය නැති වීමට හේතු වන අතර ව්‍යුහයන් දුර්වල කරයි.

එබැවින් ශ්‍රී ලංකා රජයේ අදහස වන්නේ කාන්තාවන්ගේ දේශපාලනික සහභාගිත්වය අත්‍යවශ්‍ය වන අතර, කාන්තාවන්ගේ බලපෑම් හැකියාව සාමය හා ආරක්ෂාව පිළිබඳ ප්‍රතිපත්තිවලට සහ රාජ්‍යයේ ක්‍රමෝපායවලට අනිවාර්යයෙන් ම ඇතුළත් කළ යුතු බව යි.

## කාන්තාව, සාමය හා ආරක්ෂාව පිළිබඳ කැපවීම්වල අදාළත්වය

එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා 1325හි හැඳින්වීම මගින්, ගැටුම් අතරතුර දී සහ ගැටුම්වලින් පසුව කාන්තාවන් හා ගැහැනු ළමයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන ජාත්‍යන්තර මානුෂීය සහ මානව අයිතිවාසිකම් නීතිය පූර්ණ ලෙස ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවක් පවතින බව නැවත සහතික කරයි. එපමණක් නොව, කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කම් කිරීම් තුරන් කිරීමේ සම්මුතියේ 2වෙනි වගන්තිය මගින් රාජ්‍ය පාර්ශ්වය විසින් අනෙකුත් දෑ අතර පහත දැක්වෙන පියවර ගත යුතු යැයි නියම කරයි:

- පිරිමින් හා කාන්තාවන්ගේ සමානාත්මතාව පිළිබඳ මූලධර්මය මූර්තිමත් කිරීම
- නීතිමය සහ වෙනත් අදාළ ක්‍රියාමාර්ග මගින් සමානාත්මතාව ප්‍රායෝගිකවශයෙන් සාක්ෂාත් කර ගැනෙන බව සහතික කිරීම
- කාන්තාවන්ට එරෙහි සියලු වෙනස් කොට සැලකීම් තහනම් කරමින් අදාළ නීතිමය සහ වෙනත් පියවර ගැනීම
- කාන්තාවන්ට වෙනස් කොට සැලකීමට ඉවහල් වන දැනට පවත්නා නීති, රෙගුලාසි, චාරිත්‍ර වාරිත්‍ර සහ භාවිතය වෙනස් කිරීම හෝ අහෝසි කිරීම සඳහා නීති සම්පාදනය ඇතුළු අදාළ සියලු සුදුසු පියවර ගැනීම

එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා 1325හි ''සන්නද්ධ ගැටුම්වලින් කාන්තාවන් හා ගැහැනු ළමයින්ට ඇති වන බලපෑම අවබෝධ කර ගැනීම මගින් සහ ඔවුන්ගේ ආරක්ෂාව සහ සාම ක්‍රියාවලිය තුළ ඔවුන්ගේ පූර්ණ සහභාගිත්වය සහතික කිරීම සඳහා ඵලදායක ආයතනික පියවර ගැනීම මගින් ජාත්‍යන්තර සාමය හා ආරක්ෂාව පවත්වා ගෙන යෑම හා ප්‍රවර්ධනය කිරීම සඳහා සැලකිය යුතු ලෙස දායක විය හැකි" බව ද හඳුනා ගනියි. එපමණක් නොව ආයුධ සන්නද්ධ ගැටුම්වලින් කාන්තාවන් හා ළමයින්ට ඇති වන බලපෑම පිළිබඳ දත්ත රැස් කිරීමේ අවශ්‍යතාවක් පවතින බව ද යෝජනාව ප්‍රකාශ කරයි. ශ්‍රී ලංකා රජය කාන්තාව, සාමය හා ආරක්ෂාව පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්මක් සම්පාදනය කිරීමට ප්‍රයත්න දරා ඇත්තේ පිළිගැනීමට ලක්ව ඇති මෙම පුළුල් රාමු පදනම් කර ගනිමිනි. කෙසේ වුව දල කාන්තාව, සාමය හා ආරක්ෂාවේ විෂය පථය ශ්‍රී ලංකාව විසින් අත්දකින ලද සන්නද්ධ ගැටුමට හෝ වෙනත් ගැටුම් සන්දර්භවලට පමණක් සීමා නොකළ යුතු බවටත්, කාන්තාවන්ගේ සාමය හා ආරක්ෂාවට තර්ජනයක් වන අනෙකුත් බොහෝ කාරණා සැලකිල්ලට ගනිමින් ජාතික ක්‍රියාකාරී සැලැස්ම තුළ කාන්තාව, සාමය හා ආරක්ෂාව පිළිබඳ න්‍යාය පත්‍රය හැකි තාක් පුළුල්ව ඇතුළත් කිරීමට හැකි සෑම ප්‍රයත්නයක් ම දැරිය යුතු බවටත් උපදේශන ක්‍රියාවලියේ දී තීරණය කෙරිණ.

එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා 1325හි හැඳින්වීම මගින්, සාමය ගොඩනැගීම, ගැටුම් වැළැක්වීම සහ ගැටුම් නිරාකරණය සඳහා කාන්තාවන් සම්බන්ධ වීමේ වැදගත්කම ද අවධාරණය කරයි.

ගැටුම් වැළැක්වීම හා නිරාකරණය සහ සාමය ගොඩනැගීම තුළ කාන්තාවන් ඉටු කරන වැදගත් කාර්යභාරය යෝජනාව විසින් යළි තහවුරු කෙරෙන බව ප්‍රකාශ කරන එයල සාමය හා ආරක්ෂාව ප්‍රවර්ධනය කිරීම සඳහා දරන සියලු පරිශ්‍රමයන් තුළ ඔවුන්ගේ සමාන සහභාගිත්වයේ සහ පූර්ණ සම්බන්ධ වීමේ වැදගත්කමත්, ගැටුම් වැළැක්වීම හා නිරාකරණය සම්බන්ධයෙන් තීරණ ගැනීමේ දී ඔවුන් ඉටු කරන කාර්යභාරය වර්ධනය කිරීමේ අවශ්‍යතාවත් අවධාරණය කරයි.

එපමණක් නොව, සන්නද්ධ ගැටුම්වලින් කාන්තාවන් හා ගැහැනු ළමයින්ට ඇති වන බලපෑම අවබෝධ කර ගැනීම මගින් සහ ඔවුන්ගේ ආරක්ෂාව සහ සාම ක්‍රියාවලිය තුළ ඔවුන්ගේ පූර්ණ සහභාගිත්වය සහතික කිරීම මගින් ජාත්‍යන්තර සාමය හා ආරක්ෂාව පවත්වා ගෙන යැම හා ප්‍රවර්ධනය කිරීම සඳහා සැලකිය යුතු ලෙස දායක විය හැකි බව ද යෝජනාව විසින් හඳුනා ගනු ලැබේ. මෙම හැඳින්වීම් විධිවිධානය ජාත්‍යන්තර සාමය හා ආරක්ෂාව ප්‍රවර්ධනය කිරීම හා පවත්වා ගෙන යැම සඳහා වූ එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ රෙගුලාසිවලට අනුව කෙටුම්පත් කර තිබෙන අතර, අතීත ප්‍රචණ්ඩත්ව සම්බන්ධයෙන් වගවීම සහතික කිරීමටත්, දරුණු ලෙස බෙදී ඇති සමාජයක් සංහිඳියාව කරා ගෙන යැමටත් උත්සාහ කරන බැවින්, ශ්‍රී ලංකාවේ සාමය සහ ප්‍රතිසන්ධාන ක්‍රියාවලියට කාන්තාවන්ගේ පූර්ණ සහභාගිත්වය සහතික කිරීමේ අරමුණින් ජාතික ක්‍රියාකාරී සැලැස්මෙහි මෙම කොටස ක්‍රියාත්මක කිරීමට රජය අදහස් කරයි.

අවතැන් වීම සහ අනාථයකු බවට පත් වීම නිසා ප්‍රතිවිපාකමය බලපෑම් ඇති වී තිබෙන බව සහ මෙම සාධක නිසා දීර්ඝ කාලීන සාමය හා සංහිඳියාවට බලපෑම් ඇති විය හැකි බව ද මෙම යෝජනාව මගින් හඳුනා ගනු ලැබේ. ශ්‍රී ලංකාව සන්නද්ධ ගැටුමේ සන්දර්භය තුළ දී මෙන් ම විවිධ ස්වාභාවික ආපදා අතරතුර දී ද සමහර ජන කොටස් අභ්‍යන්තරව අවතැන් වීම දිගින් දිගට ම අත්දුටුවේ ය. මෙය මෙම ජාතික ක්‍රියාකාරී සැලැස්ම තුළ විසඳුම් ලබා දීමට උත්සාහ දරා ඇති තවත් පැතිකඩකි. එමෙන් ම, යෝජනාවේ 12වෙනි වගන්තිය සරණාගත කඳවුරු සහ ජනාවාසවල සිවිල් සහ මානවාදී සුබසාධන කටයුතුවල නියුතු පාර්ශ්වයන්ට ගරු කරන ලෙස සහ ඒවා සැලසුම් කිරීමේ දී ද ඇතුළුව, කාන්තාවන් හා ගැහැනු ළමයින්ගේ විශේෂ අවශ්‍යතා පිළිබඳව සැලකිලිමත් වන ලෙස ද රාජ්‍ය පාර්ශ්වයන්ගෙන් ඉල්ලා සිටී. තවද, මෙම වගන්තිය යටතේ ශ්‍රී ලංකාවට ඇති කැපවීම් දැනට ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මකව පවත්නා සරණාගත කඳවුරුවලට අදාළ කර ගත හැකි ය. එමෙන්ම, විවිධ කාල පරාස තුළ අභ්‍යන්තර අවතැන් කඳවුරුවල ජීවත් වූ පුද්ගලයන් සම්බන්ධයෙන් රජයට පැවති වගකීම් ගැටුම් අවසන් වීමෙන් පසුව ද අඛණ්ඩව අදාළ වේ. එම නිසා එක්සත් ජාතීන්ගේ ආරක්ෂක

මණ්ඩල යෝජනා 1325හි මෙම පුළුල් අංග කාන්තාව, සාමය හා ආරක්ෂාව පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම යටතේ හඳුනා ගෙන තිබෙන බැඳීම්වලට ද අඛණ්ඩව අදාළ වේ.

සන්නද්ධ ගැටුම් පැවති කාලය තුළද විවිධ ස්වාභාවික විපත්වලදී, ශ්‍රී ලංකාව එහි ජන කොටස් අභ්‍යන්තර අවතැන් වීමේ තත්ත්වය අත්දැක තිබේ. විශේෂයෙන්ම කාන්තාව, සාමය හා ආරක්ෂාව න්‍යාය පත්‍රයට අදාළ පුළුල් විවාද ඔස්සේ කාන්තාව, සාමය හා ආරක්ෂාව සහ ස්වාභාවික විපත් අතර ඇති ඒකාග්‍ර සම්බන්ධය හඳුනා ගන්නා බැවින්, මෙය මෙම ජාතික ක්‍රියාකාරී සැලැස්ම තුළින් ආමන්ත්‍රණය කිරීමට උත්සාහ දරා ඇති තවත් අංගයකි. නිදසුනක් වශයෙන්, 2015දී නිකුත් කරන ලද එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා සම්බන්ධ ගෝලීය අධ්‍යයනයෙහි මෙසේ සඳහන් වේ.

**"වැඩි වශයෙන්, හදිසි අවස්ථාවලට සහ මානුෂීය අර්බුදවලට තුඩු දෙන ස්වාභාවික විපත්වලට, ගැටුම් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අසමානතාව සමඟ සංකීර්ණ සම්බන්ධතාවක් ඇත. තොරතුරු සහ මූලාශ්‍ර වෙත ප්‍රවේශ වීමේ නොහැකියාව, ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ මුල් බැසගත් ආකෘති සහ අසමානතා සහ සංස්කෘතික බාධක, කාන්තාවන් සහ ගැහැනු ළමයින් ස්වාභාවික විපත්වලදී, විශේෂයෙන්ම ගැටුම්වලදී බලපෑමට ලක්වන තත්ත්වයට ගොදුරු කරයි. උදාහරණයක් වශයෙන්, 2004දී ගැටුමෙන් බලපෑමට ලක්වූ ශ්‍රී ලංකාවට බලපෑ සුනාමියට ගොදුරු වීමෙන්, ගැටුම්වලින් අවතැන් වූ කාන්තාවන්ගෙන් පහෙන් එකක් මරුමුවට පත් වූ අතර, එය අවතැන් වූ පිරිමින්ගේ මරණ අනුපාතය මෙන් දෙගුණයකටත් වැඩිය."**

(UN Women මගින් කරන ලද, 'ගැටුම් වැළැක්වීම, යුක්තිය පරිවර්තනය කිරීම, සාමය සුරක්ෂිත කිරීම: එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ යෝජනා 1325 ක්‍රියාත්මක කිරීම පිළිබඳ ගෝලීය අධ්‍යයනයක්' (2015) පිටුව 86). මෙම සම්බන්ධය සැලකිල්ලට ගනිමින්, ජාතික ක්‍රියාකාරී සැලැස්ම ස්වාභාවික විපත්වලින් පීඩාවට පත්වන කාන්තාවන් සහ ගැහැනු ළමුන් සම්බන්ධයෙන් මැදිහත් වීමටද අපේක්ෂා කරයි.

එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා 1325හි හැඳින්වීම මගින් සන්නද්ධ ගැටුමෙන් කාන්තාවන් හා ගැහැනු ළමයින්ට ඇති වූ බලපෑම පිළිබඳ දත්ත ඒකාබද්ධ කිරීමේ අවශ්‍යතාවක් පවතින බව ද ප්‍රකාශ කරයි. එම නිසා, ශ්‍රී ලංකා රජයේ අදහස වන්නේ මෙම ජාතික ක්‍රියාකාරී සැලැස්ම මගින් සටන් හේතුවෙන් වැන්දඹුභාවයට පත් කාන්තාවන්ට, පවුලේ අයට පවුල් වශයෙන් හෝ ආයතනික වශයෙන් විශේෂ අවධානයක් යොමු කළ යුතු බවයි. සාමය හා ආරක්ෂාව පිළිබඳ කටයුතුවල දී කාන්තාවන්ගේ පූර්ණ ආරක්ෂාව හා පූර්ණ සහභාගිත්වය සහතික කිරීම මගින් සාක්ෂාත් කර ගත හැකි සමස්ත බලපෑම හඳුනා ගනිමින් ගැටුමෙන් සෘජු ලෙස බලපෑමට ලක්ව නැති කාන්තා ගෘහමූලික කුටුම්බ ද ආවරණය කිරීමට හැකි වන පරිදි ජාතික ක්‍රියාකාරී සැලැස්මේ විෂය පථය තව දුරටත් පුළුල් කරනු ලැබිණි. එබැවින්, මෙම ජාතික ක්‍රියාකාරී සැලැස්මෙහි ප්‍රධාන ඉලක්කය වන්නේ, සාමය සහ ආරක්ෂාව සම්බන්ධ කාරණාවලදී කාන්තාවන්ගේ පූර්ණ ආරක්ෂාව සහ සහභාගිත්වය සහතික කිරීමයි.

කාන්තාව, සාමය හා ආරක්ෂාව පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම කෙටුම්පත් කිරීමේ අදියරේ දී ඊට පෙර උපදේශනාත්මක සංවාදවල දී සාකච්ඡා කරන ලද අදහස්, දුක් ගැනවිලි හා ගැටලු ඉතා වැදගත් විය. සමාජයේ විවිධ කොටස් හා උපදේශනාත්මක සංවාද සිදු කිරීමේ ක්‍රියාවලිය ශ්‍රී ලාංකික සමාජයේ ප්‍රජාමූල මට්ටම්වලට බලපාන ස්ත්‍රී පුරුෂ සමාජභාවීය ගැටලු ඇතුළත් කිරීමට උපකාරී විය. රජයන් සාමය පවත්වා ගෙන යෑමේ විධිවිධාන සහ වෙනත් ගැටුම් නිරාකරණ ක්‍රමෝපායවලට ස්ත්‍රී පුරුෂ සමාජභාවීය දෘෂ්ටි කෝණ ඒකාබද්ධ කළ යුතු යැයි නියම කරන එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා 1325හි 8-10 වගන්තිවලට මෙය අනුකූල ය. මෙම තීරණාත්මක අවධියේ දී මෙම ගැටලුවලට සෘජුව ප්‍රතිචාර දක්වන කාන්තාව, සාමය හා ආරක්ෂාව පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්මක් සම්මත කර ගැනීම මගින් සිය ජාත්‍යන්තර බැඳීම් සපුරාලීමට අපේක්ෂා කරන බව ශ්‍රී ලංකා රජය ප්‍රකාශ කර සිටී. කාන්තාව, සාමය හා ආරක්ෂාව පිළිබඳ කැපවීම් සකස් කර මෙම ජාතික ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර ඇත්තේ, එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා 1325හි මෙම ප්‍රධාන පැතිකඩවලට අනුකූල වෙමිනි.

## අවධානය යොමු කළ මූලික කරුණු

කාන්තාව, සාමය හා ආරක්ෂාව පිළිබඳ න්‍යාය පත්‍රය ආවරණය වන පරිද්දෙන් මෙම ජාතික ක්‍රියාකාරී සැලැස්ම තුළ ප්‍රධාන කරුණු කිහිපයක් අවධානයට ලක් කර ඇත.

### 1. නීති, ප්‍රතිපත්ති හා ආයතනික ප්‍රතිසංස්කරණ

1325 යෝජනාවේ කාන්තාවල සාමය සහ ආරක්ෂාව පිළිබඳ න්‍යාය පත්‍රය මගින් ද මෙවැනි ප්‍රතිසංස්කරණ දිරිමත් කොට ඇත. පළාත් උපදේශකත්ව සංවාදවලින් ලද සොයාගැනීම්වලට අනුකූලව මෙම තේමාත්මක ප්‍රමුඛතාව යටතේ එන විශේෂ මැදිහත්වීම් යෝජනා වී ඇත. එහි දී ශ්‍රී ලංකා රජය පහත සඳහන් අරමුණු ද ළඟා කර ගැනීමට අපේක්ෂා කරයි.

- රටේ නීති පද්ධතිය ජාත්‍යන්තර නීති සමගඅනුගත වන බව තහවුරු කරමින් යල් පැන ගිය නීති කාර්ය පටිපාටි සහ ආඥා පනත් සංශෝධනය
- අධිකරණ වෙත ගෙන ඒමෙන් තොරව සිවිල් ගැටුම් සමථ මණ්ඩල ඔස්සේ විසඳාලීම සඳහා සමථකරණ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම
- නීතිය බලාත්මක කිරීමේ ක්‍රියාවලි හා යාන්ත්‍රණ පිළිබඳව අදාළ නිලධාරීන්ට පුහුණුව ලබා දීම

කාන්තාව, සාමය සහ ආරක්ෂාව සම්බන්ධයෙන් ජාතික ක්‍රියාකාරී සැලැස්මෙහි දක්වා ඇති ක්‍රියාකාරකම් සහ ඉලක්ක ඔස්සේ කාන්තාවන් සවිබල ගැන්වීම සහතික කර ගැනීම සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවීය දැක්මකින් යුතුව මෙය සකස් කොට ඇත.

### 2. කාන්තාවන් අත්දකින ලද අවතැන් වීමෙහි බලපෑම

අවතැන් වූ කාන්තාවන් මුහුණ දුන් ප්‍රධානතම ගැටලුවලින් එකක් වන්නේ සුදුසු නිවාස හා නවාතැන් පහසුකම් අවම වීම යි. මෙම ජාතික ක්‍රියාකාරී සැලැස්ම නිර්මාණය කිරීමේ දී ජාතික ප්‍රතිපත්ති රාමුවේ ඇති මෙම ගැටලුව ගැඹුරින් සැලකිල්ලට ගත් අතර, අවතැන් වූ කාන්තාවන්ගේ ජීවිත වඩාත් අර්ථවත් කිරීමේ අරමුණින් ඒ හා සම්බන්ධ අනෙක් කාරණා ද එයට එක් කරන ලදී.

තවදුරටත්, සන්නද්ධ ගැටුමෙන් බලපෑමට ලක් වූ පවුල් සඳහා නිවාස සැපයීම ඇතුළුව එම ජනතාවගේ ආර්ථික තත්ත්වය හා ජීවනෝපාය වැඩි දියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා රජය කැප වී සිටියි. 1325 යෝජනාවේ ප්‍රධාන තේමාවක් වන අවතැන් වීම් හේතුවෙන් ඇති වූ බලපෑම් සම්බන්ධයෙන් සුදුසු පියවර ගැනීම ඉලක්ක කරගත් ජාතික ක්‍රියාකාරී සැලැස්මේ ක්‍රියාකාරකම් සහ මැදිහත්වීම් සකස් කිරීම සඳහා මෙම ජාතික ප්‍රතිපත්ති රාමුව මගින් සලකා බැලේ.

### 3. හමුදා හා පොලිස් වැන්දඹුවන්, හිටපු කාන්තා සටන්කාමීන් සහ කාන්තා ගෘහමූලික කුටුම්බ පිළිබඳ විශේෂ අවධානය

ශ්‍රී ලංකා රජය ලාංකිකයන්ට හිමිව ඇති ප්‍රජාතන්ත්‍රවාදී අවකාශයට හානි කිරීමෙන් තොරව, ජාතික ආරක්ෂාව සහතික කිරීමට බැඳී සිටියි. මෙම ප්‍රවේශය තුළ රජය යුද්ධයේ බලපෑමට ඕනෑම ආකාරයකින් ලක් වූ සියල්ලන් හට තම වගකීම ඉටු කිරීමට උත්සාහ කරයි. මෙම පොදු ප්‍රවේශය ඇතුළත කාන්තාව, සාමය හා ආරක්ෂාව පිළිබඳ න්‍යාය පත්‍රයට අදාළව යුධ වැන්දඹුවන්, හිටපු සටන්කාමීන් සහ ගෘහ මූලික කාන්තාවන්ගේ අවශ්‍යතා ආවරණය කෙරේ.

එබැවින් මෙම තේමාත්මක අංශය තුළ, ජාතික ක්‍රියාකාරී සැලැස්ම මගින් යුද වැන්දඹුවන්, හිටපු කාන්තා සොල්දාදුවන් සහ වෙනත් කාන්තා මූලික පවුල් ඒකකවල අවශ්‍යතා සපුරාලීම අරමුණු කර ගනී. හැකි තරම් කාන්තාවන් ගණනකගේ සාමය සහ සුරක්ෂිතභාවය ආරක්ෂා කරමින් ප්‍රතිලාභ ලැබෙන පරිදි ප්‍රතිපත්ති පුළුල් කිරීම අංක 1325 ප්‍රඥප්තියේ අරමුණ වන අතර කාන්තාව, සාමය හා ආරක්ෂාව පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම මෙම අවශ්‍යතාව අවබෝධ කරගෙන සිටී.

## 4. කාන්තාවන්ගේ සුරක්ෂිතභාවය සහ ආරක්ෂාව

ජාතික ආරක්ෂාව සඳහා ලබා දෙන ඉහළ ප්‍රමුඛතාවක් ලෙසින් ශ්‍රී ලංකා රජය කාන්තාවන්ගේ ආරක්ෂාව සුරැකෙන උපායමාර්ගයන් ද හඳුනාගෙන ඇත. කාන්තාවගේ සුරක්ෂිතභාවය සහ ආරක්ෂාව පිළිබඳ අවධානය යොමු කෙරෙන කාන්තාව, සාමය හා ආරක්ෂාව පිළිබඳව වන ජාතික ප්‍රතිපත්ති රාමුවේ මෙම තේමාත්මක අංශය, ශ්‍රී ලංකා රජයේ ඉලක්කගත අරමුණුවලට අනුකූලව ගොඩනගා ඇත. ජාතික ප්‍රතිපත්ති රාමුව මගින් කාන්තා හා ළමා සුරක්ෂිතභාවයේ විවිධ අංශ කෙරෙහි අවධානය යොමු කොට ඇති අතර, උපදේශකත්ව සංවාදවල දී කාන්තාවන් ඉදිරිපත් කර ඇති අදහස් සැලකීමට ගෙන කාන්තාව සාමය හා ආරක්ෂාව පිළිබඳ වන ජාතික ක්‍රියාකාරී සැලැස්ම මගින් ඒවා තව දුරටත් ශක්තිමත් කර ඇත.

කාන්තාව, සාමය සහ ආරක්ෂාව පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම මෙම ක්‍රියාවලිය සපුරාලීමට අරමුණු කරන්නේ, ගැටුම් හේතුවෙන් හෝ එසේ නොමැති ව ආබාධ සහිත තත්ත්වයට පත් වූයේ ද යන්න නොසලකා ආබාධ සහිත කාන්තාවන් සහ ගැහැණු දරුවන්ගේ අවශ්‍යතා හඳුනා ගැනීමට ය. මෙම පුළුල් හඳුනා ගැනීම මගින් ආබාධිතභාවය, කාන්තාවන් හා ගැහැණු දරුවන් සමාජයීය ව ගොඩ නැගුණු අවදානම් තත්ත්වයට නිරාවරණය වන්නේ කෙසේද යන්න සහතික කරයි. ආබාධිතභාවය, කාන්තාවන් හා ගැහැණු දරුවන් ඔවුන්ගේ සාමයට සහ ආරක්ෂාවට තර්ජනයක් වන සමාජයීය, ආකෘතිකමය, ආයතනගත හා විවිධ අංශ අතර ඇති ප්‍රචණ්ඩත්වය වෙත නිරාවරණය කරන බව ජාතික ක්‍රියාකාරී සැලැස්ම මගින් හඳුනා ගනියි. මෙම පසුබිම යටතේ ජාතික ක්‍රියාකාරී සැලැස්ම මගින් ආබාධ සහිත කාන්තාවන්ගේ සහ ගැහැණු දරුවන්ගේ අවශ්‍යතා සපුරාලීමට අපේක්ෂා කරයි. උපදේශකත්ව සංවාදවලදී කාන්තාවන් විසින් මතු කරන ලද ප්‍රධාන කාරණයක් නම්, ළමා ආරක්ෂණ පහසුකම් හා නම්‍යශීලී සේවා කොන්දේසි අවම වීම හේතුවෙන් ආරක්ෂාවට ඇති තර්ජනයයි. මීට අනුකූලව, කාන්තාව, සාමය සහ ආරක්ෂාව පිළිබඳ ජාතික සැලැස්ම තුළින් මෙම පුළුල් ඉලක්ක වෙත ළඟා වීමට උපකාරී වන හඳුනාගත හැකි ඉලක්ක සහිත සුවිශේෂී ක්‍රියාකාරකම් සහ අධීක්ෂණ යාන්ත්‍රණයන් සකස් කර ඇත.

## 5. කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම

උපදේශකත්ව සංවාදවලදී හෙළිවූයේ ශ්‍රී ලංකාවේ සෑම පළාතක ම පාහේ කාන්තාවන් අවිධිමත් ලෙස ණය ලබා ගැනීම හේතුවෙන් මහත් ලෙස ආර්ථික අපහසුතාවලට ලක්ව සිටින බවයි. එවැනි කාන්තාවන් බොහෝ දෙනා ක්ෂුද්‍ර මූල්‍ය ආයතන මගින් ණය ලබා ගන්නා අතර කාන්තාව, සාමය සහ අරක්ෂාව පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම මෙම ගැටළුව ආමන්ත්‍රණය කිරීමට අපේක්ෂා කරයි. කාන්තා ව්‍යවසායකයින්ට සහාය දැක්වීමේ අවශ්‍යතාවය සහ කාන්තාවන්ගේ ආර්ථික හා සමාජයීය දායකත්වය කෙරෙහි ශ්‍රී ලංකා රජයේ අවධානය යොමු වී ඇත. අරමුණු අත්පත් කරගැනීමට, තම ආර්ථික ආරක්ෂාව සහ සුරක්ෂිතභාවය තහවුරු කරගනිමින් සාර්ථක ව්‍යවසායිකාවන් වීම සඳහා කාන්තාවන් තම ණය ගැනීමේ පුරුදු නිසි ලෙස කළමනාකරණය කරගන්නා බව තහවුරු කරගැනීමට විවිධ රාජ්‍ය ආයතන මගින් අධීක්ෂණය සහ නියාමනය වන මැදිහත්වීම් සහ ක්‍රියාකාරකම් කාන්තාව සාමය සහ ආරක්ෂාව පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම මගින් සැලසුම් කොට ඇත.

## 6. සාමය ගොඩ නැංවීම, ගැටුම් නිරාකරණය, ගැටුම් වැළැක්වීම, තීරණ ගැනීම සහ දේශපාලනය සඳහා කාන්තා සහභාගීත්වය ප්‍රවර්ධනය

දේශපාලනික තීරණ ගැනීමේ දී කාන්තාවන් හා තරුණ ප්‍රජාවගේ සහභාගීත්වය ඉහළ නැංවීමට රජය කැප වී සිටියි . ඊට අනුගතව ස්ත්‍රී පුරුෂ සමාජභාවීයමය වශයෙන් සහ වඩාත් පුළුල් දෘෂ්ටියක් යටතේ ශ්‍රී ලංකාවේ රාජ්‍ය පාලනයෙහි සියලු මට්ටම්වල දී තීරණ ගැනීමට දායක වීම ඉහළ නැංවීම අරමුණු කරගනිමින් විවිධ ක්‍රියාකාරකම් ජාතික ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කොට ඇත. 1325 යෝජනාව මගින් ඉස්මතු කරන ලද දේශපාලනික අන්තර්කරණය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවී සංවේදීභාවය මගින් ද මේ සඳහා සහායක් ලැබී ඇත. කාන්තා නියෝජනය ඇතුළත් වන පරිදි ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් ජනතා කේන්ද්‍රීය සමථ මණ්ඩල ශක්තිමත් කිරීම කෙරෙහි කාන්තාව, සාමය සහ අරක්ෂාව පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්මේ අවධානයට යොමු වී ඇත.

## තේමාත්මක ප්‍රමුඛතාව 01:

# නීති, ප්‍රතිපත්ති හා ආයතනික ප්‍රතිසංස්කරණ

**ක්‍රමෝපායාත්මක අරමුණු:**

1. ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳව සංවේදී කිරීම සඳහා පවත්නා ව්‍යවස්ථාදායක නීති සංශෝධනය කිරීම
2. කාන්තාවන්ගේ සහභාගිත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා පවත්නා ආයතනික භාවිතයන් ප්‍රතිශෝධනය කිරීම
3. ප්‍රජාමූල මට්ටම්වල කාන්තාවන්ට සේවා සම්පාදනය කිරීම සඳහා රජය සම්බන්ධ වීම වැඩි කිරීම
4. රාජ්‍ය ආයතන තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදීතාව සහ භාෂා සමානාත්මතාවය වැඩි කිරීම
5. කාන්තාවන්ට සම්බන්ධ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය ගැටලු පිළිබඳව රජයේ නිලධාරීන් සංවේදී කිරීම
6. පවත්නා රාජ්‍ය සේවාව සහ ඒවාට ප්‍රවේශ විය හැකි හොඳ ම ආකාරය පිළිබඳව ප්‍රජාමූල මට්ටම්වල කාන්තාවන්ගේ දැනුවත්කම ඉහළ නැංවීම

අවධාන ක්ෂේත්‍රය

# 01

## ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය හා වෙනස්කොට සැලකීමට එරෙහිව කාන්තාවන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා නීති හා ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ

| ප්‍රතිඵලය | වගකිව යුතු ආයතනය/නිලධාරියා |
|---|---|
| නීති හා ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ හරහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය හා වෙනස්කොට සැලකීමට එරෙහිව කාන්තාවන්ට වැඩි ආරක්ෂාවක් ලැබේ | • ලේකම්, කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය<br>• සභාපති, ජාතික කාන්තා කමිටුව (National Committee on Women - NCW) |

| ප්‍රධාන ක්‍රියාකාරකම් | දර්ශක | සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීමේ ක්‍රම | ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ ආයතන | සහාය දෙන ආයතන | | කාල රාමුව | නිරීක්ෂණ ආයතනය | අය වැය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රාජ්‍ය ක්‍රියාකාරකයන් | රාජ්‍ය නොවන ක්‍රියාකාරකයන් | | | |
| **1.1** කාන්තාවන්ට එරෙහිව සියලු ආකාරයේ වෙනස් කොට සැලකීම් තුරන් කිරීමේ සම්මුතියේ (CEDAW) 2 වගන්තියට අනුව සහ ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වගන්තියට අනුකූලව පෞද්ගලික හා භෞමික නීති තුළ පවත්නා වෙනස්කොට සැලකීමේ විධිවිධාන සංශෝධනය කිරීම | තෝරා ගත් පෞද්ගලික / භෞමික / ආගමික නීති සංශෝධනය කිරීමේ දැක්මකින් සිදු කරන ලද උපදේශන සංඛ්‍යාව<br><br>කෙටුම්පත් කර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද සංශෝධන සංඛ්‍යාව<br><br>ක්‍රියාත්මක කරන ලද සංශෝධනවල ප්‍රතිශතය(%) | නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව<br><br>ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව | අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සාධාරණත්වය සහ සමානාත්මතාව සඳහා වන පාර්ලිමේන්තු තේරීම් කමිටුව<br><br>නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව<br><br>පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදය<br><br>ජාතික කාන්තා කමිටුව | එක්සත් ජාතීන්ගේ ආයතන<br><br>සිවිල් සමාජ සංවිධාන<br><br>පර්යේෂණ ආයතන | 2023ජන.- 2025 ඔක්. | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | සම්මත කිරීමට නියමිතය |

| ප්‍රධාන ක්‍රියාකාරකම් | දර්ශක | සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීමේ ක්‍රම | ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ ආයතන | සහාය දෙන ආයතන | | කාල රාමුව | නිරීක්ෂණ ආයතනය | අය වැය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රාජ්‍ය ක්‍රියාකාරකයන් | රාජ්‍ය නොවන ක්‍රියාකාරකයන් | | | |
| **1.2**<br>කාන්තාවන් උදෙසා 25% ක අවම නියෝජනයක් සහතික කිරීම සඳහා විධිවිධාන සම්පාදනය කිරීම පිණිස 1988 අංක 2 දරන පළාත් සභා මැතිවරණ පනත සංශෝධනය කිරීම | කෙටුම්පත් කර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද සංශෝධන සංඛ්‍යාව<br><br>ක්‍රියාත්මක කරන ලද සංශෝධනවල ප්‍රතිශතය(%) | නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව<br><br>ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව | රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය<br><br>අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සාධාරණත්වය සහ සමානාත්මතාව සඳහා වන පාර්ලිමේන්තු තේරීම් කමිටුව<br><br>නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව<br><br>පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදය<br><br>කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය<br><br>මැතිවරණ කොමිෂන් සභාව | එක්සත් ජාතීන්ගේ ආයතන<br><br>සිවිල් සමාජ සංවිධාන<br><br>පර්යේෂණ ආයතන | 2023 ජන.-2025 ඔක්. | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | සම්මත කිරීමට නියමිතය |
| **1.3**<br>පාර්ලිමේන්තු මට්ටමේ දී කාන්තාවන් උදෙසා 25% ක අවම නියෝජනයක් සහතික කිරීම සඳහා විධිවිධාන සම්පාදනය කිරීම පිණිස 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත තුළ විධිවිධාන හඳුන්වා දීම | කෙටුම්පත් කර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද සංශෝධන සංඛ්‍යාව<br><br>ක්‍රියාත්මක කරන ලද සංශෝධනවල ප්‍රතිශතය | නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව<br><br>ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව | අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සාධාරණත්වය සහ සමානාත්මතාව සඳහා වන පාර්ලිමේන්තු තේරීම් කමිටුව<br><br>නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව<br><br>පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදය<br><br>මැතිවරණ කොමිෂන් සභාව<br><br>කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | එක්සත් ජාතීන්ගේ ආයතන<br><br>සිවිල් සමාජ සංවිධාන | 2023 ජන.-2025 ඔක්. | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | සම්මත කිරීමට නියමිතය |

| ප්‍රධාන ක්‍රියාකාරකම් | දර්ශක | සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීමේ ක්‍රම | ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ ආයතන | සහාය දෙන ආයතන | | කාල රාමුව | නිරීක්ෂණ ආයතනය | අය වැය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රාජ්‍ය ක්‍රියාකාරකයන් | රාජ්‍ය නොවන ක්‍රියාකාරකයන් | | | |
| **1.4**<br>පසුගිය දශකය තුළ (2012-2022) වාර්තා වූ ලිංගික ප්‍රචණ්ඩත්වය සම්බන්ධ සිදුවීම් පිළිබඳව, ඒවා විසඳීමට ගත වූ කාලය පිළිබඳව විශේෂ අවධානයක් සහිතව අධ්‍යයනයක් සිදු කිරීම. (සිදුවීම පොලීසියට වාර්තා කරන ලද සහ/ හෝ වෛද්‍ය/නීති පරීක්ෂණය සිදු කරන ලද මුල් අවස්ථාවේ සිට කාලය ගණනය වනු ඇත.) | ලිංගික ප්‍රචණ්ඩත්වය හා සම්බන්ධ අධිකරණ ක්‍රියාවලිය පිළිබඳව සිදු කරන ලද අධ්‍යයන සංඛ්‍යාව | අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | ශ්‍රී ලංකා නීති කොමිෂන් සභාව<br><br>ජාතික කාන්තා කමිටුව | එක්සත් ජාතීන්ගේ ආයතන<br><br>සිවිල් සමාජ සංවිධාන | 2023 ජන.- 2025 ඔක් | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | සම්මත කිරීමට නියමිතය |
| **1.5**<br>පළමු පැමිණිල්ලේ සිට ගැටලුව විසඳීම දක්වා නිෂ්ප්‍රභ කිරීම, ඉල්ලා අස් කර ගැනීම, නිදොස් කිරීම සහ දඬුවම් පැනවීම ඔස්සේ වාර්තා තබා ගන්නා 'විශේෂ තොරතුරු ග්‍රහණය කර ගැනීමේ පද්ධතියක්' ද සහිතව ලිංගික ප්‍රචණ්ඩත්වයට සම්බන්ධ දත්ත ගොනු කිරීම හා ඩිජිටල්කරණය කිරීම | ලිංගික ප්‍රචණ්ඩත්වයට සම්බන්ධ සිදුවීම්වල ප්‍රගතිය පිළිබඳ 'තොරතුරු ග්‍රහණය කරගැනීමට ගොඩ නැගූ පද්ධති සංඛ්‍යාව | ළමා හා කාන්තා අපයෝජන නිවාරණ කාර්යාංශය<br><br>අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | මහජන ආරක්ෂක අමාත්‍යාංශය | ශ්‍රී ලංකා නීති කොමිෂන් සභාව<br><br>ජාතික ළමා ආරක්ෂක අධිකාරිය<br><br>නීති ආධාර කොමිෂන් සභාව | එක්සත් ජාතීන්ගේ ආයතන<br><br>සිවිල් සමාජ සංවිධාන | 2023 ජන.- 2025 ඔක්. | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | සම්මත කිරීමට නියමිතය |

| ප්‍රධාන ක්‍රියාකාරකම් | දර්ශක | සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීමේ ක්‍රම | ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ ආයතන | සහාය දෙන ආයතන | | කාල රාමුව | නිරීක්ෂණ ආයතනය | අය වැය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රාජ්‍ය ක්‍රියාකාරකයන් | රාජ්‍ය නොවන ක්‍රියාකාරකයන් | | | |
| **1.6**<br>හිංසනයෙන් දිවි ගලවා ගත් පුද්ගලයන් කෙරෙහි කේන්ද්‍රගත වූ එළඹුමක් භාවිත කරමින් ස්ත්‍රී පුරුෂ සමාජභාවී සංවේදීත්වය සහිත කඩිනම් අධිකරණ ක්‍රියාවලියක් සඳහා සම්මත මෙහෙයුම් පටිපාටි (Standard Operating Procedures-SOPs) නිර්මාණය කිරීම | සම්මතකරන ලද ක්‍රියාත්මක කරන ලද මෙහෙයුම් පටිපාටි සංඛ්‍යාව<br><br>කාන්තාවන් සහ ළමයින් පිළිබඳව සැලකිල්ල යොමු කරමින් අධිකරණ පැමිණිලි විසඳීම සඳහා කැප වූ පද්ධතියක් ස්ථාපනය කරන ලද දිස්ත්‍රික් උසාවි සහිත දිස්ත්‍රික් සංඛ්‍යාව | ළමා හා කාන්තා අපයෝජන නිවාරණ කාර්යාංශය<br><br>අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | මහජන ආරක්ෂක අමාත්‍යාංශය | ශ්‍රී ලංකා නීති කොමිෂන් සභාව<br><br>නීති ආධාර කොමිෂන් සභාව | එක්සත් ජාතීන්ගේ ආයතන<br><br>සිවිල් සමාජ සංවිධාන | 2023ජන.-2025 ඔක්. | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | සම්මත කිරීමට නියමිතය |
| **1.7**<br>සියලු ආකාරයේ ස්ත්‍රී දූෂණ හා අපරාධකරුවන්ගෙන් ආරක්ෂා කිරීමට පූර්ණ වශයෙන් දරුවන්ගේ පූර්ණ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා මෙන්ම ස්ත්‍රී දූෂණ ද අන්තර්ගත කරමින් සහ අපරාධකරුවා සහ ස්ත්‍රීදූෂණ වින්දිතයන් සඳහා වන ස්ත්‍රී පුරුෂ සමාජභාවී බාධක ඉවත් කිරීම සඳහා දණ්ඩ නීති සංග්‍රහයේ 363 වගන්තිය ප්‍රතිව්‍යුහගත කිරීම | තෝරාගන්නා ලද නීති සංශෝධනය කිරීමේඅරමුණ සහිතව පවත්වන ලද උපදේශන සංඛ්‍යාව<br>ප්‍රකාශයට පත්කරන ලද මහජනයාට ලබා ගැනීමට අවස්ථාව ඇති උපදේශන පිළිබඳ වාර්තා සංඛ්‍යාව<br>කෙටුම්පත් කරන ලද සහ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදසංශෝධන සංඛ්‍යාව<br>ක්‍රියාවේ යොදවන ලද සංශෝධන සංඛ්‍යාව | නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව<br><br>ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව | අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සාධාරණත්වයසහ සමානාත්මතාව සඳහා වන පාර්ලිමේන්තු තේරීම් කමිටුව<br><br>නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව<br><br>කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | එක්සත් ජාතීන්ගේ ආයතන<br><br>සිවිල් සමාජ සංවිධාන<br><br>පර්යේෂණ ආයතන | 2023 පෙබ-2025 ජන | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | සම්මත කිරීමට නියමිතය |

| ප්‍රධාන ක්‍රියාකාරකම් | දර්ශක | සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීමේ ක්‍රම | ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ ආයතන | සහාය දෙන ආයතන | | කාල රාමුව | නිරීක්ෂණ ආයතනය | අය වැය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රාජ්‍ය ක්‍රියාකාරකයන් | රාජ්‍ය නොවන ක්‍රියාකාරකයන් | | | |
| **1.8**<br>ආපදා කළමනාකරණය සහ අනතුරු අවම කිරීම සම්බන්ධ ජාතික ප්‍රතිපත්තිවල ස්ත්‍රී පුරුෂ සමාජභාවී සංවේදීතාව පිළිබඳව විමර්ශනයක් සිදු කිරීම | ආපදා කළමනාකරණය සහ අනතුරු අවම කිරීම සම්බන්ධ ජාතික ප්‍රතිපත්තිවල ස්ත්‍රී පුරුෂ සමාජභාවී සංවේදීතාව පිළිබඳව පවත්වන ලද විමර්ශන සහ පළ කරන ලද වාර්තා සංඛ්‍යාව | ආරක්ෂක අමාත්‍යාංශය<br><br>ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය | ආරක්ෂක අමාත්‍යාංශය<br><br>ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | සිවිල් සමාජ සංවිධාන | 2023 පෙබ-2024 අගෝ | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | සම්මත කිරීමට නියමිතය |

අවධාන ක්ෂේත්‍රය

# 02

**ශ්‍රී ලංකාව තුළ කාන්තාව, සාමය හා ආරක්ෂාව පිළිබඳ න්‍යාය පත්‍රය කඩිනම් කිරීමට ස්ත්‍රී පුරුෂ සමාජභාවය අන්තර්කරණය කිරීම අරමුණු කරගනිමින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය කෙරෙහි ප්‍රතිචාරාත්මක අය වැය සහිතව සහ පුද්ගල හැකියාවන් ඉහළ නංවාලීම සඳහා වූ ආයතනික ප්‍රතිසංස්කරණ**

**ප්‍රතිඵලය**

ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳව සංවේදී රජයේ සහායෙන් ලබා දෙන සම්පත් හා සේවා වෙත ප්‍රජාමූල මට්ටම්වල කාන්තාවන්ට ප්‍රවේශ වීමට ඇති අවස්ථා වර්ධනය වේ

**වගකිව යුතු ආයතනය/නිලධාරියා**

- කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය

| ප්‍රධාන ක්‍රියාකාරකම් | දර්ශක | සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීමේ ක්‍රම | ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ ආයතන | සහාය දෙන ආයතන | | කාල රාමුව | නිරීක්ෂණ ආයතනය | අය වැය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රාජ්‍ය ක්‍රියාකාරකයන් | රාජ්‍ය නොවන ක්‍රියාකාරකයන් | | | |
| **2.1** රාජ්‍ය ආයතනවලට සහ එම ආයතනවල පද්ධතිවලට (මාර්ගගත හා digital පද්ධති ද ඇතුළුව)ස්ත්‍රී පුරුෂ සමාජභාවී සංවේදීතාවෙන් යුතුව කාන්තාවන්ට පිවිසිය හැකි බව තහවුරු කිරීම සඳහා යාන්ත්‍රණයක් ක්‍රියාවේ යෙදවීම | සකස් කරන ලද මාර්ගෝපදේශන සංඛ්‍යාව<br><br>මාර්ගගත හා රාජ්‍ය පද්ධති වෙත පිවිසෙන කාන්තාවන්<br><br>ආබාධ සහිත පුද්ගලයන්ට (PWDs) පිවිසිය හැකි පරිශ්‍ර සහිත රාජ්‍ය ආයතන | රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය<br><br>දිස්ත්‍රික් ලේකම් කාර්යාල | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය<br><br>රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | සියලු රාජ්‍ය ආයතන | එක්සත් ජාතීන්ගේ ආයතන<br><br>පර්යේෂණ ආයතන | 2023 ජන-2027 අගෝ | රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | සම්මත කිරීමට නියමිතය |

| ප්‍රධාන ක්‍රියාකාරකම් | දර්ශක | සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීමේ ක්‍රම | ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ ආයතන | සහාය දෙන ආයතන | | කාල රාමුව | නිරීක්ෂණ ආයතනය | අය වැය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රාජ්‍ය ක්‍රියාකාරකයන් | රාජ්‍ය නොවන ක්‍රියාකාරකයන් | | | |
| **2.2** කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීම සඳහා මනා ධාරිතාවෙන් යුතු සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදී වනිතා සංවර්ධන නිලධාරීන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් බඳවා ගැනීම සහ/ හෝ පත් කිරීම | දිස්ත්‍රික් මට්ටමින් සම්පාදනය කරන ලද වනිතා සංවර්ධන නිලධාරීන් පිළිබඳව සැලකිල්ල යොමු කරන ලද ප්‍රතිපත්ති සහ අයවැය තීරණ සංඛ්‍යාව බඳවා ගත් වනිතා සංවර්ධන නිලධාරීන් සංඛ්‍යාව | රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය<br><br>දිස්ත්‍රික් ලේකම් කාර්යාල | රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය<br><br>කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය<br><br>මුදල් ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය | එක්සත් ජාතීන්ගේ ආයතන<br><br>සිවිල් සමාජ සංවිධාන<br><br>පර්යේෂණ ආයතන | 2023 ජන- 2027 අගෝ | රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | සම්මත කිරීමට නියමිතය |
| **2.3** ප්‍රමාණවත් තරම් දෙමළ භාෂාව හසුරවන නිලධාරීන් බඳවා ගැනීම (ක්ෂණික ඇමතුම් කවුළුවේ මෙන්ම ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල මුළුල්ලේම ද්වීභාෂා ප්‍රවීණතාව ඇති බව තහවුරු කිරීම සඳහා) | බඳවාගත් දෙමළ භාෂාව හසුරුවන නිලධාරීන් සංඛ්‍යාව<br>ස්ත්‍රී පුරුෂ සමාජභාවී භාෂා විවිධත්වයට අනුව වෙන් කරන ලද නිලධාරීන් | රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය<br><br>දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය<br><br>කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය<br><br>මුදල් ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය<br>ජාතික කාන්තා කමිටුව<br><br>ජාතික ළමා ආරක්ෂක අධිකාරිය | එක්සත් ජාතීන්ගේ ආයතන<br><br>සිවිල් සමාජ සංවිධාන<br><br>පර්යේෂණ ආයතන | 2023 ජන- 2027 අගෝ | රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, , පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | සම්මත කිරීමට නියමිතය |

| ප්‍රධාන ක්‍රියාකාරකම් | දර්ශක | සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීමේ ක්‍රම | ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ ආයතන | සහාය දෙන ආයතන | | කාල රාමුව | නිරීක්ෂණ ආයතනය | අය වැය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රාජ්‍ය ක්‍රියාකාරකයන් | රාජ්‍ය නොවන ක්‍රියාකාරකයන් | | | |
| **2.4** පාසල් තුළ ත්‍රෛභාෂා ප්‍රවීණතාව සඳහා පහසුකම් සැපයීම වෙනුවෙන් නියාමනයන් හඳුන්වාදීම සහ ක්‍රියාවේ යෙදවීම[15] | නියාමනයන් ඵලදායී ලෙස ක්‍රියාවේ යොදවන ලද පාසල් සංඛ්‍යාව සියලුම සිසුන්ට ඉංග්‍රීසි සිංහල සහ දෙමළ උගන්වන පාසල්<br><br>දෙවන බස ඉගැන්වීම පිළිබඳව ඇති මාර්ගෝපදේශන සහ පුහුණුසැසි සංඛ්‍යාව ගුරුවරුන් අතර දිරි ගන්වන ලද දෙමළ සහ සිංහල භාෂා ප්‍රවීණතාව සඳහා වන නියාමන සංඛ්‍යාව<br><br>පවතින ඉංග්‍රීසි සිංහල සහ දෙමළ ඩිජිටල් භාෂා මොඩියුල සංඛ්‍යාව | අධ්‍යාපන අමාත්‍යාංශය | අධ්‍යාපන අමාත්‍යාංශය | රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව<br><br>විභාග දෙපාර්තමේන්තුව<br><br>අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව | එක්සත් ජාතීන්ගේ ආයතන | 2023 ජන- දීර්ඝ කාලීන | අධ්‍යාපන අමාත්‍යාංශය | සම්මත කිරීමට නියමිතය |

15 වෙන් කරන ලද සම්පත් ඉහළ නැංවීම, භාෂා ගුරුවරුන් බඳවා ගැනීම් ඉහළ නැංවීම, දෙවන භාෂාව ඉගැන්වීමේ මාර්ගෝපදේශන සහාය සහ ඒ පිළිබඳ ගුරුවරුන් පුහුණු කිරීම, දිරිගැන්වීම් වශයෙන් ද්වි භාෂා හැකියාව සලකා බැලෙන පරිද්දෙන් ගුරුවරුන්ගේ උසස්වීම් පටිපාටිය යාවත්කාලීන කිරීම සහ භාෂාව ඉගෙන ගැනීම සඳහා වන ඩිජිටල් මොඩියුල සම්පාදනය කිරීම මෙන්ම ඒවාට පිවිසීමට ඇති හැකියාව ඉහළ නැංවීම ඔස්සේ මෙය සිදු කළ හැකිය.

| ප්‍රධාන ක්‍රියාකාරකම් | දර්ශක | සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීමේ ක්‍රම | ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ ආයතන | සහාය දෙන ආයතන | | කාල රාමුව | නිරීක්ෂණ ආයතනය | අය වැය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රාජ්‍ය ක්‍රියාකාරකයන් | රාජ්‍ය නොවන ක්‍රියාකාරකයන් | | | |
| **2.5**<br>ව්‍යවස්ථාපිත සහ වෙනත් නීත්‍යානුකූල ප්‍රතිඥාවලට අනුව සියලු පරිපාලන දෙපාර්තමේන්තු සහ නිලධාරීන් ත්‍රෛභාෂා සේවා (සිංහල, දෙමළ, ඉංග්‍රීසි) ලබා දෙන බව තහවුරු කිරීම | ත්‍රෛභාෂා සේවා ලබා දෙන පරිපාලන දෙපාර්තමේන්තු<br><br>සිංහල භාෂාවෙන් සහ දෙමළ භාෂාවෙන් පමණක් සේවා ලබා දෙන පරිපාලන දෙපාර්තමේන්තු | රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව | එක්සත් ජාතීන්ගේ ආයතන | 2023 ජන - දීර්ඝ කාලීන | රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | සම්මත කිරීමට නියමිතය |
| **2.6**<br>ශ්‍රී ලංකාවේ කාන්තාව, හා සාමය සහ ආරක්ෂාව පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාවේ යෙදවීම පිළිබඳව රාජ්‍ය නිලධාරීන්ට පුහුණු වැඩසටහන් පැවැත්වීම | සම්පාදනය කරන ලද පුහුණු මොඩියුල සංඛ්‍යාව<br><br>පවත්වන ලද පුහුණු සංඛ්‍යාව | දිස්ත්‍රික් ලේකම් කාර්යාල<br><br>කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | ජාතික ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් සියලු ක්‍රියාත්මක කිරීමේ සහ සහාය දැක්වීමේ ආයතන | එක්සත් ජාතීන්ගේ ආයතන<br><br>පර්යේෂණ ආයතන | 2023 ජන- 2027 අගෝ | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | සම්මත කිරීමට නියමිතය |

| ප්‍රධාන ක්‍රියාකාරකම් | දර්ශක | සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීමේ ක්‍රම | ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ ආයතන | සහාය දෙන ආයතන | | කාල රාමුව | නිරීක්ෂණ ආයතනය | අය වැය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රාජ්‍ය ක්‍රියාකාරකයන් | රාජ්‍ය නොවන ක්‍රියාකාරකයන් | | | |
| **2.7** ජාතික විශ්වවිද්‍යාලවල ශිෂ්‍යයන් සහ මෑතකදී උපාධිය ලබාගත් උපාධිධාරීන් මාස තුනක කාලයකට අභ්‍යාසලාභීන් ලෙස බඳවා ගැනීම සහ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ (Human Rights Commission of Sri Lanka-(HRCSL) කටයුතු පිළිබඳව සතියක ප්‍රාරම්භකපුහුණුවක් ලබාදීම සහ ඒ පිළිබඳව දැනුවත්භාවය ඉහළ නැංවීම සඳහා ඔවුන්ගේ කුසලතා යොදා ගැනීම[16] | ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව මගින් දැනුවත්භාවය ඉහළ නැංවීමේ වැඩසටහන් පවත්වන ලද දිස්ත්‍රික්ක සංඛ්‍යාව | ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව | ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව | නීති පාඨමාලා පවත්වන රාජ්‍ය ආයතන | ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ප්‍රාදේශීය කාර්යාලවල සිවිල් සමාජ සංවිධාන සම්බන්ධීකරණ කමිටුව<br><br>පර්යේෂණ ආයතන | 2023 ජන 2027 අගෝ | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | සම්මත කිරීමට නියමිතය |

16 මෙම යෝජනාව ඉදිරිපත් වූයේ මධ්‍යම පළාතේ පවත්වන ලද උපදේශනය අතරතුරදීය. එහිදී නිර්දේශ වූයේ මේ ආකාරයේ පියවර දෙආකාරයකින් ඵලදායි වන බවය. පළමුව මෙමගින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමට ඔවුන්ගේ පවතින කාර්ය මණ්ඩල හිඟයට පිළියමක් ලබා ගත හැකිය. දෙවනුව නීතිය හදාරමින් සිටින විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ට මෙමගින් ඔවුන්ගේ ප්‍රායෝගික කුසලතා සංවර්ධනය කරගැනීමට අවස්ථාවක් ලැබෙන අතර ඒ ඔස්සේ ඔවුන්ට මානව හිමිකම් කොමිසමේ සහ මානව හිමිකම් ප්‍රවර්ධනය සහ ආරක්ෂාව වෙනුවෙන් කටයුතු කරන වෙනත් ආයතනවල බඳවාගැනීම්වලට ඇතුළත්වීම සඳහා සුදුසුකම් සපුරා ගැනීමට අවස්ථාවක් ලැබේ.

| ප්‍රධාන ක්‍රියාකාරකම් | දර්ශක | සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීමේ ක්‍රම | ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ ආයතන | සහාය දෙන ආයතන | | කාල රාමුව | නිරීක්ෂණ ආයතනය | අය වැය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රාජ්‍ය ක්‍රියාකාරකයන් | රාජ්‍ය නොවන ක්‍රියාකාරකයන් | | | |
| **2.8**<br>සියලුම පොලිස් ස්ථානවල ද්විභාෂා සේවාසැපයීමේ[17] ධාරිතාව සහතික කිරීම | ජාතික භාෂා ද්විත්වයෙන්ම පැමිණිලිවලට ප්‍රතිචාර දැක්වීමට සහ වාර්තා තබා ගැනීමට සමත් වන පොලිස් ස්ථාන සංඛ්‍යාව | ජාතික පොලිස් කොමිෂන් සභාව<br><br>මහජන ආරක්ෂක අමාත්‍යාංශය<br><br>රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය<br><br>ශ්‍රී ලංකා පොලීසිය | ශ්‍රී ලංකා පොලීසිය | ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලය<br><br>ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව | පර්යේෂණ ආයතන | 2023 ජන-2027 අගෝ | ජාතික පොලිස් කොමිෂන් සභාව<br><br>කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | සම්මත කිරීමට නියමිතය |
| **2.9**<br>සංඥා භාෂාව භාවිත කළ හැකි පොලිස් නිලධාරීන් බඳවා ගැනීම/තෝරාගත් පොලිස් නිලධාරීන් සඳහා සංඥා භාෂා පුහුණු ලබාදීම | සංඥා භාෂාවෙන් සන්නිවේදනය කිරීම සඳහා බඳවා ගත් හා/ හෝ පුහුණු කළ පොලිස් නිලධාරීන් සංඛ්‍යාව<br><br>ලබා දෙන ලද සංඥා භාෂා පුහුණු සංඛ්‍යාව | රාජ්‍ය සේවා කොමිෂන් සභාව<br><br>මහජන ආරක්ෂක අමාත්‍යාංශය<br><br>රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය<br><br>ශ්‍රී ලංකා පොලීසිය | ශ්‍රී ලංකා පොලීසිය | ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික ලේකම් කාර්යාලය<br><br>ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව<br><br>සමාජ සේවා දෙපාර්තමේන්තුව | සිවිල් සමාජ සංවිධාන<br><br>පර්යේෂණ ආයතන | 2023 ජන-2027 අගෝ | රාජ්‍ය සේවා කොමිෂන් සභාව<br><br>කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | සම්මත කිරීමට නියමිතය |

17 උපදේශනවලට සහභාගි වූ පාර්ශ්වකරුවන් මෙම නිලධාරීන් දෙමළ සහ මුස්ලිම් ප්‍රජාවගෙන් තෝරා ගැනීමේ අවශ්‍යතාව පිළිබඳව විශේෂයෙන්ම දක්වා සිටියහ.

| ප්‍රධාන ක්‍රියාකාරකම් | දර්ශක | සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීමේ ක්‍රම | ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ ආයතන | සහාය දෙන ආයතන | | කාල රාමුව | නිරීක්ෂණ ආයතනය | අය වැය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රාජ්‍ය ක්‍රියාකාරකයන් | රාජ්‍ය නොවන ක්‍රියාකාරකයන් | | | |
| **2.10** ත්‍රිවිධ හමුදාවේ සහ පොලීසියේ බඳවාගැනීම් වලදී සහ උසස්වීම් ලබාදීමේදී ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාවය ඇති බව තහවුරු කිරීම | වාර්ෂිකව ත්‍රිවිධ හමුදාව බඳවාගත් පුරුෂයන් සහ කාන්තාවන් සංඛ්‍යාව<br><br>වාර්ෂික පදනමින් ඉහළ ධුරවලට පත් කරන ලද කාන්තාවන් සහ පිරිමින් සංඛ්‍යාව<br><br>මහජනතාවට ලබා ගත හැකි ස්ත්‍රී පුරුෂ වශයෙන් වෙන්කර දක්වන ලද නිලධාරීන් බඳවා ගැනීම් පිළිබඳ වාර්තා සංඛ්‍යාව<br><br>බඳවා ගන්නා ලද කාන්තා නිලධාරීන් සංඛ්‍යාව | ආරක්ෂක අමාත්‍යාංශය<br><br>මහජන ආරක්ෂක අමාත්‍යාංශය | ආරක්ෂක අමාත්‍යාංශය<br><br>මහජන ආරක්ෂක අමාත්‍යාංශය | අදාළ නැත | අදාළ නැත | 2023 ජන- දීගු කාලීන | ආරක්ෂක අමාත්‍යාංශය | සම්මත කිරීමට නියමිතය |
| **2.11** ඔම්බුඩ්ස්මන්වරයෙකු හරහා පැමිණිලි යාන්ත්‍රණය ශක්තිමත් කිරීම සහ ඔම්බුඩ්ස්මන්වරයා විසින් සම්පාදනය කෙරෙන සේවා වෙත ප්‍රවේශ වීමට කාන්තාවන් අතර දැනුවත්කම ඉහළ නැංවීම | ඔම්බුඩ්ස්මන්වරයාගේ කවුළුවට ලැබුණු පැමිණිලි සංඛ්‍යාව<br><br>කාන්තාවන් වෙනුවෙන් පවත්වන ලද දැනුවත්කම ඉහළ නැංවීමේ ව්‍යාපාර / පුහුණු සංඛ්‍යාව | ඔම්බුඩ්ස්මන්වරයා (පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලය) | ඔම්බුඩ්ස්මන්වරයා පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලය) | ජනාධිපති ලේකම් කාර්යාලය | එක්සත් ජාතීන්ගේ ආයතන<br><br>සිවිල් සමාජ සංවිධාන | 2023 ජන- 2024 අගෝ | ජනාධිපති ලේකම් කාර්යාලය | සම්මත කිරීමට නියමිතය |

| ප්‍රධාන ක්‍රියාකාරකම් | දර්ශක | සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීමේ ක්‍රම | ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ ආයතන | සහාය දෙන ආයතන | | කාල රාමුව | නිරීක්ෂණ ආයතනය | අය වැය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රාජ්‍ය ක්‍රියාකාරකයන් | රාජ්‍ය නොවන ක්‍රියාකාරකයන් | | | |
| **2.12**<br>කාන්තා පොලිස් නිලධාරීන් ප්‍රමාණවත් ලෙස බඳවා ගැනීම සහ පොලිස් කාර්ය මණ්ඩලය තුළ ප්‍රමාණවත් කාන්තා නියෝජනයක් පවත්වා ගැනීම සඳහා ඔවුන් පොලිස් සේවය තුළ රඳවා ගැනීම සහතික කිරීම සහ උසස් වීම් මෙන්ම පොලිසිය තුළ තීරණ ගැනීමේ ධාරිතාව දැරීමට අවස්ථා ලබා දීම. | බඳවාගන්නා ලද කාන්තා පොලිස් නිලධාරීන් සංඛ්‍යාව<br><br>ඒ ඒ පොලිස් ස්ථානවල සේවයේ යොදවා ඇති කාන්තා පොලිස් නිලධාරීන්<br><br>පොලිසියේ ඉහළම ධූරයන් 3හි සේවය කරන කාන්තා පොලිස් නිලධාරීන් සංඛ්‍යාව<br><br>2023 සහ 2027 අතර කාලයේ බඳවාගන්නා කාන්තා පොලිස් නිලධාරීන් ප්‍රමාණය තක්සේරු කිරීම සඳහා පවත්වන ලද සමීක්ෂණ සංඛ්‍යාව<br><br>වර්ෂ 5, 10, 15, 20, 25 ටවඩා දිගු සේවා කාලයක් සහිතව සේවයේ නියුතු කාන්තා පොලිස් නිලධාරීන්පිළිබඳව පවත්වන ලද සමීක්ෂණ සංඛ්‍යාව | ජාතික පොලිස් කොමිෂන් සභාව<br><br>ශ්‍රී ලංකා පොලීසිය | රාජ්‍ය සේවා කොමිෂන් සභාව<br><br>ජාතික පොලිස් කොමිෂන් සභාව<br><br>ශ්‍රී ලංකා පොලීසිය<br><br>මහජන ආරක්ෂක අමාත්‍යාංශය | ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලය<br><br>අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය<br><br>කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | පර්යේෂණ ආයතන | 2023 ජන-2027 අගෝ | ජාතික පොලිස් කොමිෂන් සභාව<br><br>කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | සම්මත කිරීමට නියමිතය |

| ප්‍රධාන ක්‍රියාකාරකම් | දර්ශක | සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීමේ ක්‍රම | ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ ආයතන | සහාය දෙන ආයතන | | කාල රාමුව | නිරීක්ෂණ ආයතනය | අය වැය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රාජ්‍ය ක්‍රියාකාරකයන් | රාජ්‍ය නොවන ක්‍රියාකාරකයන් | | | |
| **2.13**<br>සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව පෙර පාසල් අධ්‍යාපනය ද ඇතුළුව අධ්‍යාපන පරිපාලනයෙන් හා/හෝ බලතල වෙන්කර ක්‍රියාත්මක කිරීම[18] | මින් පෙර ගැටුම් පැවති ප්‍රදේශවල පෙර පාසල් සහ ප්‍රාථමික අධ්‍යාපනය විධිමත් කිරීම සඳහා ගත් පියවර සංඛ්‍යාව | අධ්‍යාපන අමාත්‍යාංශය | අධ්‍යාපන අමාත්‍යාංශය | සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව<br><br>ආරක්ෂක අමාත්‍යාංශය<br><br>කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය<br><br>පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව | සිවිල් සමාජ සංවිධාන | 2023 ජන-2003 අගෝ | අධ්‍යාපන අමාත්‍යාංශය<br><br>කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | සම්මත කිරීමට නියමිතය |

18 මෙය ප්‍රජාවන් තුළ ප්‍රධාන වශයෙන් සැලකිල්ලට ගත් කරුණක් වන බව උපදේශනවලදී විශේෂයෙන්ම සඳහන් විණි.

| ප්‍රධාන ක්‍රියාකාරකම් | දර්ශක | සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීමේ ක්‍රම | ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ ආයතන | සහාය දෙන ආයතන | | කාල රාමුව | නිරීක්ෂණ ආයතනය | අය වැය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රාජ්‍ය ක්‍රියාකාරකයන් | රාජ්‍ය නොවන ක්‍රියාකාරකයන් | | | |
| **2.14** එක්සත් ජාතීන්ගේ සංවිධානයෙහි රබාට් ක්‍රියාකාරී සැලැස්ම (Rabat plan of action) වැනි ජාත්‍යන්තර සම්මුති සහ 1981 ඔක්තෝබර් මස 14 වන දින අංක 162/5 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය වැනි දේශීය ප්‍රමිතීන් අනුව යෑමෙන් කාන්තාවන් සහ ජනවාර්ගික-ආගමික සුළුතරයන්ගේ ගරුත්වය රැකීම කෙරෙහි සැලකිල්ල යොමු කරමින් ආචාරශීලී වාර්තාකරණය තහවුරු කිරීම සඳහා මග පෙන්වීම් ද සමඟ මාධ්‍යවේදීන්ට ආචාර ධර්ම පද්ධතියක් හඳුන්වා දීම[19, 20] | ගොඩනගන ලද හා සංස්කරණය කරන ලද ආචාර ධර්ම පද්ධති සංඛ්‍යාව | ජනමාධ්‍ය අමාත්‍යාංශය | ජනමාධ්‍ය අමාත්‍යාංශය | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය<br><br>ජනමාධ්‍ය උසස් අධ්‍යාපන පර්යේෂණ සහ පුහුණු ආයතනය<br><br>ජාතික ළමා ආරක්ෂක අධිකාරිය | එක්සත් ජාතීන්ගේ ආයතන<br><br>සිවිල් සමාජ සංවිධාන<br><br>පර්යේෂණ ආයතන | 2023 ජන-දීර්ඝකාලීන | ජනමාධ්‍ය අමාත්‍යාංශය | සම්මත කිරීමට නියමිතය |

19 මෙම ඡේදය මගින් සාමාජීය හෝ ආගමික අසමගිය හෝ ප්‍රචණ්ඩත්වය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් යුතුව කිසියම් කරුණක් මුද්‍රණය කිරීමට හෝ ප්‍රකාශයට පත් කිරීම සඳහා වාර්තා කිරීම සිදු නොකළ යුතු බව කියැවේ.

20 උපදේශකවරුන් විශේෂයෙන් පෙන්වා දුන්නේ මාධ්‍ය මගින් කාන්තාවන් ඉලක්ක ගත කරමින් හෝ සුළුතරයට හෝ ජනවාර්ගික-ආගමික ප්‍රජාවන්ට අයිති වන පුද්ගලයන් ඉලක්ක කරමින් ඔවුන්ගේ පෞද්ගලිකත්වය උල්ලංඝණය වන අයුරින් වාර්තා කිරීම සිදුවන බවය.

| ප්‍රධාන ක්‍රියාකාරකම් | දර්ශක | සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීමේ ක්‍රම | ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ ආයතන | සහාය දෙන ආයතන | | කාල රාමුව | නිරීක්ෂණ ආයතනය | අය වැය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රාජ්‍ය ක්‍රියාකාරකයන් | රාජ්‍ය නොවන ක්‍රියාකාරකයන් | | | |
| **2.5** සියලුම රාජ්‍ය නිලධාරීන්ට ප්‍රාරම්භක පුහුණු තුළදී ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ මොඩියුලයක් ලබාදීම සහ කාන්තාව හා සාමය සහ ආරක්ෂාව පිළිබඳ න්‍යාය පත්‍රයෙහි කුලුන පදනම් අභ්‍යන්තර උද්දේශන ව්‍යාපාර ගොඩනැංවීම. | රජයේ නිලධාරීන්වෙනුවෙන් පැවති ස්ත්‍රී පුරුෂ සමාජභාවී සංවේදීකරණ පුහුණු වැඩසටහන් සංඛ්‍යාව<br><br>ස්ත්‍රී පුරුෂභාවය අනුව බෙදන ලද, එවැනි වැඩසටහන්වලට සහභාගී වූ රජයේ නිලධාරීන් සංඛ්‍යාව<br><br>රජයේ නිලධාරීන්අතර පවතින ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අගතීන් පිළිබඳව සිදු කරන ලද තක්සේරු සංඛ්‍යාව<br><br>වැඩසටහනට සහභාගි වීමෙන් මාස 6කට පසුව රජයේ නිලධාරීන් සමග පවත්වන ලද තක්සේරු සංඛ්‍යාව | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය<br><br>රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය<br><br>රාජ්‍ය සේවා කොමිෂන් සභාව | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය<br><br>කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | එක්සත් ජාතීන්ගේ ආයතන | 2023 ජන-2023 අගෝ | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | සම්මත කිරීමට නියමිතය |

## තේමාත්මක ප්‍රමුඛතාව 02:

# කාන්තාවන් විසින් අත්දකින ලද අවතැන් වීමෙන් ඇති වූ බලපෑම සම්බන්ධයෙන් කටයුතු කිරීම

**ක්‍රමෝපායාත්මක අරමුණු:**

1. දැනට පවත්නා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට සහාය වීම
2. ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සංවේදීත්වයක් ඇති විධිනියෝගයක් සහිතව අභ්‍යන්තරව අවතැන් වූවන්ගේ / ආපසු පැමිණි සරණාගතයන්ගේ අඛණ්ඩව පැන නගින අවශ්‍යතාවලට ප්‍රතිචාර දැක්වීම
3. ආපදා කළමනාකරණයේ දී කාන්තාවන්ගේ ගැටලු කෙරෙහි දක්වන ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සංවේදීතාව වැඩි දියුණු කිරීම සහ වැඩි කිරීම
4. කාන්තාවන් කෙරෙහි අවධානයක් යොමු කරමින් ගැටුමෙන් පීඩාවට පත් ජනයා පිළිබඳ සංවේදීභාවය ඉහළ නැංවීම

අවධාන ක්ෂේත්‍රය

# 03

## ගැටුම් ආශ්‍රිත අවතැන් වීමෙන් පීඩාවට පත් කාන්තාවන්ට සේවා සම්පාදනය[22]

| ප්‍රතිඵලය | වගකිව යුතු ආයතනය/නිලධාරියා |
|---|---|
| ගැටුමේ බලපෑමෙන් සහ ආපදාවල බලපෑමෙන් අවතැන් වීමට ලක් වී ඇති කාන්තාවන්ට ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳව සංවේදී, රාජ්‍ය අනුග්‍රහය ලැබෙන මනෝ සමාජ සේවා හා තිරසර විසඳුම් වෙත ප්‍රවේශය ලැබේ | • කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය |

| ප්‍රධාන ක්‍රියාකාරකම් | දර්ශක | සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීමේ ක්‍රම | ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ ආයතන | සහාය දෙන ආයතන | | කාල රාමුව | නිරීක්ෂණ ආයතනය | අය වැය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රාජ්‍ය ක්‍රියාකාරකයන් | රාජ්‍ය නොවන ක්‍රියාකාරකයන් | | | |
| **3.1** ගැටුම්වල බලපෑමෙන් අවතැන් වීම හේතුකොට ගෙන ඒ සඳහා කල් පවත්නා විසඳුම් ලබා දීමේ ජාතික ප්‍රතිපත්තිය[21] පූර්ණ ස්ත්‍රී පුරුෂ සමාජභාවී අන්තර්කරණයකින් යුක්තව ක්‍රියාත්මක කිරීම | ගැටුමේ බලපෑමෙන් අවතැන් වීම සම්බන්ධයෙන් කල් පවත්නා විසඳුම් ලබා දීමේ ජාතික ප්‍රතිපත්තිය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීම | රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | ජාතික සමගිය හා ප්‍රතිසන්ධානය සඳහා වනකාර්යාලය (ONUR) | මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය<br><br>සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය | එක්සත් ජාතීන්ගේ ආයතන | 2023 පෙබ -2023 අගෝ | අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | සම්මත කිරීමට නියමිතය. |

21 ගැටුමේ බලපෑමෙන් අවතැන් වීම සම්බන්ධයෙන් කල් පවත්නා විසඳුම් ලබා දීමේ ජාතික ප්‍රතිපත්තිය මනා සැලකිල්ල යොදමින් සම්පාදනය කරන ලද ප්‍රතිපත්තියක් වන අතර ගැටුම ආශ්‍රිත අවතැන් වීම සම්බන්ධ සියලු ගැටලුවලට ඵලදායක ලෙස ප්‍රතිචාර දැක්වීමට ඊට හැකියාව ඇත. මේ නිසා එම ප්‍රතිපත්තිය යටතේ ප්‍රතිඥා දී ඇති කැපවීම් මෙම ජාතික ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නැත.

| ප්‍රධාන ක්‍රියාකාරකම් | දර්ශක | සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීමේ ක්‍රම | ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ ආයතන | සහාය දෙන ආයතන | | කාල රාමුව | නිරීක්ෂණ ආයතනය | අය වැය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රාජ්‍ය ක්‍රියාකාරකයන් | රාජ්‍ය නොවන ක්‍රියාකාරකයන් | | | |
| **3.2** ගැටුම් ආශ්‍රිතව අවතැන් වූ කාන්තාවන්ගේ දැනට පවත්නා සහ අඛණ්ඩව පැන නගින මනෝ-සමාජ අවශ්‍යතා තක්සේරු කිරීම සඳහා වාර්ෂික ඇගයීම් සිදු කිරීම | ගැටුම් නිසා අවතැන් වී ඇති කාන්තාවන්ගේ මනෝ-සමාජ අවශ්‍යතා තක්සේරු කිරීම සඳහා සිදු කරන ලද සමීක්ෂණ සංඛ්‍යාව<br><br>අඛණ්ඩව පැන නගින සහ දැනට පවත්නා මනෝ සමාජ අවශ්‍යතාතක්සේරු කිරීම සඳහා සිදු කරන ලද සමීක්ෂණවලට සහභාගි වී ඇති කාන්තාවන් සංඛ්‍යාව<br><br>සමීක්ෂණවලින් පසුව මනෝ සමාජ සේවා සහාය ලබා ගැනීමට උත්සාහ කළ කාන්තාවන් සංඛ්‍යාව | සෞඛ්‍ය අමාත්‍යාංශය | මානසික සෞඛ්‍ය අංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය | දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල මනෝ සමාජයීය නිලධාරීන් සහකාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ ළමා හා කාන්තා සංවර්ධන ඒකකවල නිලධාරීන් | එක්සත් ජාතීන්ගේ ආයතන<br><br>පර්යේෂණ ආයතන | 2023 පෙබ-2027 අගෝ | සෞඛ්‍ය අමාත්‍යාංශය<br><br>කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | සම්මත කිරීමට නියමිතය |

| ප්‍රධාන ක්‍රියාකාරකම් | දර්ශක | සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීමේ ක්‍රම | ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ ආයතන | සහාය දෙන ආයතන | | කාල රාමුව | නිරීක්ෂණ ආයතනය | අය වැය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රාජ්‍ය ක්‍රියාකාරකයන් | රාජ්‍ය නොවන ක්‍රියාකාරකයන් | | | |
| **3.3** ගැටුම් ආශ්‍රිත අවතැන්වීම මගින් බලපෑමට ලක් වූ කාන්තාවන්ට ජීවනෝපාය ක්‍රියාකාරකම්වල නියැලීම සඳහා ඇති ධාරිතාව සහ අවශ්‍යතා පිළිබඳව තක්සේරුවක් සිදු කිරීම සහ ජීවනෝපාය මාර්ගවලට අවතීර්ණ වීම සඳහා අවශ්‍ය සහාය ලබා දීම | ගැටුම් ආශ්‍රිත අවතැන්වීම මගින් බලපෑමට ලක් වූ කාන්තාවන්ට ජීවනෝපාය ක්‍රියාකාරකම්වල නියැලීම සඳහා ඇති කුසලතා මට්ටම, කැමැත්ත, කායික සහ මානසික සෞඛ්‍යයේ ස්වභාවය පිළිබඳව සිදුකරන ලද අධ්‍යයන සංඛ්‍යාව<br><br>අධ්‍යයනවලට ප්‍රතිචාර දක්වමින් ජීවනෝපාය ක්‍රියාකාරකම්වල නිරත වීම සඳහා කාන්තාවන්ගේ කුසලතා සංවර්ධනයට පවත්වන ලද පුහුණු සංඛ්‍යාව | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය<br><br>දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල<br><br>වනිතා සංවර්ධන නිලධාරීන් | එක්සත් ජාතීන්ගේ ආයතන | 2023 පෙබ -2024 නොවැ | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | සම්මත කිරීමට නියමිතය |

| ප්‍රධාන ක්‍රියාකාරකම් | දර්ශක | සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීමේ ක්‍රම | ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ ආයතන | සහාය දෙන ආයතන | | කාල රාමුව | නිරීක්ෂණ ආයතනය | අය වැය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රාජ්‍ය ක්‍රියාකාරකයන් | රාජ්‍ය නොවන ක්‍රියාකාරකයන් | | | |
| **3.4**<br>උප්පැන්න සහතික, පුරවැසි සහතික ලබා ගැනීම සඳහා අනුග මනය කළ යුතු අදාළ පරිපාලන ක්‍රියාවලිය පිළිබඳව දැනුවත් කරමින් ආපසු පැමිණි සරණාගතයන්ට විශේෂයෙන් ම දරුවන් සමග ආපසු පැමිණි කාන්තා ගෘහමූලික කුටුම්බවලට සහාය විය හැකි නිලධාරීන් සහිතව බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ තුළ (භාෂා තුනෙන් ම සහ සංඥා භාෂාවෙන් සේවා සම්පාදනය කෙරෙන) තොරතුරු කවුළුවක් ස්ථාපිත කිරීම[22] | ගුවන් තොටුපොළෙහි ස්ථාපිත තොරතුරු කවුළු සංඛ්‍යාව<br><br>තොරතුරු කවුළුවේ සේවයෙහි යොදවා ඇති නිලධාරීන් සංඛ්‍යාව<br>වසරකට ආපසු පැමිණි සරණාගතයන් සංඛ්‍යාව<br><br>තොරතුරු කවුළුවෙන් සේවාවන් ලබා ගන්නා ආපසු පැමිණි සරණාගතයන් සංඛ්‍යාව | ආගමන විගමන දෙපාර්තමේන්තුව | ආගමන විගමන දෙපාර්තමේන්තුව | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ උපත් ලියාපදිංචි කිරීමේ ඒකකය | එක්සත් ජාතීන්ගේ ආයතන | 2023 ජන-දිගු කාලීන | රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | රු. 119 000.00 |

22 මෙය ආපසු පැමිණෙන දරුවන් සහිත කාන්තා ගෘහ මූලික කුටුම්බ වෙනුවෙන් විශේෂ සහාය දක්වමින් සිදු කළ යුතු බව සහභාගි වූවෝ යෝජනා කළහ.

| ප්‍රධාන ක්‍රියාකාරකම් | දර්ශක | සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීමේ ක්‍රම | ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ ආයතන | සහාය දෙන ආයතන | | කාල රාමුව | නිරීක්ෂණ ආයතනය | අය වැය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රාජ්‍ය ක්‍රියාකාරකයන් | රාජ්‍ය නොවන ක්‍රියාකාරකයන් | | | |
| **3.5**<br>ප්‍රමිතිගත මාර්ගෝපදේශ සකස් කිරීම මගින් ආපසු පැමිණි සරණාගතයන් සිය සරණාගත කාල පරිච්ඡේදය තුළ දී වෙනත් රටවලින් ලබා ගෙන ඇති සුදුසුකම් තක්සේරුව ප්‍රමිතිගත කිරීම[23] | අධ්‍යාපන සහ වෘත්තීය නිපුණතා සම්බන්ධයෙන් සැකසූ ප්‍රමිතිකරණ ප්‍රතිපත්ති සංඛ්‍යාව<br><br>වසරකට අධ්‍යාපන සුදුසුකම් සහ/හෝ වෘත්තීය නිපුණතා ප්‍රමිතිගත කරන ලෙස අයැදුම් කළ ආපසු පැමිණි සරණාගතයන් සංඛ්‍යාව | අධ්‍යාපන අමාත්‍යාංශය | අධ්‍යාපන අමාත්‍යාංශය | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරිය<br><br>ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය | එක්සත් ජාතීන්ගේ ආයතන | 2023 පෙබ-2024 ඔක් | අධ්‍යාපන අමාත්‍යාංශය<br><br>කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | සම්මත කිරීමට නියමිතය |
| **3.6**<br>ගැහැණු ළමයින්ගේ අධ්‍යාපනය පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරමින් ගැටුම් ආශ්‍රිත අවතැන් වීම් හේතුවෙන් පීඩාවට පත් කාන්තාවන්ට සහ ගැහැණු ළමයින් සඳහා අධ්‍යාපන පහසුකම් සම්පාදනය කිරීම සහ කාන්තාවන්ට අධ්‍යාපනය සඳහා දෙවෙනි අවස්ථාවක්[24] ලබා දීම | අධ්‍යාපන අවස්ථාලබා ගත් ගැටුම් හේතුවෙන් අවතැන් වූ කාන්තාවන් හා ගැහැණු දරුවන් සංඛ්‍යාව<br><br>අධ්‍යාපනය සඳහා දෙවෙනි අවස්ථාවක් ලබා ගත් ගැටුම් හේතුවෙන් අවතැන් වූ කාන්තාවන් හා ගැහැණු දරුවන් සංඛ්‍යාව | ජාතික සමගිය හා ප්‍රතිසන්ධානය සඳහා වන කාර්යාලය | අධ්‍යාපන අමාත්‍යාංශය | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | එක්සත් ජාතීන්ගේ ආයතන | 2023 පෙබ- දිගු කාලීන | අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය<br><br>අධ්‍යාපනය අමාත්‍යංශය<br><br>කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | සම්මත කිරීමට නියමිතය |

23 මෙම ක්‍රියාකාරකම එක් කර ඇත්තේ උපදේශනවලට පැමිණි සහභාගි වූ පුද්ගලයන් විසින් මතු කරන ලද ගැටලුවලට ප්‍රතිචාර වශයෙනි. ප්‍රමිතීන් අනුව ගත් විට සරණාගතයන් ඉන්දියාවේ දී සහ වෙනත් රටවල දී ලබා ගෙන ඇති සුදුසුකම් ශ්‍රී ලංකාවේ සුදුසුකම්වලට සමාන ද යන්න ඇගයීම සඳහා ශ්‍රී ලංකාව තුළ යාන්ත්‍රණයක් නොමැති බව සමහර සහභාගිකයෝ සඳහන් කළහ. රැකියාවක් සොයා ගැනීම සහ/හෝ ආපසු පැමිණි පසු සිය අධ්‍යාපන කටයුතු අඛණ්ඩව කර ගෙන යෑම සඳහා ආපසු පැමිණෙන එවැනි සමහර සරණාගතයන්ට තිබෙන හැකියාව කෙරෙහි මෙය බලපාන බව සලකනු ලැබිණ. එම නිසා එවැනි සුදුසුකම් ශ්‍රේණි ශ්‍රී ලංකාවේ සුදුසුකම් සමග සැසඳෙන්නේ ද යන්න සොයා දැන ගැනීම සඳහා සුදුසුකම් තක්සේරුව ප්‍රමිතිගත කිරීමක් සිදු විය යුතු යැයි යෝජනා කරනු ලැබිණ.

24 'දෙවන අවස්ථාව' යන යෙදුම උපදේශනවලදී විශේෂයෙන්ම යෝජනා කෙරිණි. එහිදී ඉදිරිපත් වූ තර්කය වූයේ, අවතැන් වීමෙන් හා/හෝ ගැටුම්වල බලපෑමට ලක් වීමෙන් අධ්‍යාපනය හැර දැමීමට සිදු වූ කාන්තාවන්ට දෙවන අවස්ථාවක් ලබා දිය යුතු බවයි.

| ප්‍රධාන ක්‍රියාකාරකම් | දර්ශක | සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීමේ ක්‍රම | ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ ආයතන | සහාය දෙන ආයතන | | කාල රාමුව | නිරීක්ෂණ ආයතනය | අය වැය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රාජ්‍ය ක්‍රියාකාරකයන් | රාජ්‍ය නොවන ක්‍රියාකාරකයන් | | | |
| **3.7** ගැටුම් හේතුවෙන් අවතැන් වී තාවකාලික වාසස්ථානවල ජීවත් වන කාන්තාවන් හා පවුල් සඳහා ආරක්ෂිත ජල හා සනීපාරක්ෂක පහසුකම් සම්පාදනය කිරීම | ආරක්ෂිත ජල හා සනීපාරක්ෂක පහසුකම් සම්පාදනය කිරීම සඳහා සකසා ඇති හා ක්‍රියාත්මක මාර්ගෝපදේශ සංඛ්‍යාව<br><br>තාවකාලික නිවාසවල ජීවත්වෙමින් ප්‍රාථමික සේවා සලසා ගන්නා ගෘහයන් සංඛ්‍යාව | ජාතික සමගිය හා ප්‍රතිසන්ධානය සඳහා වන කාර්යාලය | පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව<br><br>ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය | සෞඛ්‍ය අමාත්‍යාංශය<br><br>කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | එක්සත් ජාතීන්ගේ ආයතන | 2023 පෙබ-2025 ජන | ජාතික සමගිය හා ප්‍රතිසන්ධානය සඳහා වන කාර්යාලය<br><br>කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | සම්මත කිරීමට නියමිතය |

අවධාන ක්ෂේත්‍රය

# 04

## ස්වාභාවික ආපදාවලින් පීඩාවට පත් ජනයාට ආරක්ෂිත හා ප්‍රවේශ විය හැකි ආරක්ෂිත නිවාස පහසුකම්

| ප්‍රතිඵලය | වගකිව යුතු ආයතනය/නිලධාරියා |
|---|---|
| ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳව සංවේදී සහ නියමානුකූල ආපදා කළමනාකරණ යාන්ත්‍රණ වෙත කාන්තාවන්ට ප්‍රවේශය ලැබේ | • ආරක්ෂක අමාත්‍යාංශය - ආපදා කළමනාකරණ අංශය |

| ප්‍රධාන ක්‍රියාකාරකම් | දර්ශක | සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීමේ ක්‍රම | ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ ආයතන | සහාය දෙන ආයතන | | කාල රාමුව | නිරීක්ෂණ ආයතනය | අය වැය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රාජ්‍ය ක්‍රියාකාරකයන් | රාජ්‍ය නොවන ක්‍රියාකාරකයන් | | | |
| **4.1** ආපදාවලින් අවතැන්වීම්වලින් බලපෑමට ලක්වූ කාන්තාවන් සහ ගැහැණු ළමයින් සඳහා ප්‍රමාණවත් සේවාව සැපයීම තහවුරු කිරීම[25, 26] | ආරක්ෂිත කඳවුරුවල කළමනාකරුවන්ට ලබා දෙන අත් පොතෙහ[27] ඇති මාර්ගෝපදේශන අනුගමනය කරන ආරක්ෂිත කඳවුරු සංඛ්‍යාව<br><br>ජල, සෞඛ්‍ය හා සනීපාකරක්ෂක (WASH)[28] සම්මත සම්පාදනය කරන ආරක්ෂිත කඳවුරු සංඛ්‍යාව<br><br>ශ්‍රී ලංකාවට ගැලපෙන ලෙස SPHERE සම්මත අනුග මනය කරන ආරක්ෂිත කඳවුරු සංඛ්‍යාව | ආරක්ෂක අමාත්‍යාංශය<br><br>ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය | ආරක්ෂක අමාත්‍යාංශය<br><br>ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය | ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය -ජාතික සභාව<br><br>දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල (ආපදාවලට ගොදුරු විය හැකි ප්‍රදේශවල සමීක්ෂණය සිදු කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල අදාළ නිලධාරින් වගකිව යුතු බලධාරීන් සමග සහයෝග යෙන් කටයුතු කළ යුතු යැයි අපේක්ෂා කෙරේ)<br><br>රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය<br><br>වාරිමාර්ග දෙපාර්තමේන්තුව[29]<br><br>සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය<br><br>කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | සිවිල් සමාජ සංවිධාන<br><br>පර්යේෂණ ආයතනය | 2023 ජන-2027 අගෝ | ආරක්ෂක අමාත්‍යාංශය<br><br>ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය<br><br>කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | සම්මත කිරීමට නියමිතය |

25 මෙය පවත්නා ආරක්ෂිත කඳවුරු නවීකරණය කිරීමෙන් හෝ ආපදා ඇති වීමට නැඹුරුතාවක් දක්වන ප්‍රදේශවල නව කඳවුරු ගොඩනැගීමෙන් ප්‍රමාණවත් සහ ලබාගත හැකි ආකාරයෙන් සනීපාරක්ෂක සෞඛ්‍ය නිෂ්පාදන සහ වෙනත් මූලික අවශ්‍යතා ඇති බව තහවුරු කිරීම, කාන්තාවන්ගේ සෞඛ්‍ය සහ පෞද්ගලිකත්වය වෙනුවෙන් ආරක්ෂිත අවකාශ ඇති බව තහවුරු කිරීම (උදාහරණ මවුකිරි දීමේ අවකාශ, වෙන් කරන ලද සනීපාරක්ෂක පහසුකම් සහ අඩු වියදමින් සිදු කරන වෙන් කළ ප්‍රදේශ සැකසීම ආදිය) ඔස්සේ කළ හැකිය.

26 ගංවතුර, නාය යෑම් හා පරිසර දූෂණය ආශ්‍රිත අවතැන් වීම් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළ යුතු ය. (රත්නපුර සහ කෑගල්ලේ දී නියමු කටයුතු සිදු කිරීමට නියමිත ය.) මෙවැනි පියවර ගත යුත්තේ කාන්තාවන් සහ අදාළ පාර්ශවකරුවන් සමග අදහස් හුවමාරු කරගැනීමෙන් පසුව බවද සහභාගි වූ උපදේශකයන් විසින් යෝජනා කරන ලදී.

| ප්‍රධාන ක්‍රියාකාරකම් | දර්ශක | සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීමේ ක්‍රම | ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ ආයතන | සහාය දෙන ආයතන | | කාල රාමුව | නිරීක්ෂණ ආයතනය | අය වැය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රාජ්‍ය ක්‍රියාකාරකයන් | රාජ්‍ය නොවන ක්‍රියාකාරකයන් | | | |
| **4.2**<br>ස්වාභාවික ආපදාවලදී අභ්‍යන්තරව අවතැන් වූවන්ගේ කඳවුරු තුළ පිසූ ආහාර ද ඇතුළුව මූලික අවශ්‍යතා නියමානුකූල ආකාරයකින් සම්පාදනය කිරීම සඳහා සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි සකස් කිරීම හා යොදා ගැනීම.[30] | අවතැන් වූවන්ට නියමානුකූල අයුරින් මූලික අවශ්‍යතා ලබාදීම සඳහා සකස් කළ මාර්ගෝපදේශ / සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි සංඛ්‍යාව | ආරක්ෂක අමාත්‍යාංශය<br><br>ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය | ආරක්ෂක අමාත්‍යාංශය<br><br>ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය | ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය -ජාතික සභාව | සිවිල් සමාජ සංවිධාන | 2023 ජන-2024 ඔක් | ආරක්ෂක අමාත්‍යාංශය<br><br>ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය<br><br>කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | |

27 DMC, UNFPA, IOM හා UNICEF මගින් සකසා ඇත.
28 WASH මාර්ගෝපදේශන ලබා ගැනීම සඳහා https://www.humanitarianlibrary.org/sites/default/files/2018/11/Water%2C%20Sanitation%20and%20Hygiene%20%28WASH%29%20Guideline-Swiss%20Red%20Cross.pdf
29 SPHERE guidelines are available at https://spherestandards.org/wp-content/uploads/Sphere-Handbook-2018-EN.pdf
30 ප්‍රදානය කරන පිසූ ආහාර අපතේ යෑම වැළැක්වීම, අපද්‍රව්‍ය බැහැර කිරීමේ පද්ධතියක් හඳුන්වා දීම තහවුරු කිරීම, ඔවුන්ගේ වාර්ගික/ ආගමික සහ විශේෂ සෞඛ්‍ය අවශ්‍යතාවලට ගැලපෙන පරිදි කාන්තාවන්ට සුදුසු පෝෂණ සහ සෞඛ්‍ය ආරක්ෂණ පහසුකම් ලබා ගැනීමට ඇති බව තහවුරු කිරීම සඳහා මෙය උපදේශනවලදී යෝජනා වන ලදී.

තේමාත්මක ප්‍රමුඛතාව 03:

# හමුදා සහ පොලිස් වැන්දඹුවන්, හිටපු කාන්තා සටන්කරුවන් සහ කාන්තා ගෘහමූලික කුටුම්බ මුහුණ දෙන ගැටලුවලට විසඳුම් ලබා දීම

**ක්‍රමෝපායාත්මක අරමුණු:**

1. හමුදා වැන්දඹුවන්, හිටපු කාන්තා සටන්කරුවන් හා කාන්තා ගෘහමූලික කුටුම්බවල අවශ්‍යතා හඳුනා ගැනීම, ප්‍රමුඛතාකරණය කිරීම සහ ඒවාට විසඳුම් ලබා දීම
2. හඳුනාගත් කාන්තා කණ්ඩායම් සැලකිල්ලට ගනිමින් දැනට පවත්නා නීති හා ප්‍රතිපත්ති ඇගයීම සහ එවැනි නීති හා ප්‍රතිපත්ති ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳව සංවේදී කිරීම
3. අවශ්‍ය අවස්ථාවල දී ගෙවීම් සහ/හෝ වන්දි යෝජනා ක්‍රම යොදා ගැනීම හෝ දැනට පවත්නා යෝජනා ක්‍රම නියමානුකූල කිරීම
4. හමුදා වැන්දඹුවන්, හිටපු කාන්තා සටන්කරුවන් හා කාන්තා ගෘහමූලික කුටුම්බ අඛණ්ඩව අත්දකින මනෝ සමාජ අවශ්‍යතාවලට විසඳුම් ලබා දීම
5. හමුදා වැන්දඹුවන්, හිටපු කාන්තා සටන්කරුවන් හා කාන්තා ගෘහමූලික කුටුම්බ අතර තිරසර ජීවනෝපාය මාර්ග ප්‍රවර්ධනය කිරීම
6. රාජ්‍ය නිලධාරීන්, වෛද්‍ය නිලධාරීන් සහ වෙනත් අදාළ නිලධාරීන් විසින් සම්පාදනය කෙරෙන සේවා වැඩි දියුණු කිරීමේ දැක්මකින් යුතුව සුවිශේෂී තත්ත්වයන්ගේ ස්වභාවයන් සහ හමුදා වැන්දඹුවන්, හිටපු කාන්තා සටන්කරුවන් හා කාන්තා ගෘහමූලික කුටුම්බ මුහුණ දෙන ගැටලු පිළිබඳව එම නිලධාරීන් සංවේදී කිරීම

අවධාන ක්ෂේත්‍රය

# 05

## හමුදා වැන්දඹුවන්, හිටපු කාන්තා සටන්කරුවන් සහ කාන්තා ගෘහමූලික කුටුම්බ මුහුණ දෙන ගැටලුවලට විසඳුම් ලබා දීම

| ප්‍රතිඵලය | වගකිව යුතු ආයතනය/නිලධාරීයා |
|---|---|
| හමුදා වැන්දඹුවන්, හිටපු කාන්තා සටන්කරුවන් සහ කාන්තා ගෘහමූලික කුටුම්බවලට සිය ජීවන තත්ත්වය වැඩි දියුණු කරන ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳව සංවේදී රාජ්‍ය සේවා වෙත වැඩි ප්‍රවේශයක් ලැබේ | • ආරක්ෂක අමාත්‍යාංශය<br>• කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය |

| ප්‍රධාන ක්‍රියාකාරකම් | දර්ශක | සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීමේ ක්‍රම | ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ ආයතන | සහාය දෙන ආයතන | | කාල රාමුව | නිරීක්ෂණ ආයතනය | අය වැය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රාජ්‍ය ක්‍රියාකාරකයන් | රාජ්‍ය නොවන ක්‍රියාකාරකයන් | | | |
| **5.1** හමුදා සහ පොලිස් වැන්දඹුවන්ට හිමි වරප්‍රසාද එලදායී ලෙස සහ නොකඩවා සපයා දෙන බව තහවුරු කිරීම සඳහා පවත්නා ක්‍රමවේද විමර්ශනයට ලක් කිරීම[31] | පවත්නා ක්‍රමවේද විමර්ශනයට ලක් කිරීම සම්පූර්ණ කිරීම<br><br>සිදු කරන ලැබූ විමර්ශන අනුව ඉදිරිපත් කරන ලද නිර්දේශ සංඛ්‍යාව | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | ආරක්ෂක අමාත්‍යාංශය<br><br>මහජන ආරක්ෂක අමාත්‍යාංශය | රණවිරු සේවා අධිකාරිය | සිවිල් සමාජ සංවිධාන | 2023 ජන-2024 අගෝ | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය<br><br>ආරක්ෂක අමාත්‍යාංශය | සම්මත කිරීමට නියමිතය |

31 හමුදා වැන්දඹුවන් තම සිවිල් තත්ත්වයෙහි වෙනසක් සිදු වී නැති බව තහවුරු කරමින් සෑම තුන් මසකට වරක් ම ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතු බව උපදේශනවලදී පැවසිණි. ප්‍රකාශය ඉදිරිපත් කිරීම පමා වුව හොත් ඔවුන්ගේ ගෙවීම් අහිමි වේ. තමන් වෙනත් වෛවාහික සම්බන්ධතාවකට එළඹුණ හොත් තම මිය ගිය කලත්‍රයා වෙනුවෙන් තමන්ට ලැබෙන ගෙවීම් නතර කෙරෙන බව පැමිණ සිටි හමුදා වැන්දඹුවන් විසින් ප්‍රකාශ කෙරිණ. ග්‍රාම නිලධාරීවරුන් ඇතැම් හමුදා වැන්දඹුවන් සහකරුවන් සමග අඹුසැමියන් මෙන් වාසය කරන බව අදාළ බලධාරීන්ට දැනුම් දී ඇති සහ එවැනි තොරතුරු නිසා ඔවුන්ගේ ගෙවීම් අහිමි වී ඇති සිදුවීම් සමහරක් අනාවරණ විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස සිදු වන වෙනස්කම් කිරීමට මෙම ජාතික ක්‍රියාකාරී සැලැස්ම හරහා විසඳුම් ලබා දීමට අපේක්ෂා කෙරිණ.

| ප්‍රධාන ක්‍රියාකාරකම් | දර්ශක | සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීමේ ක්‍රම | ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ ආයතන | සහාය දෙන ආයතන | | කාල රාමුව | නිරීක්ෂණ ආයතනය | අය වැය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රාජ්‍ය ක්‍රියාකාරකයන් | රාජ්‍ය නොවන ක්‍රියාකාරකයන් | | | |
| **5.2** ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා නිර්දේශ සහිතව දැනට පවත්නා නීති හා ප්‍රතිපත්තිවලින් ස්වේච්ඡා සේවා භටයන්ගේ වැන්දඹුවන් ද ඇතුළුව හමුදා සහ පොලිස් වැන්දඹුවන්ට ඇති වන බලපෑම ඇගයීමට ලක් කරමින් තොරතුරු හා උපදෙස් සංක්ෂිප්තයක් කෙටුම්පත් කිරීම | නියමිත කාල සීමාව තුළ තොරතුරු හා උපදෙස් සංක්ෂිප්තය සකසා අවසන් කිරීම | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | ආරක්ෂක අමාත්‍යාංශය<br><br>මහජන ආරක්ෂක අමාත්‍යාංශය<br><br>රණවිරු සේවා අධිකාරිය | පර්යේෂණ ආයතන | 2023 පෙබ-2023 අගෝ | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය<br><br>ආරක්ෂක අමාත්‍යාංශය | සම්මත කිරීමට නියමිතය |
| **5.3** රණවිරුවන් සඳහා කැප කළ ගම්මාන (රණවිරු ගම්මාන) තුළ හමුදා වැන්දඹුවන් සහ ඔවුන්ගේ තීරණ ගැනීමේ හැකියාවන් බලාත්මක කිරීමට පියවර ගැනීම[32] | හමුදා වැන්දඹුවන්ගේ ජීවිතයේ තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා ගත් නව පියවර සංඛ්‍යාව | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | ආරක්ෂක අමාත්‍යාංශය<br><br>රණවිරු සේවා අධිකාරිය | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | සිවිල් සමාජ සංවිධාන | 2023 පෙබ-2024 ජන | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය<br><br>ආරක්ෂක අමාත්‍යාංශය | සම්මත කිරීමට නියමිතය |

32 එවැනි ගම්මාන තුළ තීරණ ගැනීමේ කාරණාවලට සම්බන්ධ වීමෙහි ලා තමන්ට අවස්ථාවක් ලබා නොදන පරිදි බලය කේන්ද්‍රගතව පවත්නා බව අවධාන කණ්ඩායම් සාකච්ඡාවලට පැමිණි හමුදා වැන්දඹුවෝ ප්‍රකාශ කළහ. තීරණ ගැනීම මුළුමනින් ම පාහේ සිදු කරනු ලබන්නේ එම ගම්මානවල පුරුෂයන් විසින් බව ඔවුහු සඳහන් කළහ.

| ප්‍රධාන ක්‍රියාකාරකම් | දර්ශක | සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීමේ ක්‍රම | ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ ආයතන | සහාය දෙන ආයතන | | කාල රාමුව | නිරීක්ෂණ ආයතනය | අය වැය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රාජ්‍ය ක්‍රියාකාරකයන් | රාජ්‍ය නොවන ක්‍රියාකාරකයන් | | | |
| **5.4** හිටපු කාන්තා සටන්කරුවන්ට සෘණාත්මක ලෙස බලපාන සහ ඔවුන්ගේ පෞද්ගලිකත්වයට බලපාන ආරක්ෂක නිරීක්ෂණ පියවර අතරට ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳව සංවේදී පියවර හඳුන්වා දීම[33] | රාජ්‍ය නිලධාරීන් උදෙසා ක්‍රියාත්මක කරන ලද සංවේදීකරණ වැඩසටහන් සංඛ්‍යාව<br><br>සංවේදී කරන ලද නිලධාරීන් සංඛ්‍යාව<br><br>දැන් පවත්නා තත්ත්වය වෙනස් කිරීම සඳහා ගත් පියවර සංඛ්‍යාව<br><br>යොදා ගත් ප්‍රතිපත්තිවලින්/ ආරක්ෂණ නිරීක්ෂණ පියවර වැඩි දියුණුභාවය පිළිබඳ වාර්තා කරන ලද හිටපු කාන්තා සටන්කරුවන් ප්‍රතිශතය | ආරක්ෂක අමාත්‍යාංශය | ආරක්ෂක අමාත්‍යාංශය | කොමසාරිස් ජනරාල් කාර්යාංශය - පුනරුත්ථාපන | සිවිල් සමාජ සංවිධාන | 2023 පෙබ-2024 ජන | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය<br><br>ආරක්ෂක අමාත්‍යාංශය | සම්මත කිරීමට නියමිතය |

33 සන්ධ්‍යා කාලවල දී සහ/හෝ කාන්තා නිලධාරීන් යොදා ගනිමින් සිදු කෙරෙන එවැනි සමහර ආරක්ෂක නිරීක්ෂණ භාවිතය තම ජීවිතවලට සෘණාත්මක ලෙස බලපාන බව සහ එහි ප්‍රතිඵලයක් ලෙස ගමේ ප්‍රජාවෙන් බැහැර කෙරෙන බව අවධාන කණ්ඩායම් සාකච්ඡාවල දී හිටපු සටන්කරුවෝ සඳහන් කළහ.

| ප්‍රධාන ක්‍රියාකාරකම් | දර්ශක | සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීමේ ක්‍රම | ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ ආයතන | සහාය දෙන ආයතන | | කාල රාමුව | නිරීක්ෂණ ආයතනය | අය වැය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රාජ්‍ය ක්‍රියාකාරකයන් | රාජ්‍ය නොවන ක්‍රියාකාරකයන් | | | |
| **5.5**<br>වඩාත් ඵලදායක ලෙස සහ ආත්ම විශ්වාසයෙන් යුතුව සමාජගතවීම සඳහා හිටපු කාන්තා සටන්කරුවන් උදෙසා දුක් ගැනවිලි කළමනාකරණය කිරීමේ ඵලදායක යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම සහ මනෝ-සමාජ උපදේශනය හඳුන්වා දීම | දැනට පවත්නා තත්ත්වය වෙනස් කිරීම සඳහා ගත් පියවර සංඛ්‍යාව<br><br>ඉලක්ක ගත කළ සහ තිරසාර මනෝ සමාජයීය උපදේශන වෙත පිවිසීමේ අවස්ථාව ලද හිටපු කාන්තා සටන්කරුවන්ගේ ප්‍රතිශතය | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | ආරක්ෂක අමාත්‍යාංශය<br><br>ශ්‍රී ලංකා ජාතික උපදේශකවරුන්ගේ සංගමය<br><br>පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශය<br><br>සෞඛ්‍ය අමාත්‍යාංශය | සිවිල් සමාජ සංවිධාන | 2023 පෙබ-2024 ජන | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය<br><br>ආරක්ෂක අමාත්‍යාංශය | සම්මත කිරීමට නියමිතය |
| **5.6**<br>හිටපු කාන්තා සටන්කරුවන්ට සේවා සම්පාදනය කරන හෝ ඔවුන් සමග කටයුතු කරන රාජ්‍ය නිලධාරීන් උදෙසා ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා ගැටුම් පිළිබඳ සංවේදීතා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම[34] | රාජ්‍ය නිලධාරීන් උදෙසා ක්‍රියාත්මක කරන ලද සංවේදීකරණ වැඩසටහන් සංඛ්‍යාව<br><br>සංවේදීකරණය කරන ලද නිලධාරීන්ගේ ප්‍රතිශතය | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | ආරක්ෂක අමාත්‍යාංශය<br><br>රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය<br><br>රාජ්‍ය බැංකු නිලධාරීන්<br><br>ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය<br><br>ජාතික කාන්තා කමිටුව | පර්යේෂණ ආයතන | 2023 පෙබ-2025 අගෝ | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය<br><br>ආරක්ෂක අමාත්‍යාංශය | සම්මත කිරීමට නියමිතය |

34 පුනරුත්ථාපන සහතිකය තමන් සතු වුව ද ණය ලබා ගැනීමට උත්සාහ කිරීමේ දී තමන් ක්‍රියා පටිපාටිමය දුෂ්කරතාවලට මුහුණ දෙන බව උපදේශනවලට සහභාගි වූ හිටපු සටන්කරුවෝ ප්‍රකාශ කළහ. මෙය සිදු වන්නේ සැබෑ මාර්ගෝපදේශවලින් ඉල්ලා සිටින්නේ කවර හෝ ඇපකරුවන් දෙදෙනෙකු වුවත් රජයේ සේවකයෙකු ඇතුළුව ඇපකරුවන් දෙදෙනෙකු සිටිය යුතු යැයි බැංකු නිලධාරීන් විසින් අවධාරණය කරනු ලැබීම නිසා ය. එම නිසා රාජ්‍ය බැංකුවල නිලධාරීන් ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ හිටපු සටන්කරුවන් මුහුණ දෙන විශේෂිත අභියෝග පිළිබඳව සංවේදී කළ යුතු යැයි සලකනු ලැබේ.

| ප්‍රධාන ක්‍රියාකාරකම් | දර්ශක | සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීමේ ක්‍රම | ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ ආයතන | සහාය දෙන ආයතන | | කාල රාමුව | නිරීක්ෂණ ආයතනය | අය වැය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රාජ්‍ය ක්‍රියාකාරකයන් | රාජ්‍ය නොවන ක්‍රියාකාරකයන් | | | |
| **5.7** හිටපු කාන්තා සටන්කරුවන්ගේ දැන් පවත්නා තත්ත්වය සහ ආදායම් උත්පාදන හැකියාව පිළිබඳව තක්සේරුවක් සිදු කිරීම සහතක්සේරු වාර්තාව සැලකිල්ලට ගනිමින් ඔවුන්ගේ ආර්ථික බල ගැන්වීම වැඩි කිරීම සඳහා උදව් වීමට අදාළ බලධාරීන් වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම | හිටපු කාන්තා සටන්කරුවන්ගේ දැන් පවත්නා තත්ත්වය සහ ආදායම් උත්පාදන හැකියාව පිළිබඳව සිදු කරන ලද තක්සේරු සංඛ්‍යාව<br><br>තක්සේරුව අනුව සකස් කරන ලද නිර්දේශ සංඛ්‍යාව | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශය<br><br>ආරක්ෂක අමාත්‍යාංශය | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | සිවිල් සමාජ සංවිධාන<br><br>පර්යේෂණ ආයතන | 2023 ජන -2024 ඔක් | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය<br><br>ආරක්ෂක අමාත්‍යාංශය | සම්මත කිරීමට නියමිතය |
| **5.8** ස්ත්‍රී පුරුෂ සමාජභාවය, ගැටුම් හා කම්පන තත්ත්ව පිළිබඳව සංවේදී භාවිත සම්බන්ධයෙන් වෛද්‍ය වෘත්තීයවේදීන් පුහුණු කිරීම සහ හිටපු සටන්කරුවන්ගේ අඛණ්ඩව පැන නගින වෛද්‍ය අවශ්‍යතා සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී මනුෂ්‍යත්වයෙන්, අපක්ෂපාතීව සහ වෘත්තීයවේදී භාවයෙන් යුතුව ක්‍රියා කිරීමට ඔවුන්ට සහාය වීම | වෛද්‍ය නිලධාරීන්උදෙසා ක්‍රියාත්මක කරන ලද සංවේදීකරණ වැඩසටහන් සංඛ්‍යාව<br><br>සංවේදී කරන ලද නිලධාරීන්<br><br>වඩාත් සංවේදීකරන ලද වෛද්‍ය සේවා සහ පහසුවෙන් ලබා ගත හැකි අයුරින් පවතින සෞඛ්‍ය සේවා වෙත ප්‍රවේශ වන හිටපු කාන්තා සටන්කරුවන් | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | සෞඛ්‍ය අමාත්‍යාංශය | ආරක්ෂක අමාත්‍යාංශය<br><br>පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශය | සිවිල් සමාජ සංවිධාන | 2023 පෙබ -2024 අගෝ | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය<br><br>ආරක්ෂක අමාත්‍යාංශය | සම්මත කිරීමට නියමිතය |

| ප්‍රධාන ක්‍රියාකාරකම් | දර්ශක | සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීමේ ක්‍රම | ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ ආයතන | සහාය දෙන ආයතන | | කාල රාමුව | නිරීක්ෂණ ආයතනය | අය වැය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රාජ්‍ය ක්‍රියාකාරකයන් | රාජ්‍ය නොවන ක්‍රියාකාරකයන් | | | |
| **5.9**<br>කාන්තා ගෘහමූලික කුටුම්බ පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමට පෙර කාන්තා ගෘහමූලික කුටුම්බ සම්බන්ධයෙන් පැහැදිලි නිර්වචනයක් සම්මත කර ඇතුළත් කිරීම | අදාළ නිර්වචන සකස් කිරීම සඳහා පාර්ශ්වකරුවන් සමග සිදු කළ උපදේශන සංඛ්‍යාව<br><br>උපදෙස් ලබා ගත් පාර්ශ්වකරුවන් සංඛ්‍යාව<br><br>උපදේශනවල දී ඇති කර ගත් එකඟත්වයන් ඇතුළත් වාර්තාව සකස් කිරීමට හා ප්‍රකාශයට පත් කිරීම සඳහා උපදෙස් ලබා ගත් පාර්ශවකරුවන් සංඛ්‍යාව<br><br>කාන්තා ගෘහමූලික කුටුම්බ සම්බන්ධයෙන් නිර්වචනයක් සම්මත කර ගැනීම<br><br>කාන්තා ගෘහමූලික කුටුම්බ පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සාධාරණත්වය සහ සමානාත්මතාව සඳහා වන පාර්ලිමේන්තු තේරීම් කමිටුව<br><br>ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය<br><br>ජාතික කාන්තා කමිටුව | එක්සත් ජාතීන්ගේ ආයතන<br><br>සිවිල් සමාජ සංවිධාන | 2023 ජන 2024 ඔක් | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය<br><br>ආරක්ෂක අමාත්‍යාංශය | සම්මත කිරීමට නියමිතය |

| ප්‍රධාන ක්‍රියාකාරකම් | දර්ශක | සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීමේ ක්‍රම | ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ ආයතන | සහාය දෙන ආයතන | | කාල රාමුව | නිරීක්ෂණ ආයතනය | අය වැය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රාජ්‍ය ක්‍රියාකාරකයන් | රාජ්‍ය නොවන ක්‍රියාකාරකයන් | | | |
| **5.10**<br>කාන්තා ගෘහමූලික කුටුම්බ බවට පත් වී ඇති පවුල් සංඛ්‍යාව හා කාන්තා ගෘහමූලික කුටුම්බයක් බවට පත් වීමට තුඩු දුන් හේතු පිළිබඳව අධ්‍යයනයක් සිදු කිරීම සහ කාන්තා ගෘහමූලික කුටුම්බවලට ප්‍රමාණවත් ලෙස සහාය වන බව සහතික කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම | අධ්‍යයන සංඛ්‍යාව<br><br>සකස් කරන ලද නිර්දේශ සංඛ්‍යාව<br><br>ක්‍රියාත්මක කරන ලද නිර්දේශ | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව<br><br>රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය<br><br>ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව<br><br>ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය | එක්සත් ජාතීන්ගේ ආයතන<br><br>සිවිල් සමාජ සංවිධාන | 2023 පෙබ-2025 අගෝ | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය<br><br>ආරක්ෂක අමාත්‍යාංශය | සම්මත කිරීමට නියමිතය |
| **5.11**<br>ජීවනෝපාය සංවර්ධන ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම සහ කාන්තා ගෘහමූලික කුටුම්බවල ආර්ථික ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීම සඳහා ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ හැකි යාන්ත්‍රණ සකස් කිරීම | සකස් කරන ලද යාන්ත්‍රණ සංඛ්‍යාව<br><br>වැඩසටහන් වෙත ප්‍රවේශ වන කාන්තා ගෘහමූලික කුටුම්බ සංඛ්‍යාව<br><br>සම්පාදනය කරන ලද යාන්ත්‍රණවල ඇති ජීවනෝපාය මාර්ග ශක්තිමත් කිරීමේ/ සංවර්ධනය කිරීමේ ක්‍රියාකාරකම්වලට වාර්තා කරන ලද කාන්තා ගෘහමූලික කුටුම්බවල ප්‍රතිශතය | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය<br><br>ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය<br><br>සමෘද්ධි දෙපාර්තමේන්තුව<br><br>අධ්‍යාපන අමාත්‍යාංශය<br><br>ධීවර අමාත්‍යාංශය<br><br>කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | එක්සත් ජාතීන්ගේ ආයතන<br><br>සිවිල් සමාජ සංවිධාන | 2023 පෙබ-2024 ජන | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය<br><br>ආරක්ෂක අමාත්‍යාංශය | සම්මත කිරීමට නියමිතය |

| ප්‍රධාන ක්‍රියාකාරකම් | දර්ශක | සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීමේ ක්‍රම | ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ ආයතන | සහාය දෙන ආයතන | | කාල රාමුව | නිරීක්ෂණ ආයතනය | අය වැය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රාජ්‍ය ක්‍රියාකාරකයන් | රාජ්‍ය නොවන ක්‍රියාකාරකයන් | | | |
| **5.12** කාන්තා ගෘහ මූලික කුටුම්බ ජීවනෝපාය සහායක ආයතන සහ ක්ෂේත්‍රයේ වෘත්තීය සමිති (උදාහරණ- ගොවියන්ගේ/ වෙළෙඳුන්ගේ වෘත්තිය සමිති) ආදියට සහභාගි වීම මෙන්ම එම සංවිධානවල තීරණ ගැනීමට සම්බන්ධ වන බව තහවුරු කිරීම | විවිධ ක්ෂේත්‍රවලට (උදාහරණ- කෘෂිකර්මය) අදාළ වෘත්තිය සමිතිවලට දායක වන කාන්තා ගෘහ මූලික කුටුම්බ සංඛ්‍යාව<br><br>ජීවනෝපාය සංවර්ධනය ආයතනවලට පිවිසීමට හැකි කාන්තා මූලික කුටුම්බ සංඛ්‍යාව<br><br>අදාල ආයතනවල තීරණ ගැනීමට දායකවන කාන්තාවන්ගේ ප්‍රතිශතය | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව<br><br>ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය | එක්සත් ජාතීන්ගේ ආයතන<br><br>සිවිල් සමාජ සංවිධාන | 2023 පෙබ- 2024 ජන | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය<br><br>ආරක්ෂක අමාත්‍යාංශය | සම්මත කිරීමට නියමිතය |
| **5.13** පෙර පැවැති ගැටුම්වලින් බලපෑමටලක් වූ ගම්මානවල ජීවත්වන කාන්තාවන්ගේ අවශ්‍යතා අධ්‍යයනයක් සිදුකිරීම හා අදාළ බලධාරීන්ට නිර්දේශ ඉදිරිපත් කිරීම | පවත්වන ලද ඇගයුම් සංඛ්‍යාව<br><br>සම්පාදනය කරන ලද නිර්දේශ සංඛ්‍යාව<br><br>ක්‍රියාත්මක කරන ලද නිර්දේශ ප්‍රතිශතය | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | ප පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව | එක්සත් ජාතීන්ගේ ආයතන<br><br>සිවිල් සමාජ සංවිධාන | 2023 පෙබ - 2024 ජන | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය<br><br>ආරක්ෂක අමාත්‍යාංශය | සම්මත කිරීමට නියමිතය |

| ප්‍රධාන ක්‍රියාකාරකම් | දර්ශක | සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීමේ ක්‍රම | ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ ආයතන | සහාය දෙන ආයතන | | කාල රාමුව | නිරීක්ෂණ ආයතනය | අය වැය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රාජ්‍ය ක්‍රියාකාරකයන් | රාජ්‍ය නොවන ක්‍රියාකාරකයන් | | | |
| **5.14**<br>පෙර පැවැති ගැටුම්වලින් බලපෑමටලක් වූ ගම්මානවල ජීවත්වන කාන්තාවන්ගේ අවශ්‍යතා අධ්‍යයනයෙන් ඉදිරිපත් කළ නිර්දේශ ඉදිරිපත් කිරීම ක්‍රියාත්මක කිරීම සහ නියාමනය | ක්‍රියාත්මක කරන ලද නිර්දේශ සංඛ්‍යාව<br><br>ක්‍රියාත්මක කරන ලද නිර්දේශවල බලපෑම් සහ ප්‍රතිඵල පිළිබඳ සිදු කරන ලද අධ්‍යයන සංඛ්‍යාව<br><br>අදාළ සහ තිරසාර සහාය ලබා ගැනීම සඳහා නිර්දේශවලට සිදු කරන ලද සංශෝධන සංඛ්‍යාව | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තු | එක්සත් ජාතීන්ගේ ආයතන<br><br>සිවිල් සමාජ සංවිධාන | 2024 පෙබ-2027 අගෝ | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය<br><br>ආරක්ෂක අමාත්‍යාංශය | සම්මත කිරීමට නියමිතය |

## තේමාත්මක ප්‍රමුඛතාව 04:

# කාන්තා ආරක්ෂාව හා සුරක්ෂිතතාව

**ක්‍රමෝපායාත්මක අරමුණු:**

1. ලිංගික හිංසනය සහ අවතැන් වීම ආශ්‍රිත ගැටලු සහ ගැටුම් සන්දර්භවලට සම්බන්ධ ලිංගික හිංසනය පිළිබඳ ගැටලු විමර්ශනය කිරීම සහ ඒවාට විසඳුම් ලබා දීම
2. ත්‍රිවිධ හමුදාවේ, පොලීසියේ සහ වෙනත් ආයතනවල සාමාජිකයන්ට ගැටුම් සන්දර්භවලදී දී මෙන්ම පශ්චාත් ගැටුම් සන්දර්භවල දී ද ලිංගික හිංසනය වැළැක්වීම සහ ඊට විසඳුම් ලබා දීම සිදු කළ යුතු ආකාරය පිළිබඳව අධ්‍යාපනය ලබා දීම සහ ඒ පිළිබඳ ඔවුන්ගේ දැනුවත්කම ඉහළ නැංවීම
3. වැඩිහිටි කාන්තාවන්, ආබාධ සහිත කාන්තාවන් සහ සමාජය විසින් තර්ජනයට විය හැකි තත්ත්වයට පත් කෙරෙන වෙනත් කාන්තා කණ්ඩායම් සඳහා සම්පාදනය කෙරෙන පහසුකම් / දීමනා වැඩි කිරීම

අවධාන ක්ෂේත්‍රය

# 06

**ලිංගික හිංසනයද ඇතුළුව හිංසනයට එරෙහිව කාන්තාවන් සහ ගැහැනු ළමයින් ආරක්ෂා කිරීම**

| ප්‍රතිඵලය | වගකිව යුතු ආයතනය/නිලධාරියා |
|---|---|
| කාන්තාවන්ට එරෙහි හිංසනය, විශේෂයෙන් වැඩිහිටි කාන්තාවන්, ගැහැනු ළමයින්, ආබාධ සහිත කාන්තාවන් සහ සංක්‍රාන්ති කාන්තාවන් ට එරෙහි හිංසනය වැළැක්වීම සඳහා සහ ඔවුන්ගේ සමාජ ආර්ථික අවස්ථා සහ තීරණ ගැනීමේ සහභාගිත්වය වැඩිදියුණු කිරීම සඳහා පියවර ගෙන ඇත | • කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය |

| ප්‍රධාන ක්‍රියාකාරකම් | දර්ශක | සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීමේ ක්‍රම | ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ ආයතන | සහාය දෙන ආයතන | | කාල රාමුව | නිරීක්ෂණ ආයතනය | අය වැය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රාජ්‍ය ක්‍රියාකාරකයන් | රාජ්‍ය නොවන ක්‍රියාකාරකයන් | | | |
| **6.1**<br>කවර හෝ ගැටුම් සන්දර්භයකට (අවතැන් වීම, ජනවාර්ගික-ආගමික ගැටුම්, ගැටුම් ආශ්‍රිත ලිංගික හිංසනය) සම්බන්ධ ලිංගික හිංසන සිදුවීම් පිළිබඳව අධ්‍යයනයක් සිදු කිරීම | සිදු කරන ලද අධ්‍යයන සංඛ්‍යාව<br><br>උපදේශනය ලබා ගන්නා ලද පාර්ශ්ව සංඛ්‍යාව<br><br>ප්‍රධාන පාර්ශ්වකරුවන් වෙත අධ්‍යයනයේ සොයාගැනීම් ඉදිරිපත් කිරීමට පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | ශ්‍රී ලංකා පොලීසිය<br><br>ළමා හා කාන්තා අපයෝජන නිවාරණ කාර්යාංශය<br>මහජන ආරක්ෂාව පිළිබඳ අමාත්‍යාංශය | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය<br><br>ජාතික ළමා ආරක්ෂක අධිකාරිය<br><br>ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය<br><br>ජාතික කාන්තා කමිටුව | එක්සත් ජාතීන්ගේ ආයතන<br><br>සිවිල් සමාජ සංවිධාන | 2023 ජන-2025ඔක් | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | සම්මත කිරීමට නියමිතය |

| ප්‍රධාන ක්‍රියාකාරකම් | දර්ශක | සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීමේ ක්‍රම | ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ ආයතන | සහාය දෙන ආයතන | | කාල රාමුව | නිරීක්ෂණ ආයතනය | අය වැය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රාජ්‍ය ක්‍රියාකාරකයන් | රාජ්‍ය නොවන ක්‍රියාකාරකයන් | | | |
| **6.2**<br>ගැටුම් සහ පශ්චාත්ගැටුම් සන්දර්භයන්හි දී ලිංගික හිංසනය වැළැක්වීම සඳහා අදාළ නීති, ප්‍රතිපත්ති හා යාන්ත්‍රණ පිළිබඳව ත්‍රිවිධ හමුදාවට සහ පොලිස් නිලධාරීන්ට මග පෙන්වන ආචාර ධර්ම / චර්යා ධර්ම පද්ධති සකස් කිරීම | සකස් කළ චර්යා ධර්ම පද්ධති සංඛ්‍යාව | ආරක්ෂක අමාත්‍යාංශය<br><br>ශ්‍රී ලංකා පොලීසිය | ආරක්ෂක අමාත්‍යාංශය<br><br>මහජන ආරක්ෂක අමාත්‍යාංශය | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය<br><br>ශ්‍රී ලංකා පොලීසිය<br><br>රාජ්‍ය සේවා කොමිෂන් සභාව | සිවිල් සමාජ සංවිධාන | 2023 පෙබ-2025 අගෝ | ආරක්ෂක අමාත්‍යාංශය<br><br>කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය<br><br>ශ්‍රී ලංකා පොලීසිය | සම්මත කිරීමට නියමිතය |

| ප්‍රධාන ක්‍රියාකාරකම් | දර්ශක | සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීමේ ක්‍රම | ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ ආයතන | සහාය දෙන ආයතන | | කාල රාමුව | නිරීක්ෂණ ආයතනය | අය වැය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රාජ්‍ය ක්‍රියාකාරකයන් | රාජ්‍ය නොවන ක්‍රියාකාරකයන් | | | |
| **6.3**<br>'වැඩිහිටි ආවරණ කැපකරු' අනුග්‍රාහකත්ව ගාස්තුව රු. 1, 000 දක්වා වැඩි කිරීම ද ඇතුළුව වැඩිහිටියන්[35] (වැඩිහිටි කාන්තාවන් ද ඇතුළුව) උදෙසා දැනට පවත්නා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම ශක්තිමත් කිරීම[36] | දීමනාව වැඩි වීමේ ප්‍රතිශතය<br><br>වසරකට දෙවරක් නොමිලේ සිදු කරන වෛද්‍ය පරීක්ෂණය සහ නිර්දේශ කරන ලද ඖෂධ මිලදී ගැනීම සඳහා ආධාර ලබා දීමේ පහසුකම භාවිත කළ අවුරුදු 65ට වැඩි වැඩිහිටි කතුන් සංඛ්‍යාව<br><br>පූජනීය ස්ථානවලට වන්දනා චාරිකාවල යාම සඳහා අඩු පොලී ණය ලබා ගන්නා කාන්තාවන් සංඛ්‍යාව | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය<br><br>වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ මහලේකම් කාර්යාලය | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය<br><br>වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ මහලේකම් කාර්යාලය | සෞඛ්‍ය අමාත්‍යාංශය<br><br>අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය යටතේ වන ජාතික ඒකාබද්ධතා අංශය<br><br>වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ මහලේකම් කාර්යාලය<br><br>කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය<br><br>සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව | එක්සත් ජාතීන්ගේ ආයතන<br><br>සිවිල් සමාජ සංවිධාන | 2023 ජන-2024 ඔක්<br><br>අනුග්‍රාහකත්ව යෝජනා ක්‍රමය සඳහා දීර්ඝ කාලීනව කැප වීම | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | සම්මත කිරීමට නියමිතය |

35 මෙයට පහත සඳහන් වැඩසටහන් අයත් වේ. (1) 'ආරෝග්‍යා' වෛද්‍ය සහාය වැඩසටහන- නිදන්ගත බෝ නොවන රෝග පවත්නා අඩු ආදායම්ලාභී වැඩිහිටි කාන්තාවන් වෙනුවෙන් රු. 25000ක මූල්‍ය ආධාරයක් ලබා දීම. (2) 'සුවපහසු' ඔවුන්ගේම නිවාසවල ජීවත් වන වැඩිහිටි කාන්තාවන් සඳහා අවශ්‍ය වන අවම පහසුකම් සහ සෞඛ්‍ය ආරක්ෂණ පහසුකම් ලබාදීම සඳහා වන මූල්‍ය අනුග්‍රාහකත්ව වැඩසටහන (එක් ප්‍රතිලාභියෙක් සඳහා උපරිම රුපියල් මිලියන 0.05 ක්) (03) 'දිරිය පියස' නිවාස ව්‍යාපෘතිය වැඩිහිටියන් සිටින අඩු ආදායම්ලාභී පවුල් සඳහා නිවාස ඉදිකිරීමට සහ අලුත්වැඩියා කිරීමට (රුපියල් මිලියන 0.3) (04) වන්දනා චාරිකා සංවිධානය කිරීම වැඩිහිටියන්ගේ වන්දනා චාරිකා සඳහා මූල්‍යමය පහසුකම් සැපයීම (එක් චාරිකාවක් සඳහා රුපියල් මිලියන 0.05ක්)

36 වර්තමානයේ දී මාසික ආදායම රු. 3, 000ට වඩා අඩු නම් වයස අවුරුදු 70ට වැඩි ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට නිකුත් කෙරෙන්නේ රු. 2, 000ක මාසික දීමනාවක් පමණකි. සන්නද්ධ ගැටුමේ බලපෑමට ද ලක්ව ඇති, සිය මුළු ජීවිත කාලය පුරා ම දුෂ්කරතා විඳ දරා ගැනීමට සිදු වී ඇති වැඩිහිටි කාන්තාවන් සඳහන් කළේ ඉහත සඳහන් දීමනාව ප්‍රමාණවත් නොවන බව සහ වයස ආශ්‍රිත නොහැකියාව නිසා ශ්‍රමය මගින් ආදායමක් උත්පාදනය කර ගැනීමට ද තමන්ට හැකියාවක් නොමැති බව යි.

| ප්‍රධාන ක්‍රියාකාරකම් | දර්ශක | සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීමේ ක්‍රම | ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ ආයතන | සහාය දෙන ආයතන | | කාල රාමුව | නිරීක්ෂණ ආයතනය | අය වැය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රාජ්‍ය ක්‍රියාකාරකයන් | රාජ්‍ය නොවන ක්‍රියාකාරකයන් | | | |
| **6.4**<br>මාධ්‍ය ප්‍රචාරක ව්‍යාපාරයක් හරහා 'වැඩිහිටි ආවරණ කැපකරු' අනුග්‍රාහකත්ව යෝජනා ක්‍රමය ප්‍රවර්ධනය කිරීම | මාධ්‍ය ආවරණ සංඛ්‍යාව<br><br>(පුවත්පත්, රූපවාහිනී, ගුවන්විදුලි, සමාජ මාධ්‍ය/ඔන්ලයින්)<br><br>වාර්ෂික පදනමකින් 'වැඩිහිටි ආවරණ කැපකරු' අනුග්‍රාහකත්ව යෝජනා ක්‍රමයට එක් වන අනුග්‍රාහකයන් සංඛ්‍යාව<br><br>මාධ්‍ය ප්‍රචාරණ ව්‍යාපාරය ඔස්සේ ළඟාවූ ප්‍රේක්ෂකයන් සංඛ්‍යාව | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය<br><br>වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ මහ ලේකම් කාර්යාලය | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය<br><br>වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ මහ ලේකම් කාර්යාලය | සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව<br><br>ජනමාධ්‍ය අමාත්‍යාංශය | එක්සත් ජාතීන්ගේ ආයතන<br><br>සිවිල් සමාජ සංවිධාන | 2023 ජන-2024 ඔක්<br><br>අනුග්‍රාහකත්ව යෝජනා ක්‍රමය සඳහා දීර්ඝ කාලීනව කැප වීම | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | සම්මත කිරීමට නියමිතය |
| **6.5**<br>වැඩිහිටි කාන්තාවන් සඳහා පවත්නා ජීවනෝපාය සහාය ක්‍රියාවලි/වැඩසටහන් ශක්තිමත් කිරීම සහ වැඩිහිටි කාන්තාවන්ද ඇතුළුව අඩු ආදායම් ලබන කාන්තාවන් සඳහා ලබා දෙන සහාය හා ප්‍රතිලාභ ඉහළ නංවා ලීම | ඉහළ නැංවූ ප්‍රතිලාභ සමග ලබා දුන් ජීවනෝපාය සහය වැඩසටහන් සංඛ්‍යාව<br><br>හඳුන්වා දුන් වැඩසටහන්වලින් ප්‍රතිලාභ ලැබූ ඒ ඒ වර්ගකිරීම්වලට අනුව වෙන් කළ (වැඩිහිටි කාන්තාවන්, කාන්තා ගෘහ මූලික කුටුම්බ වශයෙන්) අඩු ආදායම්ලාභී පුද්ගලයන් සංඛ්‍යාව | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය<br><br>සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය<br><br>සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව | වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ මහ ලේකම් කාර්යාලය<br><br>ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය | එක්සත් ජාතීන්ගේ ආයතන<br><br>සිවිල් සමාජ සංවිධාන | 2023 ජන-2025 අගෝ | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | සම්මත කිරීමට නියමිතය |

| ප්‍රධාන ක්‍රියාකාරකම් | දර්ශක | සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීමේ ක්‍රම | ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ ආයතන | සහාය දෙන ආයතන | | කාල රාමුව | නිරීක්ෂණ ආයතනය | අය වැය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රාජ්‍ය ක්‍රියාකාරකයන් | රාජ්‍ය නොවන ක්‍රියාකාරකයන් | | | |
| **6.6** ළමා නිවාසවලින් ඉවත්ව යෑමට සූදානම් වන වයස 16-18 ගැහැණු ළමයින් හා පිරිමි ළමයින් සඳහා වෘත්තීය මාර්ගෝපදේශ සහ සමාජ අනුකලන නිපුණතා සංවර්ධන සහාය සම්පාදනය කිරීම | වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් සංඛ්‍යාව<br><br>වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන්වලින් ප්‍රතිලාභ ලබන ගැහැණු ළමයින් සංඛ්‍යාව<br><br>වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන්වලින් ප්‍රතිලාභ ලැබීමෙන් මාස හයක් ඇතුළත රැකියාවක් ලබා ගත් ගැහැණු ළමයින් සංඛ්‍යාව | පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරිය<br><br>ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය<br><br>ජාතික වෘත්තීය මාර්ගෝපදේශ හා උපදේශන මධ්‍යස්ථානය<br><br>පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව | එක්සත් ජාතීන්ගේ ආයතන | 2023 ජන- දීර්ඝ කාලීන | පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව<br><br>කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | සම්මත කිරීමට නියමිතය |
| **6.7** සුරක්ෂිත හා ස්වාධීන ජීවිතයක් ගත කිරීමට හැකියාව ලැබෙන තෙක් ළමා නිවාසවලින් ඉවත්ව යන 18+ තරුණයන් උදෙසා වාසස්ථාන හා රැකවරණය සම්පාදනය කිරීම | ධාරිතා සංවර්ධන පුහුණු ලැබුණු තරුණයන් සංඛ්‍යාව<br><br>වාසස්ථාන හා රැකවරණය ලැබුණු තරුණයන් සංඛ්‍යාව<br><br>සුරක්ෂිත හා ස්වාධීන ජීවිතයක් ගත කිරීම සඳහා ඉවත්ව යන තරුණයන් සංඛ්‍යාව | පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව<br><br>ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය | එක්සත් ජාතීන්ගේ ආයතන | 2023 ජන- දීර්ඝ කාලීන | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | සම්මත කිරීමට නියමිතය |

| ප්‍රධාන ක්‍රියාකාරකම් | දර්ශක | සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීමේ ක්‍රම | ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ ආයතන | සහාය දෙන ආයතන | | කාල රාමුව | නිරීක්ෂණ ආයතනය | අය වැය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රාජ්‍ය ක්‍රියාකාරකයන් | රාජ්‍ය නොවන ක්‍රියාකාරකයන් | | | |
| **6.8**<br>ස්ත්‍රී පුරුෂ සමාජභාවී අගතීන්, ජනවාර්ගික-ආගමික අනන්‍යතාව, දේශපාලන සබඳතා ආදියට අදාළව සිදු කරන ලද සයිබර් අපරාධ, හිංසනය හා වෛරී ප්‍රකාශ සම්බන්ධයෙන් විමර්ශන සිදු කිරීම සඳහා විශේෂ ඒකකයක් ස්ථාපිත කිරීම | කාර්යාල ඉඩකඩක් වෙන් කිරීම, උපකරණ හා යටිතල පහසුකම්, පුද්ගල සහ මූල්‍ය සම්පත් සහිතව පිහිටුවන ලද විශේෂ ඒකක සංඛ්‍යාව | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | ළමා හා කාන්තා අපයෝජන නිවාරණ කාර්යාංශය<br><br>ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය<br><br>ආරක්ෂක අමාත්‍යාංශය<br><br>ජනමාධ්‍ය අමාත්‍යාංශය<br><br>තාක්ෂණ අමාත්‍යාංශය<br><br>මහජන ආරක්ෂක අමාත්‍යාංශය<br><br>ජාතික ළමා ආරක්ෂක අධිකාරිය | සිවිල් සමාජ සංවිධාන | 2023 ජනවාරි-2024 අගෝ | ශ්‍රී ලංකා පොලීසිය ළමා හා කාන්තා කාර්යාංශය<br><br>කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | සම්මත කිරීමට නියමිතය |
| **6.9**<br>ආබාධ සහිත හිටපු සටන්කරුවන් රැක බලා ගන්නන් පිළිබඳ විශේෂ අවධාරණයක් සහිතව ආබාධසහිත පුද්ගලයන් රැක බලා ගන්නා කාන්තාවන් පිළිබඳ අවශ්‍යතා තක්සේරුවක් සිදු කිරීම | සිදු කරන ලද අවශ්‍යතා තක්සේරු සංඛ්‍යාව | ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික මහලේකම් කාර්යාලය | ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික මහලේකම් කාර්යාලය | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය<br><br>ආරක්ෂක අමාත්‍යාංශය<br><br>රණවිරු සේවා අධිකාරිය<br><br>අධ්‍යාපන අමාත්‍යාංශය<br><br>ජාතික සමගිය හා ප්‍රතිසන්ධානය සඳහා වන කාර්යාලය | සිවිල් සමාජ සංවිධාන | 2023 ජන-2024 අගෝ | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | සම්මත කිරීමට නියමිතය |

| ප්‍රධාන ක්‍රියාකාරකම් | දර්ශක | සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීමේ ක්‍රම | ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ ආයතන | සහාය දෙන ආයතන | | කාල රාමුව | නිරීක්ෂණ ආයතනය | අය වැය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රාජ්‍ය ක්‍රියාකාරකයන් | රාජ්‍ය නොවන ක්‍රියාකාරකයන් | | | |
| **6.10** ඉහත තක්සේරුවට අනුව ආබාධ සහිත පුද්ගලයන් නිසි ලෙස රැකබලා ගැනීම, ඔවුන්ගේ අයිතිවාසිකම් තහවුරු කිරීම සහ ඔවුන්ගේ මනෝ සමාජ යහපැවැත්ම වැඩි දියුණු කිරීම සඳහා ආබාධ සහිත පුද්ගලයන් රැක බලා ගන්නන් බලගැන්වීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සංඛ්‍යාව<br><br>බලගැන්වීමේ පුහුණු මගින් පුහුණුව ලබා දුන් පුද්ගලයන් සංඛ්‍යාව<br><br>මනෝ සමාජ සේවා වෙත ප්‍රවේශ වන ආබාධ සහිත පුද්ගලයන් රැක බලා ගන්නා පුද්ගලයන් සංඛ්‍යාව | ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික මහලේකම් කාර්යාලය | ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික මහලේකම් කාර්යාලය | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය<br>ආරක්ෂක අමාත්‍යාංශය<br><br>රණවිරු සේවා අධිකාරිය<br><br>සමාජ සේවා දෙපාර්තමේන්තුව | සිවිල් සමාජ සංවිධාන | 2025-අගෝ-2027 සැප් | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | සම්මත කිරීමට නියමිතය |
| **6.11** ආබාධ සහිත පුද්ගලයන් රැක බලා ගන්නා තැනැත්තන්ගේ යහපැවැත්ම සඳහා පියවර ගැනීම[37] | ආබාධ සහිත පුද්ගලයන් රැක බලා ගන්නා කාන්තාවන්ගේ යහපැවැත්ම සඳහා ගන්නා ලද පියවර සංඛ්‍යාව | ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික මහලේකම් කාර්යාලය | ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික මහලේකම් කාර්යාලය | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය<br><br>මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්තිඅමාත්‍යාංශය<br><br>සමාජ සේවා දෙපාර්තමේන්තුව | එක්සත් ජාතීන්ගේ ආයතන | 2023 ජන-2024 - ඔක් | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | සම්මත කිරීමට නියමිතය |

37 පවුලක ආබාධ සහිත තත්ත්වයෙහි පසුවන එක් පුද්ගලයෙකුට වඩා සිටිය ද දීමනාව ලැබෙන්නේ පවුලකින් එක් පුද්ගලයෙකුට පමණක් බව උපදේශනවල සහභාගිකයෝ ප්‍රකාශ කළහ. මෙම පියවර හරහා විසඳීමට අපේක්ෂා කෙරෙන්නේ මෙම ගැටලුව යි.

| ප්‍රධාන ක්‍රියාකාරකම් | දර්ශක | සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීමේ ක්‍රම | ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ ආයතන | සහාය දෙන ආයතන | | කාල රාමුව | නිරීක්ෂණ ආයතනය | අය වැය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රාජ්‍ය ක්‍රියාකාරකයන් | රාජ්‍ය නොවන ක්‍රියාකාරකයන් | | | |
| **6.12** ආබාධ සහිත කාන්තාවන් උදෙසා වැඩි රැකියා අවස්ථා නිර්මාණය කිරීමේ අවශ්‍යතාව අවධාරණය කරමින් රාජ්‍ය හා පෞද්ගලික යන අංශ දෙකෙහි ම සේවා යෝජකයන් හා රැකියා සොයන්නන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සංඛ්‍යාව<br><br>සංවේදී කරන ලද රාජ්‍ය හා පෞද්ගලික අංශ ආයතන සංඛ්‍යාව<br><br>ආබාධිත සහිත සේවකයන්ට සහාය දැක්වීම සඳහා මානව සම්පත් සහ බඳවා ගැනීමේ ප්‍රතිපත්ති නැවත විමර්ශනය කිරීමට එකඟ වන රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ සේවායෝජකයන් සංඛ්‍යාව | ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික මහලේකම් කාර්යාලය<br>සමාජ සේවා දෙපාර්තමේන්තුව | සමාජ සේවා දෙපාර්තමේන්තුව<br><br>කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය<br><br>රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලනඅමාත්‍යාංශය<br><br>ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික මහලේකම් කාර්යාලය | පර්යේෂණ ආයතන | 2023 ජන-2024 අගෝ | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | සම්මත කිරීමට නියමිතය |
| **6.13** ඔවුන්ගේ ආරක්ෂාව සහ පුළුල් සමාජ ඒකාබද්ධතාව සඳහා සංක්‍රාන්තික පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිගැනීම හා ගරු කිරීම උදෙසා රාජ්‍ය නිලධාරීන් සංවේදී කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | ක්‍රියාත්මක කරන ලද සංවේදීකරණ වැඩසටහන් සංඛ්‍යාව<br><br>සංවේදී කරන ලද රාජ්‍ය නිලධාරීන් සංඛ්‍යාව | මහජන ආරක්ෂක අමාත්‍යාංශය<br><br>සෞඛ්‍ය අමාත්‍යාංශය | සෞඛ්‍ය අමාත්‍යාංශය | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය<br><br>ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව<br><br>ශ්‍රී ලංකා පොලීසිය | සිවිල් සමාජ සංවිධාන | 2023 ජනවාරි මැයි-දීර්ඝ කාලීන | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | සම්මත කිරීමට නියමිතය |

| ප්‍රධාන ක්‍රියාකාරකම් | දර්ශක | සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීමේ ක්‍රම | ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ ආයතන | සහාය දෙන ආයතන | | කාල රාමුව | නිරීක්ෂණ ආයතනය | අය වැය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රාජ්‍ය ක්‍රියාකාරකයන් | රාජ්‍ය නොවන ක්‍රියාකාරකයන් | | | |
| **6.14** ඔවුන් සාමාජීය කටයුතුවල පූර්ණ සහ ආරක්ෂාකාරී ලෙස සහභාගිවීම සඳහා ස්ත්‍රී පුරුෂභාවය හඳුනා ගැනීමේ සහතිකය (Gender Recognition Certificate) ලබා ගැනීමේ පරිපාලන ක්‍රියාවලිය කඩිනම් කිරීම | රාජ්‍ය ලියකියවිලි ලබා ගැනීමේ දී මුහුණ දෙන පරිපාලන බාධක ඉවත් කිරීම සඳහා ගන්නා ලද පියවර සංඛ්‍යාව | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව<br><br>මානසික සෞඛ්‍ය අධ්‍යක්ෂ කාර්යාලය,<br><br>සෞඛ්‍ය අමාත්‍යාංශය | අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය<br><br>රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව | සෞඛ්‍ය අමාත්‍යාංශය<br><br>කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය<br><br>ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව<br><br>ශ්‍රී ලංකා පොලීසිය | සිවිල් සමාජ සංවිධාන | 2023 පෙබ-2024 ජන | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව<br><br>කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | සම්මත කිරීමට නියමිතය |
| **6.15** සංක්‍රාන්ති පුද්ගලයින්ගේ ආරක්ෂාවට සහ සාමාජීය කටයුතුවල පූර්ණ ලෙස සහභාගි වීම සඳහා සංක්‍රාන්තික පුද්ගලයන් ආරක්ෂක පරීක්ෂාවලට ලක් කරන විට යොදා ගත යුතු ක්‍රියාවලිය පිළිබඳව සංවේදී කිරීම සඳහා පොලිස් නිලධාරීන් උදෙසා සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි සකස් කිරීම | සකස් කරන ලද සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි සංඛ්‍යාව<br><br>සංවේදී කරන ලද පොලිස් නිලධාරීන් සංඛ්‍යාව | ශ්‍රී ලංකා පොලීසියේ මානව හිමිකම් අංශය<br><br>කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | ශ්‍රී ලංකා පොලීසියේ මානව හිමිකම් අංශය | ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව<br><br>ජාතික පොලිස් කොමිෂන් සභාව<br><br>ජාතික පොලිස් අභ්‍යාස ආයතනය<br><br>මහජන ආක්ෂාව පිළිබඳ අමාත්‍යාංශය<br><br>මහජන ආරක්ෂක අමාත්‍යාංශය<br><br>කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | එක්සත් ජාතීන්ගේ ආයතන<br><br>සිවිල් සමාජ සංවිධාන | 2023 ජන-දීර්ඝ කාලීන | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | සම්මත කිරීමට නියමිතය |

## තේමාත්මක ප්‍රමුඛතාව 05:

# කාන්තාවන්ගේ ආර්ථික සවිබලගැන්වීම

**ක්‍රමෝපායාත්මක අරමුණු:**

1. ක්ෂුද්‍ර ණය ගැනීමේ භාවිතයෙන් සමාජයේ ප්‍රජාමූල මට්ටම්වල කාන්තාවන්ට සෘණාත්මක බලපෑමක් ඇති නොවන බව සහතික කිරීම සඳහා ක්ෂුද්‍ර ණය/මූල්‍ය භාවිතය වෙනස් කිරීම
2. ශ්‍රී ලංකා මහ බැංකුව හරහා ක්ෂුද්‍ර මූල්‍ය ආයතන නියාමනය කිරීම සහ දැනට පවත්නා නීති හා රෙගුලාසි ක්‍රියාත්මක කිරීම
3. මූල්‍ය කළමනාකරණය සහ ක්ෂුද්‍ර ණය/මූල්‍ය එක දිගට නැවත නැවතත් ලබා ගැනීමේ අවාසි පිළිබඳව කාන්තාවන්ට අධ්‍යාපනය ලබා දීම සහ දැනුවත්කම ඉහළ නැංවීම

අවධාන ක්ෂේත්‍රය

# 07

**ක්ෂුද්‍ර මූල්‍ය භාවිතය පිළිබඳ පුළුල්ව පැතිර පවත්නා තර්ජනයෙන් කාන්තාවන් ආරක්ෂා කිරීම**

| ප්‍රතිඵලය | වගකිව යුතු ආයතනය/නිලධාරියා |
|---|---|
| ශ්‍රී ලංකාවේ ප්‍රජාමූල මට්ටමේ කාන්තාවන්ට බලපාන ක්ෂුද්‍ර මූල්‍ය භාවිතය ආශ්‍රිත ගැටලු සම්බන්ධයෙන් ස්ත්‍රී පුරුෂ සමාජභාවය කේන්ද්‍ර කර ගත්, ප්‍රධාන ප්‍රවාහගත කරන ලද මැදිහත් වීම් යොදා ගනු ලැබේ | • මුදල් අමාත්‍යාංශය, ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය |

| ප්‍රධාන ක්‍රියාකාරකම් | දර්ශක | සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීමේ ක්‍රම | ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ ආයතන | සහාය දෙන ආයතන | | කාල රාමුව | නිරීක්ෂණ ආයතනය | අය වැය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රාජ්‍ය ක්‍රියාකාරකයන් | රාජ්‍ය නොවන ක්‍රියාකාරකයන් | | | |
| **7.1**<br>ක්ෂුද්‍ර මූල්‍ය ණය ගැටලු පැතිර පවත්නා ප්‍රමාණය සහ කාන්තාවන්ගේ මූල්‍ය, මානසික හා කායික ආරක්ෂාවට ඉන් ඇති වන බලපෑම සොයා දැන ගැනීම සඳහා සියලු දිස්ත්‍රික්ක තුළ නියමු සමීක්ෂණ සිදු කිරීම.<br><br>සමීක්ෂණ ප්‍රතිඵල හා නිර්දේශ ක්ෂුද්‍ර ණය ආශ්‍රිතව හඳුනා ගත් අනෙකුත් ගැටලුවලට විසඳුම් ලබා දීම සඳහා උපයෝග කර ගැනීම සඳහාය. | දිස්ත්‍රික්ක පදනමට විසඳිය යුතු ගැටලු හඳුනා ගැනීම සඳහා සිදු කරන ලද නියමු සමීක්ෂණ සංඛ්‍යාව | ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය<br><br>සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව<br><br>ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව | මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ත අමාත්‍යාංශය | එක්සත් ජාතීන්ගේ ආයතන<br><br>සිවිල් සමාජ සංවිධාන | 2023 ජන-2024 ඔක් | මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය | සම්මත කිරීමට නියමිතය |

| ප්‍රධාන ක්‍රියාකාරකම් | දර්ශක | සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීමේ ක්‍රම | ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ ආයතන | සහාය දෙන ආයතන | | කාල රාමුව | නිරීක්ෂණ ආයතනය | අය වැය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රාජ්‍ය ක්‍රියාකාරකයන් | රාජ්‍ය නොවන ක්‍රියාකාරකයන් | | | |
| **7.2**<br>ක්ෂුද්‍ර ණය සම්පාදනය කරන රාජ්‍ය නොවන සංවිධාන ඇතුළු ක්ෂුද්‍ර මූල්‍ය ආයතන විසින් පවත්වා ගෙන යනු ලබන වර්තමාන ණය පොලී අනුපාතික සහ තරගකාරී අනුපාතික යටතේ ණය වෙත ප්‍රවේශ වීමට කාන්තාවන්ට තිබෙන හැකියාව පිළිබඳව වාර්තාවක් සම්පාදනය කිරීම | විවිධ ආයතන විසින් පොලී අනුපාතික පිළිබඳව වසරකට දෙවරක් සම්පාදනය කළ වාර්තා සංඛ්‍යාව | ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණය කිරීමේ දෙපාර්තමේන්තුව | මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය | ශ්‍රී ලංකා මහ බැංකුව<br><br>ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණය කිරීමේ දෙපාර්තමේන්තුව<br><br>රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය | සිවිල් සමාජ සංවිධාන | 2023 ජන-2024 ඔක් | මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය | සම්මත කිරීමට නියමිතය |
| **7.3**<br>සම්පාදනය වෙමින් පවතින ක්ෂුද්‍ර මූල්‍ය සහ ණය නියාමන පනත සම්පාදනය කොට ක්‍රියාවේ යෙදවීම | සම්පාදනය කළ හා ක්‍රියාත්මක කළ අදාළ නීති සංඛ්‍යාව<br><br>නව නීති හා රෙගුලාසි යටතේ ලියාපදිංචි කරන ලද ආයතන සංඛ්‍යාව<br><br>සියලු තලයේ රාජ්‍ය සේවකයන් සංවේදීකරණය කිරීම සඳහා පවත්වන ලද වැඩසටහන් (පනත සම්මත වූ විට) සංඛ්‍යාව | මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය | මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය | ශ්‍රී ලංකා මහ බැංකුව<br><br>කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | සිවිල් සමාජ සංවිධාන | 2023 ජන-2024 ඔක් | මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය | සම්මත කිරීමට නියමිතය |

| ප්‍රධාන ක්‍රියාකාරකම් | දර්ශක | සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීමේ ක්‍රම | ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ ආයතන | සහාය දෙන ආයතන | | කාල රාමුව | නිරීක්ෂණ ආයතනය | අය වැය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රාජ්‍ය ක්‍රියාකාරකයන් | රාජ්‍ය නොවන ක්‍රියාකාරකයන් | | | |
| **7.4**<br>ප්‍රජාමූල මට්ටමේ කාන්තාවන්ට අධ්‍යාපනය ලබා දීම සඳහා වනිතා සංවර්ධන නිලධාරීන් උදෙසා මූල්‍ය කළමනාකරණය පිළිබඳ පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම | ක්‍රියාත්මක කරන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව<br><br>පුහුණුව ලබා ඇති වනිතා සංවර්ධන නිලධාරීන් සංඛ්‍යාව<br>පුහුණු කරන ලද වනිතා සංවර්ධන නිලධාරීන් විසින් ප්‍රජාමූල මට්ටම්වල දී ක්‍රියාත්මක කරනු ලබන පුහුණු වැඩසටහන් සංඛ්‍යාව | මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය | මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය<br><br>කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය<br><br>සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | එක්සත් ජාතීන්ගේ ආයතන<br><br>සිවිල් සමාජ සංවිධාන | 2023 ජන- දීර්ඝ කාලීන | මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය | සම්මත කිරීමට නියමිතය |
| **7.5**<br>සියලු දිස්ත්‍රික්වල කාන්තාවන්ගේ මූල්‍ය කළමනාකරණ සහ මූල්‍ය සාක්ෂරතා කුසලතා ඉහළ නැංවීම සහ ගම් මට්ටමින් කාන්තාවන් උදෙසා දැනුවත්භාවය ඉහළ නැංවීමට සහ මූල්‍ය කළමනාකරණ නිපුණතා සංවර්ධනයට ව්‍යාපාර ක්‍රියාත්මක කිරීම | ක්‍රියාත්මක කරන ලද ප්‍රජාමූල මට්ටමේ වැඩසටහන් සංඛ්‍යාව<br><br>එවැනි වැඩසටහන්වලට පැමිණෙන කාන්තාවන් සංඛ්‍යාව<br><br>ක්ෂුද්‍ර ණය ලබා ගන්නා කාන්තාවන් අඩු වීමේ ප්‍රතිශතය<br><br>දිස්ත්‍රික් වශයෙන් වෙන වෙනම දක්වන ලද මූල්‍ය කළමනාකරණ කුසලතා වර්ධනය කරගත් කාන්තාවන් සංඛ්‍යාව<br><br>දරුණු ලෙස ණය බරින් යුක්ත නොවන යන වර්ගීකරණයට අයත් නොවන කාන්තාවන්ගේ (8.1 හි දක්වා ඇති සමීක්ෂණයේ පදනම් දත්ත)[38] | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය<br><br>මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය<br><br>ශ්‍රී ලංකා මහ බැංකුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුව<br><br>ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව | මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය<br><br>ශ්‍රී ලංකා මහ බැංකුව | එක්සත් ජාතීන්ගේ ආයතන<br><br>සිවිල් සමාජ සංවිධාන | 2023 පෙබ- දීර්ඝ කාලීන | මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය | සම්මත කිරීමට නියමිතය |

| ප්‍රධාන ක්‍රියාකාරකම් | දර්ශක | සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීමේ ක්‍රම | ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ ආයතන | සහාය දෙන ආයතන | | කාල රාමුව | නිරීක්ෂණ ආයතනය | අය වැය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රාජ්‍ය ක්‍රියාකාරකයන් | රාජ්‍ය නොවන ක්‍රියාකාරකයන් | | | |
| **7.6** ත්‍රෛභාෂා මාධ්‍ය ව්‍යාපාරයක් දියත් කිරීම ඔස්සේ ක්ෂුද්‍ර මූල්‍ය ක්‍රමවල ඇති වාසි සහ අවාසි පිළිබඳව දක්වමින් සහ ලියාපදිංචි ආයතන පිළිබඳව සඳහන් කරමින් ක්ෂුද්‍ර මූල්‍ය පිළිබඳව දැනුවත්භාවය ඉහළ නැංවීම. | රූපවාහිනිය පුවත්පත් ගුවන් විදුලිය සමාජ මාධ්‍ය හා ප්‍රජා මට්ටමේ කණ්ඩායම් ඔස්සේ සිදුකරන ලද මාධ්‍ය ව්‍යාපාර සංඛ්‍යාව<br><br>ඒ මාධ්‍ය අනුව වෙන්කර දක්වන ලද ග්‍රාහකයන් වූ පුද්ගලයන් සංඛ්‍යාව | ජනමාධ්‍ය අමාත්‍යාංශය<br><br>ශ්‍රී ලංකා මහ බැංකුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුව | මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය<br><br>ශ්‍රී ලංකා මහ බැංකුව | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය<br><br>ප්‍රාදේශීය ලේකම් කාර්යාල<br><br>දිස්ත්‍රික් ලේකම් කාර්යාල | එක්සත් ජාතීන්ගේ ආයතන<br><br>සිවිල් සමාජ සංවිධාන | 2023 පෙබ දිගු කාලීන | මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය | සම්මත කිරීමට නියමිතය |
| **7.7** කාන්තාවන්ට විධිමත් ආයතන ඔස්සේ ණය පහසුකම් වෙත පිවිසීමට ඇති ඉඩකඩ ඉහළ නැංවීම (උදා - බැංකු)[39] | විධිමත් ආයතන ඔස්සේ ණය පහසුකම් ලබා ගන්නා කාන්තාවන් සංඛ්‍යාව<br><br>ණය පහසුකම් හා සම්බන්ධ ප්‍රතිපත්ති සකසා ගන්නා විධිමත් ණය ආයතන සංඛ්‍යාව | මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය<br><br>ශ්‍රී ලංකා මහ බැංකුව | මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය<br><br>ශ්‍රී ලංකා මහ බැංකුව | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය<br><br>සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව | එක්සත් ජාතීන්ගේ ආයතන<br><br>සිවිල් සමාජ සංවිධාන | 2023 පෙබ - දිගු කාලීන | මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය | සම්මත කිරීමට නියමිතය |

38 මිනුම් නිර්ණායක (අඩු ණය බර, මධ්‍යම ප්‍රමාණයේ ණය බර, සහ අධික ප්‍රමාණයේ ණය බර) ඇගයුම් කරන ක්‍රියා රාමුවෙහි කොටසක් ලෙස ගොඩනැගිය යුතුය.

| ප්‍රධාන ක්‍රියාකාරකම් | දර්ශක | සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීමේ ක්‍රම | ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ ආයතන | සහාය දෙන ආයතන | | කාල රාමුව | නිරීක්ෂණ ආයතනය | අය වැය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රාජ්‍ය ක්‍රියාකාරකයන් | රාජ්‍ය නොවන ක්‍රියාකාරකයන් | | | |
| **7.8**<br>කාන්තා කණ්ඩායම්, සමුපකාර හා අවිධිමත් ප්‍රජාමූල ආර්ථික සම්පත් වෙත කාන්තාවන්ගේ පිවිසීම සහ ඒවායේ කාන්තාවන්ගේ නායකත්වය ශක්තිමත් කිරීම | අවිධිමත් ප්‍රජාමූල ආර්ථික සම්පත් වෙත කාන්තාවන්ගේ පිවිසීම සහ ඒවායේ කාන්තාවන්ගේ නායකත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා සකසන ලද පියවර සංඛ්‍යාව<br><br>ක්‍රමවේදයේ ස්වභාවය සහ දිස්ත්‍රික්කය අනුව වෙන් කරන ලද, අවිධිමත් ඉතුරුම් ක්‍රමවේද වෙත පිවිසෙන කාන්තාවන් සංඛ්‍යාව | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය<br><br>සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව | වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය යටතේ වන සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව<br><br>දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල | එක්සත් ජාතීන්ගේ ආයතන<br><br>සිවිල් සමාජ සංවිධාන | 2023 පෙබ-දිගු කාලීන | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | සම්මත කිරීමට නියමිතය |

39 අවශ්‍ය ලියකියවිලි පිළිබඳ ප්‍රතිපත්ති නම්‍යශීලි කිරීම, ණය ගැනීමේ ක්‍රියාවලිය සරල කිරීම, දුෂ්කර ප්‍රදේශවල කාන්තාවන්ට ළඟා වීමේ හැකියාව ඉහළ නැංවීම ඔස්සේ මෙය සිදු කළ හැකිය

## තේමාත්මක ප්‍රමුඛතාව 06:

# සාමය ගොඩනැගීම, ගැටුම් වැළැක්වීම, ගැටුම් නිරාකරණය තුළ තීරණ ගැනීම සහ දේශපාලනය තුළ කාන්තාවන්ගේ සහභාගිත්වය ප්‍රවර්ධනය කිරීම

**ක්‍රමෝපායාත්මක අරමුණු:**

1. සාමය ගොඩනැගීමේ ක්‍රියාකාරකම්, ගැටුම් වැළැක්වීම හා ගැටුම් නිරාකරණය ක්‍රියාත්මක කිරීම හා ප්‍රවර්ධනය කිරීම
2. පාලනයේ සියලු මට්ටම්වල දී තීරණ ගන්නන් ලෙස දැනට වඩා කාන්තාවන් සංඛ්‍යාවක් සම්බන්ධ කර ගැනීම
3. කාන්තාවන්ගේ දේශපාලනික සහභාගිත්වය වැඩි කිරීම
4. සාමය ගොඩනැගීම, ගැටුම් වැළැක්වීම හා ගැටුම් නිරාකරණය පිළිබඳ ක්‍රියාකාරකම් සඳහා වඩාත් සමාන ආකාරයකින් කාන්තාවන් සම්බන්ධ කර ගැනීම
5. පක්ෂ නියෝජනය තුළ ස්ත්‍රී පුරුෂ සමබරතාව සාක්ෂාත් කර ගන්නා බවට ප්‍රතිඥා දීමට දේශපාලන පක්ෂ දිරි ගැන්වීම

අවධාන ක්ෂේත්‍රය

# 08

**සාමය ගොඩනැගීම සහ ශ්‍රී ලංකාවේ ප්‍රජාව අතර සමගිය ප්‍රවර්ධනය කිරීම**

| ප්‍රතිඵලය | වගකිව යුතු ආයතනය/නිලධාරියා |
|---|---|
| සාමය ගොඩනැගීම, ගැටුම් වැළැක්වීම හා ගැටුම් නිරාකරණය සඳහා වඩාත් සමාන ආකාරයකින් කාන්තාවන් සම්බන්ධ කර ගැනීම සහ පාලනයේ හා දේශපාලනයේ තීරණ ගැනීමේ මට්ටම්වල දී කාන්තාවන් සම්බන්ධ කර ගැනීම මගින් ශ්‍රී ලාංකික සමාජයේ ප්‍රජාතන්ත්‍රවාදී පරමාදර්ශ ප්‍රවර්ධනය කිරීම | • කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය<br>• අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය |

| ප්‍රධාන ක්‍රියාකාරකම් | දර්ශක | සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීමේ ක්‍රම | ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ ආයතන | සහාය දෙන ආයතන | | කාල රාමුව | නිරීක්ෂණ ආයතනය | අය වැය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රාජ්‍ය ක්‍රියාකාරකයන් | රාජ්‍ය නොවන ක්‍රියාකාරකයන් | | | |
| **8.1**<br>සාමය ගොඩනැගීම හා ගැටුම් නිරාකරණය තුළ කාන්තාවන්ගේ අර්ථාන්විත සහභාගිත්වය පිළිබඳ අවධානයක් සහිතව විශේෂයෙන් ම තනි ප්‍රජාවක ජන විකාශ තුලනය 70% ඉක්මවන ප්‍රදේශ හා එයට සීමා නොවී ප්‍රජා කණ්ඩායම් අතර සාමය ඇති කිරීම සඳහා ප්‍රාදේශීය මට්ටමේ සාමය ගොඩ නැගීමේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම | ප්‍රජාව අතර අන්තර් ක්‍රියාකාරී අයුරින් පැවැත්විය හැකි සම්පාදනය කරන ලද සාමය ගොඩනැංවීමේ ක්‍රියාකාරකම් සංඛ්‍යාව<br><br>ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සහ එවැනි වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද ප්‍රදේශ සංඛ්‍යාව<br><br>සාමය ගොඩ නැගීමේ වැඩසටහන්වලට පැමිණෙන කාන්තාවන් සංඛ්‍යාව<br><br>සෑම ග්‍රාම නිලධාරි වසමකම පිහිටුවනු ලබන මහජන කේන්ද්‍ර මණ්ඩලවල කාන්තා නියෝජන | ජාතික සමගිය හා ප්‍රතිසන්ධානය සඳහා වන කාර්යාලය | ජාතික සමගිය හා ප්‍රතිසන්ධානය සඳහා වනකාර්යාලය | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය<br><br>රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය<br><br>ජනමාධ්‍ය අමාත්‍යාංශය<br><br>මහජන ආරක්ෂක අමාත්‍යාංශය | එක්සත් ජාතීන්ගේ ආයතන<br><br>සිවිල් සමාජ සංවිධාන | 2023 ජන-දීර්ඝ කාලීන | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | සම්මත කිරීමට නියමිතය |

| ප්‍රධාන ක්‍රියාකාරකම් | දර්ශක | සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීමේ ක්‍රම | ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ ආයතන | සහාය දෙන ආයතන | | කාල රාමුව | නිරීක්ෂණ ආයතනය | අය වැය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රාජ්‍ය ක්‍රියාකාරකයන් | රාජ්‍ය නොවන ක්‍රියාකාරකයන් | | | |
| **8.2**<br>සාමය ගොඩනැංවීම මූලික නායකත්වය සහ ප්‍රජාව අතර කාන්තාවන්ගේ දායකත්වය පිළිබඳ දැක්මකින් යුතුව අන්තර් ප්‍රජා සංවාද පැවැත්වීම | ඒ ඒ දිස්ත්‍රික්කයේ පවත්වන ලද සංවාද සංඛ්‍යාව<br><br>සංවාදවලට සහභාගි වූ කාන්තාවන් සංඛ්‍යාව<br><br>සාමය ගොඩනැංවීම සහ ගැටුම් නිරාකරණය පිළිබඳ ඉහළ නැංවුණු අවබෝධයක් සහිතව සහභාගිවූවන්<br><br>සංවාදවල ප්‍රතිඵල මත පදනම් වූ අනුගාමී ක්‍රියාකාරකම් සංඛ්‍යාව | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය<br><br>බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය<br><br>රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය<br><br>පළාත් පාලන ආයතන | එක්සත් ජාතීන්ගේ ආයතන<br><br>සිවිල් සමාජ සංවිධාන | 2023 ජන -දීර්ඝ කාලීන | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | සම්මත කිරීමට නියමිතය |
| **8.3**<br>කාන්තා සාම ක්‍රියාකාරිකයන්ට විශේෂ අවධානය ලබා දෙමින් අන්තර් ආගමික ප්‍රජාව වැනි දැනට පවත්නා සබඳතා ශක්තිමත් කරමින් සමාජ සංවාද ඉදිරියට ගෙන යෑම සඳහා සාම ක්‍රියාකාරිකයින්ගේ සබඳතා ජාල වර්ධනය කිරීම | නිර්මාණය කර ක්‍රියාවේ යොදවන ලද සබඳතා ජාල වර්ධනය කිරීමේ ක්‍රියාකාරකම් සංඛ්‍යාව<br><br>සබැඳි කණ්ඩායම් මගින් කැඳවන ලද රැස්වීම් සංඛ්‍යාව<br><br>දැනට පවතින සබැඳි කණ්ඩායම්/ප්‍රජාවන් සමග ඒකාබද්ධ වී පවත්වන ලද සංවාද/සාමූහික ක්‍රියාකාරකම් සංඛ්‍යාව | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල<br><br>ශ්‍රී ලංකා ජාතික සාම මණ්ඩලය යටතේ වන අන්තර්-ආගමික කමිටු | එක්සත් ජාතීන්ගේ ආයතන<br><br>සිවිල් සමාජ සංවිධාන | 2023 ජන -දීර්ඝ කාලීන | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | සම්මත කිරීමට නියමිතය |

| ප්‍රධාන ක්‍රියාකාරකම් | දර්ශක | සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීමේ ක්‍රම | ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ ආයතන | සහාය දෙන ආයතන | | කාල රාමුව | නිරීක්ෂණ ආයතනය | අය වැය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රාජ්‍ය ක්‍රියාකාරකයන් | රාජ්‍ය නොවන ක්‍රියාකාරකයන් | | | |
| **8.4**<br>සන්දර්භීය සහ ඓතිහාසික ආඛ්‍යාන පිළිබඳව සාකල්‍ය අවබෝධයකින් යුතුව පරිපාලනයේදී සහ සාම ක්‍රියාවලියේදී නායකත්වය ගැනීම සඳහා තරුණ කාන්තාවන් සංවර්ධනය කිරීම සහ පුහුණු කිරීම | හැඳින්වීම්, අන්තර්-මධ්‍ය සහ ඉහළ පාඨමාලා මට්ටම්වලින් සම්පාදනය කරන ලද මොඩියුල සංඛ්‍යාව<br><br>පාඨමාලා පැවැත්වීම සඳහා රාජ්‍ය විශ්වවිද්‍යාල සහ මධ්‍යස්ථාන සමග ගොඩනගාගත් සබඳතා සංඛ්‍යාව<br><br>පුහුණු වූ තරුණ කාන්තාවන් සංඛ්‍යාව<br><br>සන්දර්භීය සහ ඓතිහාසික ආඛ්‍යාන පිළිබඳ අවබෝධය සහ නායකත්ව කුසලතා සංවර්ධනය ප්‍රතිශතය | අධ්‍යාපන අමාත්‍යාංශය<br><br>කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | අධ්‍යාපන අමාත්‍යාංශය | එක්සත් ජාතීන්ගේ ආයතන<br><br>සිවිල් සමාජ සංවිධාන<br><br>පර්යේෂණ ආයතන | 2023 ජන -දීර්ඝ කාලීන | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | සම්මත කිරීමට නියමිතය |

අවධාන ක්ෂේත්‍රය

# 09

**කාන්තාවන්ගේ දේශපාලන සහභාගිත්වය ප්‍රවර්ධනය කිරීම සහ තීරණ ගැනීමේ තනතුරුවලට දැනට වඩා කාන්තාවන් සංඛ්‍යාවක් සම්බන්ධ වීම**

| ප්‍රතිඵලය | වගකිව යුතු ආයතනය/නිලධාරියා |
|---|---|
| කාන්තාවන්ට එරෙහි හිංසනය, විශේෂයෙන් වැඩිහිටි කාන්තාවන්, ගැහැනු ළමයින්, ආබාධ සහිත කාන්තාවන් සහ සංක්‍රාන්ති කාන්තාවන් ට එරෙහි හිංසනය වැළැක්වීම සඳහා සහ ඔවුන්ගේ සමාජ ආර්ථික අවස්ථා සහ තීරණ ගැනීමේ සහභාගිත්වය වැඩිදියුණු කිරීම සඳහා පියවර ගෙන ඇත | • කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය |

| ප්‍රධාන ක්‍රියාකාරකම් | දර්ශක | සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීමේ ක්‍රම | ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ ආයතන | සහාය දෙන ආයතන | | කාල රාමුව | නිරීක්ෂණ ආයතනය | අය වැය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රාජ්‍ය ක්‍රියාකාරකයන් | රාජ්‍ය නොවන ක්‍රියාකාරකයන් | | | |
| **9.1** ආන්තිකකරණයට ලක් වූ අඩු වරප්‍රසාදිත සමාජ කණ්ඩායම්/ප්‍රජාව කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් ක්ෂේත්‍රවලට සුවිශේෂ වූ සමූහයන්හි කාන්තා නායකත්ව සහ කළමනාකරණ තනතුරු සඳහා උද්දේශනය කිරීම[40] | ප්‍රජාමූල මට්ටමේ ප්‍රජාව තුළ නායකත්ව තනතුරු / තීරණ ගැනීමේ තනතුරු භාර ගන්නා කාන්තාවන් සංඛ්‍යාව (වනිතා සංවර්ධන නිලධාරීන් විසින් රැස් කෙරෙන දත්ත පදනම් කර ගෙන තක්සේරු කළ යුතු ය)<br><br>කාන්තා දායකත්වයන්ගේ සුවිශේෂීත්වය ඉස්මතු කිරීම සඳහා ක්ෂේත්‍රවලට සුවිශේෂී වූ සමූහයන්හි සිදු කරන සංවේදීකරණ වැඩසටහන් සංඛ්‍යාව | දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල | ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය<br><br>කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | වනිතා සංවර්ධන නිලධාරීන්<br><br>වැවිලි මානව සංවර්ධන භාරය | එක්සත් ජාතීන්ගේ ආයතන<br><br>සිවිල් සමාජ සංවිධාන | 2023 ජන -දීර්ඝ කාලීන | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | සම්මත කිරීමට නියමිතය |

40 මෙම ප්‍රජාව අතරට වතු ප්‍රජාව සහ ධීවර ප්‍රජාව අයත් වන අතර අනෙකුත් ප්‍රජාද අන්තර්ගත වේ. උදාහරණ ලෙස වතුවල ජීවත් වන හා වැඩ කරන ප්‍රජාව මුහුණ දෙන ගැටලු බොහෝ විට සාකච්ඡා කෙරෙන්නේ 'තලෙයිවර්' නමින් හැඳින්වෙන පිරිමි ප්‍රජා නායකයන් හරහා බව උපදේශන අතරතුර දී සහභාගිකයෝ සඳහන් කළහ. 'තලෙයිවි' නමින් හැඳින්වෙන කාන්තා ප්‍රජා නායකයන් බවට පත් වීමට කාන්තාවන් දිරි ගැන්වීමේ අවශ්‍යතාව කෙරෙහි සාකච්ඡාවේ අවධානය යොමු විය.

| ප්‍රධාන ක්‍රියාකාරකම් | දර්ශක | සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීමේ ක්‍රම | ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ ආයතන | සහාය දෙන ආයතන | | කාල රාමුව | නිරීක්ෂණ ආයතනය | අය වැය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රාජ්‍ය ක්‍රියාකාරකයන් | රාජ්‍ය නොවන ක්‍රියාකාරකයන් | | | |
| **9.2**<br>සාමාන්‍ය ගම් මට්ටමේ සමාජ / සංගම් තුළ නායකත්ව තනතුරු හා තීරණ ගැනීමේ තනතුරු භාර ගැනීමට කාන්තාවන් දිරි ගැන්වීම හා පහසුකම් සැපයීම[41, 42] | 2023 ජනවාරි 30 දින වන විට ගම් මට්ටමේ සමාජ හා සංගම් තුළ නායකත්ව තනතුරු දරන කාන්තාවන් සංඛ්‍යාව<br><br>වාර්ෂික පදනමකින් එවැනි සංගම් තුළ නායකත්ව තනතුරු භාර ගන්නා කාන්තාවන් සංඛ්‍යාව<br><br>ඇගයුම් කාල පරිච්ඡේදය අවසන් වන විට එවැනි සමාජ තුළ නායකත්ව තනතුරු දරන කාන්තාවන් සංඛ්‍යාව වැඩි වීමේ ප්‍රතිශතය | දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය<br><br>වනිතා සංවර්ධන නිලධාරීන්<br><br>දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල | එක්සත් ජාතීන්ගේ ආයතන<br><br>සිවිල් සමාජ සංවිධාන | 2023 පෙබ -2026 ජන | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | සම්මත කිරීමට නියමිතය |
| **9.3**<br>අතිවිශේෂ ගැසට් පත්‍රයක් තුළින් අනුමැතිය ලබා දීම මඟින් සමථ මණ්ඩල තුළ කාන්තාවන්ගේ සමාන නියෝජනය සහතික කිරීම හා ප්‍රවර්ධනය කිරීම | සමථකරණය තුළ කාන්තාවන් සඳහා සමාන නියෝජනය සහතික කිරීම සඳහා අතිවිශේෂ ගැසට් පත්‍රයක් නිකුත් කිරීම | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | සමථ මණ්ඩල කොමිෂන් සභාව<br><br>අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | සිවිල් සමාජ සංවිධාන | 2023 ජන -දීර්ඝ කාලීන | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | සම්මත කිරීමට නියමිතය |

41 ප්‍රජා මට්ටමේ සහභාගිකයෝ කාන්තාවන්ට සීමා නොවන සමාජ/සංගම් තුළ කාන්තාවන්ගේ තීරණ ගැනීමේ කාර්යභාරයෙහි වැදගත්කම අවධාරණය කළහ'
42 මෙයට ප්‍රජා මණ්ඩල, කාන්තා බල මණ්ඩල මෙන්ම ඒ හැර වෙනත් කණ්ඩායම්ද අයත් වෙයි.

| ප්‍රධාන ක්‍රියාකාරකම් | දර්ශක | සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීමේ ක්‍රම | ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ ආයතන | සහාය දෙන ආයතන | | කාල රාමුව | නිරීක්ෂණ ආයතනය | අය වැය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රාජ්‍ය ක්‍රියාකාරකයන් | රාජ්‍ය නොවන ක්‍රියාකාරකයන් | | | |
| **9.4** සියලු සමථ මණ්ඩලවලට ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳව ප්‍රතිචාර දැක්වීම සම්බන්ධ පුහුණු ලැබීම තහවුරු කිරීම | දිස්ත්‍රික්කවලට අනුව වෙන්කර දක්වන ලද පැවැත්වූ පුහුණු වැඩසටහන් සංඛ්‍යාව<br><br>දිස්ත්‍රික්කවලට අනුව සහ ස්ත්‍රී පුරුෂ භාවයට අනුව වෙන්කර දක්වන ලද පුහුණු කළ සහ ධාරිතා සංවර්ධනය කළ සමථ මණ්ඩල සාමාජිකයන් සංඛ්‍යාව<br><br>ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව හා සම්බන්ධ ගැටලු පිළිබඳ ඉහළ අවබෝධයක් ඇති බවට වාර්තා වන සමථ මණ්ඩල සාමාජිකයන් ප්‍රතිශතය | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | සමථ මණ්ඩල කොමිෂන් සභාව | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | සිවිල් සමාජ සංවිධාන | 2023 ජන -දීර්ඝ කාලීන | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | සම්මත කිරීමට නියමිතය |
| **9.5** කාන්තා සමථ මණ්ඩල සාමාජිකයන්ගේ සබඳතා ජාලයක් ගොඩනැගීම සහ ඒ ඒ ජාතීන් අතර සහ ඒ ඒ ප්‍රදේශ අතර හුවමාරු වූ ප්‍රවර්ධනය කිරීම | දිස්ත්‍රික්ක අනුව වෙන්කර දක්වන ලද කාන්තා සමථ මණ්ඩල සාමාජිකයන් සංඛ්‍යාව<br><br>වාර්ෂිකව සිදුවනරැස්වීම් හෝ හුවමාරු වැඩසටහන් සංඛ්‍යාව<br><br>බෙදාහදා ගන්නා ලද සහ ගොනු කරන ලද විශිෂ්ට භාවිත සහ උගත් පාඩම් සංඛ්‍යාව | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | සමථ මණ්ඩල කොමිෂන් සභාව | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | එක්සත් ජාතීන්ගේ ආයතන<br><br>සිවිල් සමාජ සංවිධාන | 2023 ජන -දීර්ඝ කාලීන | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | සම්මත කිරීමට නියමිතය |

| ප්‍රධාන ක්‍රියාකාරකම් | දර්ශක | සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීමේ ක්‍රම | ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ ආයතන | සහාය දෙන ආයතන | | කාල රාමුව | නිරීක්ෂණ ආයතනය | අය වැය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රාජ්‍ය ක්‍රියාකාරකයන් | රාජ්‍ය නොවන ක්‍රියාකාරකයන් | | | |
| **9.6**<br>ජාතික මට්ටමේ දේශපාලනයට ඇතුළත් කර ගැනීම මගින් කාන්තාවන්ගේ නියෝජනය ප්‍රවර්ධනය කිරීම සඳහා යටත් පිරිසෙයින් එක් එක් පක්ෂයේ නාම යෝජනාවලින් 25% ක් කාන්තාවන්ට ලබා දෙන බව සහතික කිරීම සඳහා උද්දේශනය කිරීම | ජාතික මට්ටමේ දේශපාලනයට පිවිසෙන කාන්තාවන් සංඛ්‍යාව වැඩි වීමේ ප්‍රතිශතය<br><br>පාර්ලිමේන්තු මැතිවරණය හරහා ජාතික මට්ටමේ දේශපාලනයට පිවිසෙන කාන්තාවන් සංඛ්‍යාව<br><br>දේශපාලන පක්ෂය අනුව වෙන් කරන ලද ජාතික මැතිවරණ සඳහා නාමයෝජනා ලැබුණු කාන්තා ඡන්ද අපේක්ෂකයන් සංඛ්‍යාව | ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව | පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදය | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | එක්සත් ජාතීන්ගේ ආයතන | 2023 පෙබ-2026 ජන | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | සම්මත කිරීමට නියමිතය |
| **9.7**<br>සහාය ලබා දීම සහ මග පෙන්වීම් ලබා ගැනීම උදෙසා ජාතික මට්ටමින් සහ උප ජාතික මට්ටමින් දේශපාලනයේ නිරතවන කාන්තාවන් අන්තර් පාක්ෂිකව සබඳතා ගොඩනඟා ගැනීම ඇරඹීම සහ ශක්තිමත් කිරීම | දේශපාලනයේ නියුතු කාන්තාවන්ගේ එකමුතුව සමඟ සම්බන්ධ වී සිටින කාන්තාවන් සංඛ්‍යාව<br><br>ඡන්දයෙන් තේරී පත්වූ නියෝජිතයින් සඳහා කාන්තාවන් සවිබලග ැන්වීම නායකත්වය පිළිබඳව පුහුණු වැඩසටහන් සංඛ්‍යාව | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය<br><br>පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදය | රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය<br><br>කාන්තා මහජන නියෝජිතයන්ගේ දිස්ත්‍රික් සංසදය | එක්සත් ජාතීන්ගේ ආයතන<br><br>සිවිල් සමාජ සංවිධාන | 2023 පෙබ-2026 ජන | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | සම්මත කිරීමට නියමිතය |

# අධීක්ෂණය සහ ඇගයීම

## අධීක්ෂණ සහ ඇගයුම් ක්‍රමවේදය

ජාතික ක්‍රියාකාරී සැලැස්මෙහි දක්වා ඇති නිමැවුම් සාර්ථක ලෙස ලඟාකර ගැනීම, කාන්තාව, සාමය ආරක්ෂාව පිළිබඳ දැනට සැලසුම්ගත මෙන්ම හා අනාගතයේදී අපේක්ෂිත කාර්යයන් සඳහා සම්පත් ඵලදායී, ප්‍රශස්ත හා කාර්යක්ෂමව භාවිත කිරීම හා නියමිත ඉලක්ක සම්බන්ධයෙන් වගවීම සාක්ෂාත් කර ගැනීම සහතික කිරීම යන කරුණු ඉතා ශක්තිමත් අධීක්ෂණ හා ඇගයුම් (Monitoring and Evaluation – M & E) යාන්ත්‍රණයක් සමග අත්‍යන්තයෙන් ම බැඳී ඇත. වඩාත් ප්‍රායෝගික ප්‍රවේශයකින් යුතුව ක්‍රියාකාරකම් ඉටුකිරීම හා ක්‍රමවේදයන් දියත් කිරීම සඳහා පහසුකම් සැපයීමට, සෑම ක්ෂේත්‍රයකටම නිමැවුම් මට්ටමේ ප්‍රතිඵල (Outcome Level Results) ලඟාකර ගැනීමට හා එයට දායක වන ක්‍රියාකාරකම් ද මැන බැලීම සඳහා එක් එක් කැපවීම යටතේ මෙහෙයුම් හා ඇගයුම් කාල රාමුවක් හඳුන්වා දී ඇත. ඉහත සඳහන් මැදිහත්වීම්වල සෘජු ප්‍රතිඵලයක් වශයෙන් වඩාත් උසස් මට්ටමේ ආයතනික හා චර්යාමය වෙනස් වීම් ඇති කරන ප්‍රතිඵල සාක්ෂාත් කර ගැනීම සඳහා අදාළ රාජ්‍ය ක්‍රියාකාරීන් විසින් ඉහත දක්වන ලද එක් එක් උපායමාර්ග යටතේ විස්තර කර ඇති ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරනු ලැබේ. මැදිහත්වීම්වල දීර්ඝ කාලීන අපේක්ෂිත හා අනපේක්ෂිත බලපෑම් සිවිල් සමාජය හා සංවර්ධන හවුල්කරුවන් වැනි අතිරේක රාජ්‍ය හා රාජ්‍ය නොවන ක්‍රියාකාරකයන්ගේ සාමූහික පරිශ්‍රමයන් හරහා අවසානයේ ගැටුමෙන්, සමාජ-ආර්ථික, සංස්කෘතික, ආයතනික හා වෙනත් සාධකවලින් බලපෑමට ලක් වූ කාන්තාවන් හා ගැහැණු ළමයින්ගේ තත්ත්වය හා අවශ්‍යතා සම්බන්ධයෙන් වඩාත් උසස් මට්ටමේ වෙනස් වීම්වලට දායක වන අතර, අදාළ කොටස් යටතේ පහත විස්තර කෙරෙන පරිදි මධ්‍ය කාලීන හා අවසන් ඇගයීම් මගින් සත්‍යාපනය පරීක්ෂා කෙරෙනු ඇත.

## ඉලක්ක සහ දර්ශක

ජාතික ක්‍රියාකාරී සැලැස්මේ අධීක්ෂණ රාමුව සකස් කරන ලද්දේ, තිරසර සංවර්ධන අරමුණු සහ ප්‍රජාමූල මට්ටමේ උපදේශකත්ව සංවාදවල දී විවිධ පාර්ශවකරුවන් විසින් සම්පාදනය කරන ලද යෙදවුම් අන්තර්ගත කොට ය. ජාතික ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්ක, තිරසර සංවර්ධන අරමුණු 5 (SDG 5) ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාව සාක්ෂාත් කර ගැනීම සහ සියලු කාන්තාවන් හා ගැහැණු ළමයින් බල ගැන්වීම යන්න ප්‍රධාන වශයෙන් ඇතුළත් නමුත් ඊට සීමා නොවී තිරසර සංවර්ධන අරමුණු 16 (SGD 16) තිරසර සංවර්ධනය උදෙසා සාමකාමී හා සියල්ලන් ඇතුළත් කර ගත් සමාජයක් ප්‍රවර්ධනය කිරීම, සියල්ලන්ට යුක්තිය වෙත ප්‍රවේශය සම්පාදනය සහ සියලු මට්ටම් තුළ ඵලදායක, වගවන හා සියල්ලන් ඇතුළත් කර ගත් ආයතන ගොඩනැගීම යන තිරසර සංවර්ධන අරමුණුවලට[44] ද අනුකූල වන පරිදි සකස් කර තිබේ.

තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීමේ දී සහ ගෝලීය ස්ත්‍රී පුරුෂ සමාජභාවීය පරතර දර්ශකය වැනි ගෝලීය දර්ශක තුළ ශ්‍රේණිගත වීමේ දී, ශ්‍රී ලංකාව අත් කර ගන්නා කාර්ය සාධනය, ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කරන අතරතුර සමස්ත අරමුණු ආශ්‍රිත මිනුම්දඬුවල ප්‍රගතිය සමග සසඳමින් නිත්‍ය කාල පරතර තුළ තක්සේරු කළ යුතු ය. එක් එක් කැපවීම යටතේ අපේක්ෂිත නිමැවුම් විශේෂිත ක්‍රියාකාරකම් සමග ගළපා අදාළ කැපවීම් හා ඒවාට දායක වන ක්‍රියාකාරකම් සඳහා නම් කරන ලද ක්‍රියාත්මක කරන හා සහයෝගී වන එක් එක් ප්‍රධාන රාජ්‍ය ආයතනය වෙන් වෙන් රාමුවලට ඇතුළත් කරන ලදී. මෙම මෙහෙයුම් හා ඇගයීම් රාමුව ක්‍රියාකාරකම් සම්පූර්ණ කිරීම සඳහා වන දර්ශක, ඒවායේ සත්‍ය අසත්‍යතාව පරීක්ෂා කිරීමේ ක්‍රම, කාල රාමුව, මෙහෙයුම් වගකීම පැවරෙන ආයතනය, සහාය දෙන ආයතන, රාජ්‍ය හා රාජ්‍ය නොවන අංශවල ක්‍රියාකාරකයන් සහ අයවැය ප්‍රතිපාදනයන්ගෙන් සමන්විත වේ.

---

43 SDG 1 – සෑම තැනකින් ම දරිද්‍රතාවේ සියලු ස්වරූප තුරන් කිරීම
SDG 3 – සියලු වයස් මට්ටම්වල සියලුදෙනා උදෙසා නිරෝගී ජීවිත සහතික කිරීම හා යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම
SDG 4 – සියල්ලන් උදෙසා සියල්ලන් ඇතුළත් කර ගත් හා සාධාරණ ගුණාත්මක අධ්‍යාපනය සහතික කිරීම සහ ජීවිත කාලීන ඉගෙනුම් අවස්ථා ප්‍රවර්ධනය කිරීම
SDG 5 – ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාව සාක්ෂාත් කර ගැනීම සහ සියලු කාන්තාවන් හා ගැහැනු ළමයින් බල ගැන්වීම
SDG 8 – සියල්ලන් උදෙසා ශක්තිමත්, සියල්ලන් ඇතුළත් කර ගත් හා තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ හා ඵලදායක සේවා නියුක්තිය සහ ශිෂ්ට රැකියා ප්‍රවර්ධනය කිරීම
SDG 9 – ශක්තිමත් යටිතල පහසුකම් ගොඩනැගීම, සියල්ලන් ඇතුළත් කර ගත් හා තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කිරීම සහ නවෝත්පාදනය පෝෂණය කිරීම
SDG 10 – රටවල් තුළ හා අතර අසමානතාව අවම කිරීම
SDG 16 – තිරසර සංවර්ධනය උදෙසා සාමකාමී හා සියල්ලන් ඇතුළත් කර ගත් සමාජයක් ප්‍රවර්ධනය කිරීම, සියල්ලන්ට යුක්තිය වෙත ප්‍රවේශය සම්පාදනය කිරීම සහ සියලු මට්ටම් තුළ ඵලදායක, වග වන හා සියල්ලන් ඇතුළත් කර ගත් ආයතන ගොඩනැගීම

# මෙහෙයුම් සහ ඇගයීම ක්‍රියාත්මක කිරීමේ ක්‍රමෝපාය

එක් එක් කැපවීම සංයුක්ත තිරසර ප්‍රතිඵල බවට ඵලදායක ලෙස පරිවර්තනය කිරීමට නම් කාන්තාව, සාමය හා ආරක්ෂාව පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය හා රාජ්‍ය නොවන ක්‍රියාකාරකයන් ගණනාවක් විසින් දරනු ලබන ඒකාබද්ධ පරිශ්‍රමයක් අවශ්‍ය වේ. විවිධ හවුල්කරුවන් හා පාර්ශවකරුවන් ගණනාවක් සම්බන්ධ වීම නිසා, මැදිහත්වීම්වලට සමාන්තරව ප්‍රධාන මෙහෙයුම් හා ඇගයීම් වගකීම් අධීක්ෂණය කිරීම හා ඉටු කිරීම සඳහා අන්තර් ආයතන හා පාර්ශවකරුවන් ගණනාවකගෙන්සමන්විත සම්බන්ධීකරණ මණ්ඩල දෙකක් - අන්තර් ආයතනික සම්බන්ධීකරණ හා තක්සේරු කමිටුව සහ ජාතික ප්‍රධාන නියමු කමිටුව ලෙස ස්ථාපිත කෙරෙනු ඇත. මෙහෙයුම් ක්‍රියාවලි සැලැස්ම ක්‍රියාත්මක කිරීම අදාළ සැලසුම්වලට අනුකූලව සිදු කෙරෙන්නේ දැයි තක්සේරු කිරීමේ දී රජයට උදව් වන අතර, ඇගයීම් ක්‍රියාවලි බිම් මට්ටමේ අභියෝගහා අවස්ථාවලට ප්‍රතිචාර වශයෙන් කාන්තාව, සාමය හා ආරක්ෂාව පිළිබඳ මැදිහත් වීම් අධ්‍යයනය කිරීම හා අනුරූප කිරීම සඳහා සහාය වනු ඇත. සහභාගිත්ව මෙහෙයුම්හා ඇගයීම් ප්‍රවිෂ්ඨය සඳහා බෙදාහදා ගත් අයිතීන් හා වගවීම අන්තර්ගත අතර ජාතික, උප-ජාතික හා ජාත්‍යන්තර තීරණ ගැනීමේ ක්ෂේත්‍රවලට ජාතික ක්‍රියාකාරී සැලැස්මේ අදාළත්වය හා යෝග්‍යතාව ශක්තිමත් කිරීම සඳහා විශේෂයෙන් ම සිවිල් සමාජයේ දැනට පවත්නා ප්‍රවීණතා ද පදනම් කර ගනු ඇත.

පහත දැක්වෙන කොටස් තුළ විස්තර කෙරෙන මෙහෙයුම් හා ඇගයීම් යාන්ත්‍රණ සැලසුම් කරන ලද්දේ, උපදේශකත්ව සංවාදවල දී නැවත නැවතත් ප්‍රකාශ කළ පරිදි ක්‍රියාත්මක කිරීමේ සැලසුම් සහ මෙහෙයුම් හා ඇගයීම් රාමු ක්‍රියාවට නැංවීමේ දී පළාත් පාලන ආයතන හා සිවිල් සමාජයට ප්‍රමාණවත් පරිදි සම්බන්ධවීමට හැකියාව ලබාදීම සඳහා ය. එහි ලා නියම කෙරෙන ව්‍යුහ හා කාර්යයන් සියලු පාර්ශවකරුවන් සම්බන්ධීකරණය කිරීමට හා සම්බන්ධ වීමට පහසුකම් සැපයීමට පමණක් සීමා නොවී හඳුනා ගත් සියලු පාර්ශවකරුවන්ගේ සාමූහික දායකත්වය සහ තනි තනි කාර්යභාරයන් හා වගකීම් ඉස්මතු කර දක්වමින් ජාතික ක්‍රියාකාරී සැලැස්ම කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශයටම අයත් යමක් ලෙස දැකීම වළක්වනු ද ඇත.

## අන්තර් ආයතනික සම්බන්ධීකරණ හා තක්සේරු කමිටුව

ශ්‍රී ලංකා රජය, විශේෂයෙන් ම කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාව සහ කාන්තාව, සාමය හා ආරක්ෂාව පිළිබඳ න්‍යාය පත්‍රය පෙරට ගෙන යෑමට කැප වී සිටී. රාජ්‍ය හා රාජ්‍ය නොවන යන දෙයාකාරයේ ම ක්‍රියාකාරිකයන්ගෙන් සමන්විත අන්තර් ආයතනික සම්බන්ධීකරණ හා තක්සේරු කමිටු ස්ථාපිත කිරීම, ජාතික ක්‍රියාකාරී සැලැස්මේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය දේශපාලන අධිෂ්ඨානය හා උද්දේශනය තහවුරු කරන ප්‍රධාන යාන්ත්‍රණ ස්ථාපිත කිරීමක් ලෙස රජය විසින් සලකනු ලැබේ. රාජ්‍ය නොවන ක්‍රියාකාරින් එනම්, සිවිල් සමාජ සංවිධාන සම්බන්ධ වීම, ශ්‍රී ලාංකික මහජනතාව අතර දැනුවත්කම ඉහළ නැංවීම සඳහාත් ජාතික ක්‍රියාකාරී සැලැස්මේ මැදිහත් වීම් ප්‍රවර්ධනය කිරීම සඳහාත් දායක වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

එක් එක් කැපවීමට අදාළව හඳුනා ගත් ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ ආයතනය අදාළ මෙහෙයුම් හා ඇගයීම් පරිශ්‍රම ක්‍රියාත්මක කිරීම සඳහා සම්බන්ධීකරණ හා තක්සේරු කමිටුවක් පිහිටුවීමට මූලික පියවර ගනු ඇත. කැඳවුම් කරන රජයේ ආයතනය ජාතික ක්‍රියාකාරී සැලැස්ම තුළ දී ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ ආයතනය යටතේ හඳුනා ගත් ආයතනයක් විය යුතු යැයි අපේක්ෂා කෙරේ. යම් හෙයකින්, ඒ සඳහා විශේෂිත තනතුරක් හඳුනා ගෙන නොමැති අවස්ථාවල දී ප්‍රකාශිත ආයතනය, ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ ආයතනය නියෝජනය කරන කැඳවුම් නියෝජිතයා ලෙස, සිය පරිපාලන ව්‍යුහය තුළ සිටින ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කරනු ඇත. එම කැඳවුම්කරුවා කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ නිලධාරියෙකු නොවේ නම් අමාත්‍යාංශය සමග සමීප සම්බන්ධතාවකින් කටයුතු කළ යුතු යැයි අපේක්ෂා කෙරේ. මෙම කමිටුව යටත් පිරිසෙයින් හඳුනා ගත් එක් එක් රාජ්‍ය හා රාජ්‍ය නොවන ක්‍රියාකාරිකයාගෙන් එක් සාමාජිකයෙකු විසින් හෝ නියෝජනය කෙරෙන බව සහතික කිරීම කැඳවුම් නියෝජිතයාගේ වගකීමක් විය යුතු ය.

### කමිටුවේ සංයුතිය

එක් එක් සම්බන්ධීකරණ හා තක්සේරු කමිටුව පුද්ගලයන් දස දෙනෙකුගේ උපරිමයකට යටත්ව යටත් පිරිසෙයින් පුද්ගලයන් පස් දෙනෙකුගෙන්වත් සමන්විත වනු ඇත. මෙහි ලා නියම කෙරෙන අවම හා උපරිම සාමාජිකත්ව සීමාව මගින් පමණට වඩා විශාල හෝ කුඩා සම්බන්ධීකරණ මණ්ඩල හේතු කොට ගෙන එවැනි මණ්ඩල ඵලදායක ලෙස ක්‍රියාත්මක කිරීමෙහි ලා බාධාවක් ඇති නොවන බව සහතික කිරීම පිණිස පනවා තිබේ.

### සම්බන්ධීකරණ හා තක්සේරු කමිටුවේ සාමාජිකත්වය

අවම වශයෙන් පහත දැක්වෙන කාර්ය මාණ්ඩලිකයන් සාමාජිකයන් ලෙස සැලකිය යුතු ය:

(i) ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ ආයතනය නියෝජනය කරන කැඳවුම් නියෝජිතයා;
(ii) ප්‍රධාන ක්‍රියාත්මක කරන ආයතනයේ තවත් එක් සාමාජිකයෙක්;
(ii) ජාතික ක්‍රියාකාරී සැලැස්මේ අදාළ ක්‍රියාකාරකම සඳහා හඳුනා ගත් එක් එක් අතිරේක රාජ්‍ය ක්‍රියාකාරිකයාගෙන් යටත් පිරිසෙයින් එක් නියෝජිතයෙක්;
(iv) අදාළ ක්‍රියාකාරකම සඳහා හඳුනා ගත් එක් එක් රාජ්‍ය නොවන ක්‍රියාකරකයාගෙන් යටත් පිරිසෙයින් එක් නියෝජිතයෙක්;
(v) ඉහත සඳහන් නියෝජිතයන් අතරට කාන්තා හා ළමා කටයුතු හා සමාජ ආරක්ෂණ අමාත්‍යාංශයේ නියෝජිතයෙකු ඇතුළත් නොවන අවස්ථාවල දී එම අමාත්‍යාංශයෙන් යටත් පිරිසෙයින් එක් නියෝජිතයෙක්;
(vi) ව්‍යාපෘති කළමනාකරණ හා නිරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් යටත් පිරිසෙයින් එක් නියෝජිතයෙක්;
(vii) අනෙකුත් කමිටු සාමාජිකයන් විසින් ඒකාබද්ධව හඳුනා ගෙන පත් කරන ලද එක් ස්වාධීන ප්‍රවීණයෙක්.

කැඳවුම් නියෝජිතයා සහ කමිටු සභාපතිවරයා හැකි නම් 2026දී මෙම ජාතික ක්‍රියාකාරී සැලැස්මේ වලංගු කාලය අවසන් වන තෙක් සිය ධුරවල රැඳී සිටිය යුතු යැයි අපේක්ෂා කෙරේ. අනෙකුත් සාමාජිකයන් යටත් පිරිසෙයින් වසර දෙකක්වත් සිය සාමාජිකත්වය අඛණ්ඩව පවත්වා ගෙන යා යුතු යැයි අපේක්ෂා කෙරේ. කමිටුවෙන් ඉවත් වන තම නියෝජිතයා වෙනුවට වෙනත් නියෝජිතයෙකු නම් කිරීම සම්බන්ධයෙන් එක් එක් ආයතනය වගකීම දරයි.

### කාල වකවානු, ගණ පූරණය හා නියෝජනය

සම්බන්ධීකරණ හා තක්සේරු කමිටු කාර්තුමය පදනමකින් රැස් වේ. එහි තීරණ ගැනීම සඳහා අවශ්‍ය ගණ පූරණය එය නියෝජනය කරන සියලු සාමාජිකයන්ගෙන් සියයට 75ක් විය යුතු අතර ඒ අතර සියයට 50කට නොඅඩු කාන්තා සාමාජිකයන් සංඛ්‍යාවක් සිටිය යුතු ය. මෙම කමිටු යටත් පිරිසෙයින් කාන්තාවන් සියයට 70කින් සමන්විත විය යුතු ය. සභාපතිවරයා තෝරා ගත යුත්තේ කාන්තා සාමාජිකයන් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වමින් කමිටු සාමාජිකයන් අතරිනි. කෙසේ වුව ද කැඳවුම් නියෝජිතයා හැම විට ම ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ ආයතනය නියෝජනය කරන සාමාජිකයා විය යුතු ය.

### කමිටුවේ ප්‍රධාන කාර්යයන් නිරීක්ෂණය

(i) කාන්තාව, සාමය හා ආරක්ෂාව පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම උදෙසා දත්ත කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම;
(ii) එක් එක් කැප වීම යටතේ දර්ශක පාද රේඛා සහ ඉලක්ක පවත්වා ගෙන යෑම හා යාවත්කාලීන කිරීම - වර්තමානයේ දී පාද රේඛා දත්තවල හිඟයක් පවතින බැවින් මෙය ප්‍රධාන කර්තව්‍යයක් ලෙස සැලකේ;
(iii) නිත්‍ය ප්‍රගති සමාලෝචන සිදු කර ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ ආයතනය, කාන්තා හා ළමා කටයුතු හා සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය සහ නිමැවුම් හා ප්‍රතිඵල මට්ටම් යටතේ හඳුනාගත් දත්ත මූලාශ්‍ර හා නිරීක්ෂණ ආයතන වෙත ද්වි-වාර්ෂිකව නිරීක්ෂණ වාර්තා ඉදිරිපත් කළ යුතු ය. - කාන්තා හා ළමා කටයුතු හා සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය ශ්‍රී ලංකාවේ 2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ අයිතිය පිළිබඳ පනතට අනුකූලව මෙම තොරතුරු වෙත ප්‍රවේශ වීමට මහජනතාවට අයිතිය ඇති බව සහතික කිරීම සඳහා මධ්‍යම ඔන්ලයින් හා ඕෆ්ලයින් දත්ත පදනමක් පවත්වා ගෙන යා යුතු යැයි අපේක්ෂා කෙරේ;

(iv) කාන්තාව, සාමය හා ආරක්ෂාව සහ වෙනත් අදාළ පරිශ්‍රම පිළිබඳව සාක්ෂි පදනම් කර ගත් තීරණ ගැනීමට දැනුවත් කිරීම හා සහාය වීම සඳහා කමිටු තුළ හා කමිටු අතර සහ බාහිර පාර්ශ්වකරුවන් අතර සොයා ගැනීම්, සම්බන්ධීකරණය හා සන්නිවේදනය කෙරෙන ආකාරය අධීක්ෂණය කළ යුතු ය.

## ඇගයීම

(i) ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම ක්‍රමානුකූලව තක්සේරු කිරීම සහ විශ්වසනීය සොයා ගැනීම් ඉදිරිපත් කිරීම සඳහා, සිවිල් සමාජ සංවිධාන හා වෙනත් පාර්ශ්වකරුවන්ගේ වඩාත් පුළුල් ජාලයක් සමග සහයෝගී වෙමින්, කාන්තාව, සාමය හා ආරක්ෂාව පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම වසර 3ක් ක්‍රියාත්මක කිරීමෙන් පසුව මධ්‍යකාලීන සමාලෝචන සඳහා මුල පිරීම හා කළමනාකරණය කිරීම සහ කාන්තාව, සාමය හා ආරක්ෂාව පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ කාල පරිච්ඡේදය සම්පූර්ණයෙන් අවසන් වීමෙන් පසුව අවසන් ඇගයීම් සිදු කිරීම;

(ii) කාන්තාව, සාමය හා ආරක්ෂාව පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම යොදා ගන්නා කාල සීමාව අවසානයේ සවිස්තරාත්මක ඇගයීම් වාර්තාවක් සම්පාදනය කිරීමට පියවර ගැනීම - අදාළ කමිටු විසින් සම්පාදනය කෙරෙන සවිස්තරාත්මක, ප්‍රබල දත්ත හා සාක්ෂිවලින් මෙම වාර්තාව සමන්විත විය යුතු ය;

(iii) මධ්‍ය කාලීන හා අවසන් ඇගයීම් වාර්තාවල දී ඉස්මතු කර දක්වන ලද ප්‍රධාන ක්ෂේත්‍ර ඇතුළත් උගත් පාඩම් වාර්තාවක් සම්පාදනය කිරීම සහ කාන්තාව, සාමය හා ආරක්ෂාව පිළිබඳ ඊළඟ වැඩසටහනේ දී මේවා කෙරෙහි අවධානය යොමු කෙරෙන බව සහතික කිරීම සඳහා මිනුම් දඬු හා නිර්දේශ නියම කිරීම.

නිරීක්ෂණ හා ඇගයීම් යාන්ත්‍රණ ඵලදායක ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ ආයතනවලට හැකියාව සම්බන්ධයෙන් පවත්නා අඩුපාඩුකම් මග හැරවීම සම්බන්ධයෙන් සහ තිරසර සංවර්ධන අරමුණු වාර්තා කිරීමේ ක්‍රමවේදයට අනුකූල බව සහතික කිරීම සම්බන්ධයෙන් සහ එක් එක් කැපවීම යටතේ වෙන් කරන ලද දත්ත රැස් කිරීම මගින් නිරීක්ෂණ හා ඇගයීම් පරිශ්‍රමවලදී ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදීතාව හා සියල්ලන් ඇතුළත් කර ගැනීම වඩාත් කාර්යක්ෂම කිරීම සඳහා ක්‍රමෝපායයන් හඳුනා ගැනීම හා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් මෙම කමිටු ඒකාබද්ධව වගකීම දැරිය යුතු ය.

## ප්‍රධාන නියමු කමිටුව

එක් එක් සම්බන්ධීකරණ හා තක්සේරු කමිටුවේ සාමාජිකයන්ගෙන් නිර්මාණය වන ප්‍රධාන නියමු කමිටුවේ කාර්යය වන්නේ සියලු නිරීක්ෂණ හා ඇගයීම් පරිශ්‍රමයන් ඒකාබද්ධ කිරීම හා සම්බන්ධීකරණය කිරීම සහ එවැනි පරිශ්‍රමයන්ගේ ගුණාත්මකත්වය හා වග වීම සහතික කිරීම යි. ප්‍රධාන නියමු කමිටුවේ සාමාජිකත්වය පහත දැක්වෙන පරිදි වේ:

(i) කාන්තා හා ළමා කටයුතු හා සමාජ ආරක්ෂණ අමාත්‍යාංශයේ ලේකම්වරයා; ප්‍රධාන නියමු කමිටුවේ මුලසුන්ධාරියා ලෙස කටයුතු කිරීමට නියමිතය
(ii) අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ලේකම්වරයා
(iii) මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා
(iv) විදේශ සම්බන්ධතා අමාත්‍යාංශයේ ලේකම්වරයා
(v) ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා
(vi) කාන්තාවන් පිළිබඳ ජාතික කමිටුවේ සභාපතිවරයා
(vii) ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශයේ අධ්‍යක්ෂවරයා
(viii) ළමා ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂවරයා
(ix) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා
(x) පොලිස් ළමා හා කාන්තා කාර්යාංශයේ නියෝජිතයා
(xi) කාන්තා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රවීණයන් පස් දෙනෙක්
(xii) සිවිල් සමාජ සංවිධාන අතරින් තෝරා ගත් නියෝජිතයන් හත් දෙනෙක්

ප්‍රධාන නියමු කමිටුවේ සමස්ත සාමාජික සංඛ්‍යාව විස්සක් (20) විය යුතු යැයි අපේක්ෂා කෙරේ. කමිටුව සෑම මාස හතරකට ම වරක් ම රැස් වන අතර ත්‍රෛවාර්ෂික රැස්වීම්වල ප්‍රතිඵල වශයෙන් ඉදිරිපත් කෙරෙන සවිස්තරාත්මක රැස්වීම් වාර්තා / වාර්තා / යෝජනා සහ/හෝ එවැනි ලියකියවිලි කාන්තා

හා ළමා කටයුතු හා සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය විසින් නඩත්තු කළ යුතු අතර, එම තීරණ අනුව ක්‍රියා කළ යුතු යැයි අපේක්ෂා කෙරෙන වෙනත් ආයතන වෙත ඉදිරිපත් කළ යුතු ය. වලංගු යැයි සැලකෙන ලැයිස්තුගත අමාත්‍යාංශවල ලේකම්වරුන් හතර දෙනා ද ඇතුළුව යටත් පිරිසෙයින් කමිටුවේ සාමාජිකයන් 12 දෙනෙකුවත් ත්‍රෛවාර්ෂික රැස්වීම්වලට සහභාගි විය යුතු ය. කමිටුව සම්බන්ධීකරණ හා තක්සේරු කමිටු විසින් ඉදිරිපත් කෙරෙන සියලුම වාර්තා / ලියකියවිලි නිරීක්ෂණයට බඳුන් කළ යුතු යැයි ද ඒවා සැලකිල්ලට ගෙන අවශ්‍ය තීරණ ගත යුතු යැයි ද අපේක්ෂා කෙරේ. කමිටුවේ අවධාන කේන්ද්‍රය වන කාන්තා හා ළමා කටයුතු හා සමාජ ආරක්ෂණ අමාත්‍යාංශයේ ලේකම්වරයා අවශ්‍ය පියවර ගැනීම සඳහා නියමු කමිටුවේ තීරණ සම්බන්ධීකරණ හා තක්සේරු කමිටු වෙත සන්නිවේදනය කිරීම සම්බන්ධයෙන් වගකීම දරනු ඇත. නියමු කමිටුව, කැබිනට් අමාත්‍යවරුන් වෙත පමණක් සීමා නොවී, රජයේ ඉහළ මට්ටමේ තීරණ ගන්නන් සමග සහයෝගයෙන් කටයුතු කිරීම සහ කාන්තාව, සාමය හා ආරක්ෂාව සම්බන්ධ කාරණා පිළිබඳව අදාළ බලධාරීන් වෙත ප්‍රතිපත්ති නිර්දේශ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් වගකීම් දැරිය යුතු ය.

# කාන්තාව, සාමය හා ආරක්ෂාව පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම ආශ්‍රිත අභියෝග

කාන්තාව, සාමය ආරක්ෂාව පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම සම්පූර්ණ කිරීමේ අදියරේ දී - ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමට ප්‍රධාන අභියෝග හතකින් තර්ජන එල්ල විය හැකි යැයි පුරෝකථනය කර ඇත. ඒවා මෙසේ ය

1. අරමුදල් හා සම්පත් ලබා ගැනීමේ හැකියාව - ප්‍රකාශිත කැපවීම් සතුටුදායක ලෙස ක්‍රියාත්මක කෙරෙන බව සහතික කිරීමේ වගකීම සිය වර්තමාන රැකියා විස්තර යටතේ මේ වන විටත් මීට සමාන කර්තව්‍යයන්ට උර දී ඇති ආයතන විසින් භාර ගැනෙන බව සහතික කිරීම සඳහා හැකි සෑම ප්‍රයත්නයක් ම දරා ඇති නමුත් බොහෝ කැපවීම්වලට සැලකිය යුතු රාජ්‍ය අරමුදල් ප්‍රමාණයක් අවශ්‍ය වේ. ප්‍රමාණවත් අරමුදල් අත් කර ගැනීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජය මුහුණ දෙන දුෂ්කරතා නිසා කාන්තාව, සාමය ආරක්ෂාව පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්මක් ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකාව දරන මෙම ප්‍රථම ප්‍රයත්නයට ජාත්‍යන්තර ප්‍රජාව ආධාර කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

2. අදාළ පාර්ශ්වකරුවන්ගේ කැප වීම - මෙම ජාතික ක්‍රියාකාරී සැලැස්ම තුළ දී වගකිව යුතු ආයතන හඳුනා ගෙන ඇත්තේ, ප්‍රකාශිත පුද්ගලයන් වර්තමානයේ දී අදාළ කැප වීම් ක්‍රියාත්මක කෙරෙන බව සහතික කිරීම සම්බන්ධයෙන් වගවීම සඳහා ජාතික ක්‍රියාකාරී සැලැස්ම යටතේ අවශ්‍ය යම් තනතුරක් දරමින් සිටින බව සහතික කිරීමේ ක්‍රමයක් ලෙස ය. කෙසේ වුව ද මෙහි සාර්ථකත්වය වගකිව යුතු ආයතනය / ආයතන සහ වෙනත් රාජ්‍ය රාජ්‍ය නොවන ක්‍රියාකාරීන් අතර සම්බන්ධීකරණය හා සහයෝගිතාව මත රඳා පවතී.

3. පාර්ශ්වකරුවන් ගණනාවක් සමග සම්බන්ධීකරණය කිරීමේ දුෂ්කරතාව - විවිධ කැපවීම් ක්‍රියාත්මක කිරීම සඳහා පාර්ශ්වකරුවන් ගණනාවක් සමග සම්බන්ධීකරණය කරන විට සමහර අභියෝග හා දුෂ්කරතාවලට මුහුණ දීමට සිදු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. එපමණක් නොව, වගකිව යුතු ආයතන ලෙස සඳහන් කරන ලද සමහර නිලධාරීන්, වෙනත් රාජ්‍ය ක්‍රියාකාරීකයන් සහ කර්තව්‍යයන් ගණනාවක් භාර දී තිබෙන සමහර රාජ්‍ය නොවන ක්‍රියාකාරීකයන් ඇතුළු සමහර පාර්ශ්වකරුවන් එකිනෙකාට සමාන්තරව කටයුතු කරමින් එක ම කාර්යයන්හි නිරත වීමට ද ඉඩ ඇත. මෙය කාලය කැප කිරීම සම්බන්ධ සමහර අභියෝගවලට තුඩු දිය හැකි ය.

4. මානව සම්පත් සංවර්ධනය - සමහර කැප වීම් සාර්ථක ලෙස ක්‍රියාත්මක කළ හැකි වන්නේ විවධ වර්ගයේ පුහුණු / සම්මන්ත්‍රණ යනාදිය හරහා මානව සම්පත් සංවර්ධනය සිදු වන්නේ නම් පමණකි. එවැනි කැප වීම් සපුරාලීම සඳහා ශ්‍රී ලංකා රජයට විවිධ ක්ෂේත්‍රවල ප්‍රවීණයන්ගේ සහාය හා කැප වීම අවශ්‍ය වනු ඇත.

5. මානව සම්පත් ප්‍රමාණවත් නොවීම - ප්‍රකාශිත සමහර කැපවීම් සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම නව නිලධාරීන් බඳවා ගැනීම හෝ දැනට සිටින නිලධාරීන් පුහුණු කිරීම මත රඳා පවතී. මෙම ක්‍රියාකාරකම් මානව සම්පත් ලබා ගැනීමේ හැකියාව මත බෙහෙවින් රඳා පවතී. මානව සම්පත් ලබා ගැනීමේ හැකියාව සම්බන්ධයෙන් සමහර අභියෝග පුරෝකථනය කළ යුතු ය.

6. ඇතැම් ප්‍රජාවන් අකැමති වීම සහ පසුබෑම - විශේෂයෙන් ම ශ්‍රී ලංකා රජය කාන්තාව, සාමය හා ආරක්ෂාවට තර්ජනයක් වන, වෙනස් කොට සලකන යම් නීති හෝ ආකාරගත ස්ත්‍රී පුරුෂ සමාජභාවීය භාවිත වෙනස් කිරීම සඳහා ප්‍රයත්න දරන විට ඇතැම් ප්‍රජාවන් දිගින් දිගට ම ඊට බාධා කර ඇත. මෙම අභියෝග පුරෝකථනය කළ යුතු ය. කෙසේ වුව ද, ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සහ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය, ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය සහ කාන්තාවන්ට එරෙහි සියලුම ආකාරයේ වෙනස්කම් කිරීම් තුරන්

කිරීමේ සම්මුතිය යටතේ උර දෙන ජාත්‍යන්තර බැඳීම්වලට අනුකූලව කාන්තාවන් උදෙසා සමානාත්මතාව සම්පාදනය කෙරෙන බව සහතික කිරීමට ශ්‍රී ලංකා රජය උත්සාහ දරයි.

7. ගෝලීය වසංගතයේ අඛණ්ඩ බලපෑම (Sars-Cov2 හෝ COVID-19) ගෝලීය වසංගතය අඛණ්ඩව පැවතීම ජාතික ක්‍රියාකාරී සැලැස්ම යටතේ ලැයිස්තුගත කර ඇති ක්‍රියාකාරකම් නියමිත වේලාවට ක්‍රියාත්මක කිරීමට බාධාවක් විය හැකිය. එවැනි සන්දර්භයක, 'නව සාමාන්‍ය' තත්ත්වය තුළ තුළ ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා ක්‍රියාත්මක කිරීමේ ප්‍රමුඛ නියෝජිතායතන සාධාරණ අභිමතය පරිදි කාල රාමු සකස් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

8. නියමිත කාලය තුළ ක්‍රියාත්මක කිරීම - කාන්තාව, සාමය හා ආරක්ෂාව පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම තුළ කාල රේඛාව දක්වා ඇත්තේ 2021-2025 දක්වා වන පස් වසරක කාල රාමුව තුළ යැයි සලකනු ලැබේ. සමහර කැප වීම් කෙටි කාලීන කැප වීම් වන අතර, අනෙකුත් කැප වීම් සඳහා වඩාත් දීර්ඝ කාල සීමාවක් නියම කරනු ලැබ ඇත. කාන්තාව, සාමය හා ආරක්ෂාව පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්මේ පස් වසර ඉකුත් වීමෙන් පසුවත් රාජ්‍යයන් විසින් කැපවීම් ලෙස තවත් කැපවීම් කට්ටලයකට උර දිය යුතු යැයි කල්පනා කරනු ලැබේ.

අභියෝග පුරෝකථනය කර ඇති නමුත්, ශ්‍රී ලංකාවේ කාන්තාවන් සමාජයේ සියලුම මට්ටට්වල දී ගැටුම් වැළැක්වීම, ගැටුම් නිරාකරණය, සාමය ගොඩනැගීම, තීරණ ගැනීම හා දේශපාලනය සඳහා සම්බන්ධ වන බව සහතික කිරීම සඳහා කාන්තාව, සාමය හා ආරක්ෂාව පිළිබඳ මෙම ජාතික ක්‍රියාකාරී සැලැස්ම තුළ ප්‍රකාශිත කැපවීම් හැකි උපරිම ආකාරයෙන් ක්‍රියාත්මක කෙරෙන බව සහතික කිරීමට ශ්‍රී ලංකා රජය උත්සාහ දරයි. ජාතික ක්‍රියාකාරී සැලැස්මට පදනම් වන්නේ ශ්‍රී ලංකාවේ කාන්තාවන් උදෙසා සාධාරණ, නිදහස්, සමාන හා අපක්ෂපාතී සමාජයක් ගොඩ නැගිය යුතුය යන මූලධර්මය මත ය.

# ඇමුණුම 1:
# පළාත් උපදේශන පෙළ ගැස්ම

| දිනය | පළාත | නියෝජනය වන දිස්ත්‍රික්ක | සහභාගිකයන් |
|---|---|---|---|
| 2019 සැප් 24 | මධ්‍යම පළාත | මහනුවර, මාතලේ හා නුවරඑළිය | රාජ්‍ය නිලධාරීන් |
| 2019 සැප් 25 | | | සිවිල් සමාජ සංවිධාන සාමාජිකයන් / රාජ්‍ය නොවන සංවිධාන / හමුදා වැන්දඹුවන් / වතු අංශය තුළ සේවය කරන කාන්තාවන් / කාන්තා ගෘහමූලික කුටුම්බ / ආබාධිත පවුල් සාමාජිකයන් රැක බලා ගන්නා කාන්තාවන් |
| 2019 සැප් 27 | බස්නාහිර පළාත | කොළඹ හා ගම්පහ | රාජ්‍ය නිලධාරීන් |
| 2019 සැප් 28 | | | සිවිල් සමාජ සංවිධාන නියෝජිතයන් / රාජ්‍ය නොවන සංවිධාන / ප්‍රජා පාදක සංවිධාන නියෝජිතයන් / ස්වාධීන උපදේශකවරුන් / මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම සඳහා කටයුතු කරන අධ්‍යාපනික ආයතනවල නියෝජිතයන් |
| 2019 සැප් 30 | නැගෙනහිර පළාත | අම්පාර හා මඩකලපුව | සිවිල් සමාජ සංවිධාන සාමාජිකයන් / රාජ්‍ය නොවන සංවිධාන / කාන්තා ගෘහමූලික කුටුම්බ / හිටපු එල්ටීටීඊ සටන්කරුවන්ගේ පවුල් සාමාජිකයන් / ආබාධිත තත්ත්ව සහිත කාන්තාවන් |
| 2019 ඔක් 01 | | | නිලධාරීන් |
| 2019 ඔක් 02 | නැගෙනහිර පළාත | ත්‍රිකුණාමලය | සිවිල් සමාජ සංවිධාන නියෝජිතයන් / රාජ්‍ය නොවන සංවිධාන / ප්‍රජා පාදක සංවිධාන නියෝජිතයන් / කාන්තාවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් කටයුතු කරන සංවිධාන / ආපසු පැමිණි සරණාගතයන්ගේ අධ්‍යාපනය උදෙසා කටයුතු කරන සංවිධාන |
| 2019 ඔක් 03 | | | රාජ්‍ය නිලධාරීන් |
| 2019 ඔක් 04 | ඌව පළාත | මොණරාගල හා බදුල්ල | රාජ්‍ය නිලධාරීන් |
| 2019 ඔක් 05 | | | සිවිල් සමාජ සංවිධාන / රාජ්‍ය නොවන සංවිධාන / ප්‍රජා පාදක සංවිධාන නියෝජිතයන් |

| දිනය | පළාත | නියෝජනය වන දිස්ත්‍රික්ක | සහභාගිකයන් |
|---|---|---|---|
| 2019 ඔක් 08 | උතුරු පළාත | යාපනය, කිලිනොච්චිය හා මුලතිවු | රාජ්‍ය නිලධාරීන් |
| 2019 ඔක් 09 | | | සිවිල් සමාජ සංවිධාන / රාජ්‍ය නොවන සංවිධාන / ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන නියෝජිතයන් / කාන්තා ගෘහමූලික කුටුම්බ / ආබාධිත තත්ත්ව සහිත කාන්තාවන් / හිටපු සටන්කරුවන් / ගැටුම ආශ්‍රිත ලිංගික හිංසනයේ (CRSV) වින්දිතයන් / අතුරුදහන් වීම්වල වින්දිතයන්ගේ භාර්යාවන් හා මවුවරුන් |
| 2019 ඔක් 08 | දකුණු පළාත | මාතර හා හම්බන්තොට | රාජ්‍ය නිලධාරීන් |
| 2019 ඔක් 09 | | | සිවිල් සමාජ සංවිධාන / රාජ්‍ය නොවන සංවිධාන / ප්‍රජා පාදක සංවිධාන නියෝජිතයන් / හමුදා වැන්දඹුවන් / කාන්තා ගෘහමූලික කුටුම්බ / අතුරුදහන් වූවන්ගේ භාර්යාවන් |
| 2019 ඔක් 10 | උතුරු පළාත | මන්නාරම හා වවුනියාව | සිවිල් සමාජ සංවිධාන / රාජ්‍ය නොවන සංවිධාන / ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන නියෝජිතයන් / කාන්තා ගෘහමූලික කුටුම්බ / ආබාධිත තත්ත්ව සහිත කාන්තාවන / හිටපු සටන්කරුවන් / මරණයට පත් වීම හෝ අතුරුදහන් වීම නිසා සිය ආදරණීයයන් අහිමි වී ඇති වැඩිහිටි කාන්තාවන් |
| 2019 ඔක් 11 | | | රාජ්‍ය නිලධාරීන් |
| 2019 ඔක් 11 | බස්නාහිර පළාත | කළුතර | රාජ්‍ය නිලධාරීන් |
| 2019 ඔක් 12 | | | සිවිල් සමාජ සංවිධාන / රාජ්‍ය නොවන සංවිධාන / ප්‍රජා පාදක සංවිධාන නියෝජිතයන් |
| 2019 ඔක් 15 | උතුරුමැද පළාත | අනුරාධපුරය හා පොළොන්නරුව | රාජ්‍ය නිලධාරීන් |
| 2019 ඔක් 16 | | | සිවිල් සමාජ සංවිධාන / රාජ්‍ය නොවන සංවිධාන / ප්‍රජා පාදක සංවිධාන නියෝජිතයන් / හමුදා වැන්දඹුවන් /කාන්තා ගෘහමූලික කුටුම්බ / ආබාධිත තත්ත්ව සහිත කාන්තාවන |
| 2019 ඔක් 15 | දකුණු පළාත | ගාල්ල | රාජ්‍ය නිලධාරීන් |
| 2019 ඔක් 16 | | | සිවිල් සමාජ සංවිධාන / රාජ්‍ය නොවන සංවිධාන / ප්‍රජා පාදක සංවිධාන නියෝජිතයන් / හමුදා වැන්දඹුවන් /කාන්තා ගෘහමූලික කුටුම්බ / අතුරුදහන් වීම්වල වින්දිතයන්ගේ මවුවරුන් හා සොහොයුරියන් |
| 2019 ඔක් 18 | වයඹ පළාත | කුරුණෑගල හා පුත්තලම | රාජ්‍ය නිලධාරීන් |
| 2019 ඔක් 19 | | | සිවිල් සමාජ සංවිධාන නියෝජිතයන් |
| 2019 ඔක් 22 | සබරගමුව පළාත | රත්නපුරය හා කෑගල්ල | රාජ්‍ය නිලධාරීන් |
| | | | යුධ වැන්දඹුවන් / සිවිල් සමාජ සංවිධාන නියෝජිතයන් |

